**වසර 2500 පසු**
**මේ ගෞතම බුද්ධ ශාසනයේ නැවත පිබිදීමයි.**

# සත්‍ය ධර්මය ඇවදි විය

(දහවන වෙළුම)

# මේ ගෞතම බුද්ධ ශාසනයේ නැවත පිබිදීමයි

බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ සංසදයේ ප්‍රකාශනයකි.

## සියලුම හිමිකම් ඇවිරිණි

මුදලට විකිණීම සඳහා හෝ ලාභ ලැබීම පිණිස වන සියලුම ආකාරයේ උපුටා ගැනීම්, නැවත පළකිරීම් සපුරා තහනම් ය. මෙම දහම් පොත ධර්ම දානයක් ලෙස බෙදා හැරේ.

**මේ ගෞතම බුද්ධ ශාසනයේ නැවත පිබිදීමයි**

අන්තර්ජාලයේ ධර්ම දේශනා ශ්‍රවණය කිරීමට
www.buddothpa.com

zoom දේශනාව youtube ශ්‍රවණය කිරීමට
https://youtube.com/@Zoom-up2ik

facebook හරහා ශ්‍රවණය කිරීමට
https://www.facebook.com/Buddothpado

රාත්‍රී සාකච්ඡා zoom ශ්‍රවණය කිරීමට
https://us06web.zoom.us/j/87341245000?pwd=dFFrSSt4SVBQWFpzeXppUy-tIZFZWUT09

youtube ශ්‍රවණය කිරීමට
https://youtube.com/@buddothpado

facebook හරහා ශ්‍රවණය කිරීමට
https://www.facebook.com/Buddothp?mibextid=ZbWKwL

බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය - 2022 දෙසැම්බර්

ධර්ම ග්‍රන්ථය පිළිබඳ විමසීම් Email: thanujafernando1975@gmail.com
Tel 070 351 8747 - බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ

පරිගණක මුද්‍රණ සැකසුම **වාක්‍යා රූ**
අංක 42/8, මකුළුදූව, පිළියන්දල.
දුරකථනය 011 2 708377

මුද්‍රණය **K.S.U. ග්‍රැෆික් (පුද්) සමාගම**
අංක 510, රාජගිරිය පාර, රාජගිරිය
දුරකථන 011 2884701

# නිවන් මඟ යායුතු අනුපිළිවෙල

(සත්‍ය කෘත්‍ය කෘතක් ද්විදසාකාරක තිපරිවට්ටම්)

**බුදුන් වහන්සේ දම්සක් පැවතුම් සූත්‍රය තුලින් ප්‍රථම වතාවට නිවන් මඟ යා යුතු ආකාරය අනුපිලිවෙලින් මෙසේ වදාළ සේක.**

1. **පූර්ව භාග ප්‍රතිපදාව** (පළමුව කලයුතු දේ) සත්‍යඤාණ අවබෝධය
2. **අපරභාග ප්‍රතිපදාව** (දෙවනුව කලයුතු දේ - ප්‍රායෝගිකවන ආකාරය)

    2.1 කෘත්‍යඤාණය - ධර්මය ප්‍රායෝගිකව අත්දැකීම

    2.2 කෘතක්ඤාණය - ආත්මීය භාවයෙන් මිදීමේ අත්දැකීම

1. **පූර්ව භාග ප්‍රතිපදාව (සත්‍යඤාණ අවබෝධය) ශ්‍රාවකයාගේ උත්සාහය මත සහ කල්‍යාන මිත්‍රයාගේ පණිවිඩය මත පවතී**

    බුද්ධදර්ශනය අවබෝධකරගැනීම (දර්ශන ඤාණය = සත්‍යඤ්ඤාණය)

    - සිත හැදෙන හැටි අවබෝධකරගැනීම
    - සිත මායාවක් බව අවබෝධකරගැනීම සිත යනු අරමුණම බව දැනගැනීම
    - අරමුණෙහි සත්‍ය දැකීම, අරමුණට නොරැවටීම
    - ආත්මීය භාවය හැදෙන ආකාරය අවබෝධකර ගැනීම අරමුණම ආත්මය බව දැකීම
    - ශූන්‍යතා අවබෝධය
    - ත්‍රිවිද්‍යා දැනගැනීම (පුබ්බේනිවාසානුස්සති ඤාණය, චුතූපපාත ඤාණය, ආසවක්‍ෂයඤාණය)
      (සිත = අරමුණ = ආත්මය)

    1.1 කල්‍යාණ මිත්‍රයාගෙන් පණිවිඩය අසාදැන ගැනීම

    1.2 නැවත නැවත සද්ධර්මශ්‍රවනය

    1.3 යෝනිසෝමනසිකාරය

    1.4 ධම්මානුධම්ම ප්‍රතිපදාව

    **ශ්‍රාවකයා උට්ඨාන වීර්යෙන් කලයුතු දෙයින් වැඩි ප්‍ර තිශතයක් ඇත්තේ පූර්ව භාග ප්‍රතිපදාව තුලයි.**

**බුදුන් වහන්සේ කී පරිදි, නිවන් මඟයන ශ්‍රාවකයා කලයුතු සියල්ල හිමාලය පර්වතය නම්, පූර්ව භාග ප්‍රතිපදාවෙන් පසු තව කලයුතු වන්නේ අත ඇති ගල් කැටයක පමණ දෙයකි.**

- සක්කාය දිට්ඨි ප්‍රහානය මෙතැනදී සිදුවේ.
- ශ්‍රාවකයා ආර්‍ය භූමියට පිවිසේ.

## 2. අපරභාග ප්‍රතිපදාව

2.1. **කෘත්‍යඥාණය** - අසාදැනගත් ධර්මය ප්‍රායෝගිකව අත්දැකීම - (ධර්මය තමාතුලින් දැකීම = සතර සතිපට්ඨානය වැඩීම).

2.1.1. **අරමුණෙහි සත්‍ය දැකීම**; --දර්ශනය තුල සිත හැදෙන හැටි දකින ආකාරය ප්‍රායෝගිකව අත්දැකීම(යථාභූත ඥාණය = යෝනිසෝ මනසිකාරය)

2.1.2. **අරමුණෙහි සත්‍ය දැක මිදීම**

අරමුණ සත්‍යක් නොවන බව ප්‍රායෝගිකව අත්දැකීම
ඒ අනුව ආත්මයක් නැතිබව ප්‍රායෝගිකව අත්දැකීම
සවිතක්ක සවිචාර සමාධිය අත්දැකීම (විදර්ශනා සමාධි.)

2.1.3. **ත්‍රි විද්‍ය ප්‍රායෝගිකව අත්දැකීම** (පුබ්බේනිවාසානුස්සති ඥාණය, චුතුපපාත ඥාණය, ආසවක්‍යා ඥ්ඥාණය)

2.2. **කෘතක්ඥාණය (ශ්‍රාවකයාට කලහැකි කිසිවක් නැත. සොභාදහමේ අනාවරනයක් පමනි. ඥාණයට හසුවේ. බුද්ධ වචනයට අනුව මෙහිදී දැඟලුවහොත් පාරුව ගිලේ.) - සම්මා සමාධි, සම්මා විමුක්ති**

ආත්මයක් නැතිබව ප්‍රායෝගික අත්දැකීමෙන්, මිදීම අත්දැකීම (ආත්මීය භාවයෙන් මිදීම නිසා ඇතිවන සමාධිමත් ස්වභාවය)

අවිතක්ක අවිචාර සමාධිය - අනිමිත්ත ශුන්‍යත අප්‍රනීත චේතෝ විමුක්තිය - අරහත්ත සමාධිය - නිස්සත්තෝ නිර්ජීවෝ ශුන්‍යෝ

ශාන්ත ප්‍රනීත නිර්වාන සම්පත්තිය

# පෙරවදන

මෙය ඇසෙන ඔබ මහා භාග්‍යවන්තයි. ඔබ කොහේද යන්නේ, මුලාව රැවටීම හරි භයානකයි. සත්‍ය කුමක්ද? ඔබ සංසාර චක්‍රයක අතරමං වෙලා. විටෙක ඔබ සතුටින්, විටෙක ඔබ දුකෙන්, සැපේ දුකේ දෝලනය වන මේ ජීවිතය හරි භයානකයි. ඔබ සත්‍ය දන්නේ නෑ. ඒ සත්‍ය ඔබ අවබෝධ කළ යුතුයි. ඔබ සංසාර දුකින් මිදෙන කතාවයි මේ.

මෙම දේශන මාලාව මඟින් ඔබට සත්‍ය ධර්මය අවබෝධය සඳහා යම්කිසි උපකාරයක් ලැබෙනවා. සියලු දුකින් මිදෙන තැන හමුවන ඒ 'සදාතනික සුවය' මෙම දේශන මාලාව මගින් අත්දකින්නට ඔබට ද හැකියාව ලැබේ. බාහිර ඇත්ත කරගෙන සිටින තාක් ඔබ ඉන්නේ මිත්‍යාදෘෂ්ටියේමයි. ඒතාක් ඔබට දුක උරුමයි. සිතද මායාවක් වන තැන

සිතේ මායාවෙන් මිදුනු තැන,
බාහිර ඇත්තක් නොවන තැන
සිතද සත්‍යයක් නොවන තැන
ඒ සිතෙන් මිදෙන තැන
ඒ බාහිර ඇත්තක් නොවන තැන
'අජ්ජත්ත බහිද්ධා' කියන තැන
අන්ත දෙකම මිදුන තැන, එනම්,

ධර්මය තුළ සඳහන් වන නාම, රූප අන්ත 2න් මිදීමයි නිවන් මග වන්නේ. මෙලොව උපදින සියලු සත්ත්වයෝ නිවනින්මයි සැනසීම ලබන්නේ. ධර්මය නම් ධර්මතාවයයි. ඒ පටිච්චසමුප්පාද ධර්මයයි. එනම් ඉදප්පච්චතාවයයි. එනම් දෙයක් නැති බවයි. දෙයක් නැති බව බුද්ධ ස්භාවයයි. දෙයක්

නැති තැන චෙතෝවිමුක්තියයි. එනම් අනිමිත්ත, ශූන්‍යත, අප්ප්‍රනිත චේතොවිමුක්තියයි. ඒ බුද්ධ ස්වභාවයයි. මේ දහම අවබෝධ වේ නම් ඔබ අප සියලු දෙනාම ඒ බුද්ධ ස්වභාවටයි අවදි වෙන්නේ. ඒ බුද්ධ යනු ශූන්‍යතාවයි.

"නිස්සත්වෝ නිජ්ජීවෝ ශූන්‍යයෝ"

පහන නිවීගිය පසු ගිය තැනක් කොහින්ද? ඒ නිවීමමයි නිවන. ඒ කෙලෙස් ගින්නේ නිවීයාමයි. ඒ සසර ඕඝයේ නිමාවයි. ඒ විඤ්ඤාන නිරෝධයට ගිය තැන සියලු දුකෙන් මිදීමයි.

විඤ්ඤාණං අනිදස්සනං - අනන්තං සබ්බතෝ පහං
එත්ථ ආපෝච පඨවි ච - තේජෝ වායෝ න ගාධති
එත්ථ දීඝඤ්ච රස්සඤ්ච - අණුං ථූලං සුභාසුභං
එත්ථ නාමඤ්ච රූපංච - අසේසං උපරුජ්ජති
විඤ්ඤානස්ස නිරෝධෙන - එත්තෙ තං උපරුජ්ජති

සිතෙන් මිදෙන මඟ
නිවන් දකින මඟ
දුකින් මිදෙන මඟ
එයයි නිස්සරණ මඟ

නිවැරදි නිවන් මඟ ඔබටත් හමුවේවි. ධර්මය සොයන්නාට බුදුන් හමු වේ. බුද්ධ යනු සොබාදහමයි. ප්‍රායෝගික පුහුණු විය යුතු ආකාරය හඳුනාගෙන අවබෝධ කළ යුතු ධර්මයකි.

**බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ**

# හැඳින්වීම

මේ ගෞතම බුද්ධ ශාසනය තුළ අපි හැමදෙනාටම අවශ්‍ය වන්නේ නිවීමක්, සැනසීමක්, දුකින් මිදීමක්. නිරන්තර පවත්නා රාග, ද්වේශ, මෝහ. නිවා ගැනීමයි නිවන කියන්නේ. කිසාගෝතමී, පටාචාරා, අම්බපාලි වැනි බොහෝ පිරිස් බුදුරජාණන් වහන්සේ අභියස ඒ ගිනි නිවා සදාකාලික සැනසීම ලැබුවා.

අද බෞද්ධ සමාජයට මේ නිවීම සැනසීම අහිමි වෙලා බොහෝ පිරිස් නොයෙකුත් රාමුවලට සිරවී, ග්‍රන්ථ ධූරයට පමණක් සීමාවෙලා සිටින්නෙ. ඒ තුළින් සත්‍ය දැකීම අපහසුයි. විදර්ශනා ධූරය සමාජයෙන් ඈත් වී ඇති මෙවන් යුගයක නැවතත් ඒ ගිලිහී ගිය බුද්ධ දර්ශනය, විදර්ශනා ධූරය තුළින් ම ඉස්මතු වෙනව. ඒ අති ගම්භීර, නිර්මල, පරම සත්‍යය අපට අහන්න ලැබෙනවා. මේ නිවැරදි බුද්ධ දර්ශනය පෙර නොඇසූ විරූ දහම, ධම්ම චක්ඛුෂය අපි අවබෝධ කරගත යුතු වෙනව. මේ සත්‍ය දර්ශනය බාහිරින් හමුවන දෙයක් නොවේ. බාහිර ඇත්ත වූ තැන පවතින්නෙ ආත්මීය ස්වභාවයක්.

මේ අනාත්ම ධර්මය උතුම් බුද්ධ දර්ශනය 'බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ මාලාව' තුළින් ඔබට කියවන්න ලැබෙනව. එය හොඳින් කියවන්න. ධාරණය කරගන්න. ඔබට සත්‍ය අවබෝධයට මෙය උපකාරී වේවි. මේ අප ගන්නා උත්සාහයේ එක් අවස්ථාවක් පමණි.

**අප කල්‍යාණ මිත්‍ර මෙහෙණින් වහන්සේ**

**"සබ්බදානං ධම්මදානං ජිනාති"**

මේ උතුම් සත්කාරය සඳහා අර්ථයෙන්, ධර්මයෙන්
සියළුම ආකාරයෙන් උදව් උපකාර කළා වූ
සියළුම දනන් හට, මෙම ධර්ම දානය තුළින්
ජනිත වන්නා වූ පුණ්‍ය ශක්තිය
මේ ගෞතම බුද්ධ ශාසනයේ දී ම
ඒ උතුම් චතුරාර්ය සත්‍ය ධර්මය
අවබෝධ කරගෙන සංසාර දුකින් මිදී
නිවනින් ම සැනසීම ලබන්නට
හේතු වේවා !

# පිදුම



නිදි වරන්නාට රැය දිගුය,
ගත වෙහෙසවූවන්ට යොදුන
දිගය. සද්ධර්මය නොදන්නාවූ
අසෘවත් පෘථග්ජනයාට
සසර දිගය. යම් කෙනෙක්
බුදුන් වහන්සේ විසින්
මනාකොට දෙසන ලද
සද්ධර්මය දැන ඒ අනුව
පවතීද, ඔවුහු සංසාර
සාගරය තරණය කොට
නිවනට පැමිණෝ. සියලු
ලෝසතහට, කෙලෙස් යුද්ධය
ජයගෙන සෘතවත් ආර්යය
ශ්‍රාවකයකු වී සසරින්
නික්මෙන්න, 'බුද්ධෝත්පාදෝ'
සදහම් අමාවැස්ස හේතුවේවා!!!

# පටුන


පිටු අංකය

01 සත්‍ය ධර්මය අවදි විය,
නැවතත් මගඵලලාභීන් බිහිවන යුගයක ඇරඹුමයි. 11

02 නුවණැත්තෙක් වී සිතුවිලි මායාවෙන් මිදී
මොහොතට අවදි වන්න 30

03 සසර වඩන්නකු නොව, ආර්යය භූමිය ස්පර්ශ කර
සසර මිදෙන්නකු වන්න 50

04 ඔබ තුළ සිටින මාරයා ඔබේම සිතුවිලියි
මේ සත්‍ය නොදන්නා තාක් ඔබ සසරේ 64

05 ඔබ දන්නෑ ඔබ නිවන් දැකපු බව,
සිතුවිලි වලින් මිදුණු තැනයි නිවන 73

# 01

# සත්‍ය ධර්මය අවදි විය, නැවතත් මගඵලලාභීන් බිහිවන යුගයක ඇරඹුමයි.

**මෙහෙණින් වහන්සः** තෙරුවන් සරණයි! ආර්යයන් වහන්ස. එදාට වඩා අද ලොකු වෙනසක් දැනෙනවා. ඔබ වහන්සේ කියනව වගේ ආස්‍රව ක්ෂය වෙන එක මට හොඳටම දැනෙනවා. එදාට වඩා අද කම්පන ගතිය අඩුයි. එදාට වඩා ගොඩක් දේවල් වලින් මිදිලා කියල දැනෙනවා. නමුත් මිදුණු නැති සමහර ගති ස්වභාවයන් තියෙනවා. ඒකත් දැනෙනවා. ඇත්තටම මට දැනෙනවා කියන එකයි, සිතනවා කියන එකයි තේරිලා තිබුණේ නෑ. මේ මෑතක දී මට අත්දැකීමක් ලැබුණා ආර්යයන් වහන්ස. එතකොට තමයි තේරුණේ දැනෙනවා කියන එකෙයි, හිතනවා කියන එකෙයි වෙනස කොයිතරම් ද කියන එක. ඒක මට ප්‍රත්‍යක්ෂ වුණා. එතනින් පස්සේ මගේ කයේ විඩාව කියන දේත් නැති වෙලා ගියා වගේ දැනුණා ආර්යයන් වහන්ස. ප්‍රීතියක්, කායික සුවයක්, බොහොම සතුටින් කටයුතු කරන්න පුළුවන් බවක් තමයි ඊට පස්සේ දැනුණෙ. ඒ තමයි මම මේ දක්වා කරගෙන ගිය දේවල් වලින් මට ලැබුණු අත්දැකීම සොබා දහමයි අපියි එක්වුණා කියන එක. ඇහැට පේන්නේ, අපි හිතුවොත් විතරයි ඇහැට පේන්නේ කියන එක. මම ඉඳගෙන හිටිය තැන ලොකු හුළඟක් තිබුණා. එතනදී හුළඟ කියන එකත් ඇත්තටම අපිට අත්දකින්න බෑ නේ. හිතින් හිතාගෙන බලන දෙයක් තිබුණෙ, මෙච්චර කල් කියන එක. හිත කියන්නෙත් ප්‍රවාහයක් කියන එක, ඒ වෙලාවෙ අත්වින්දා ආර්ය වහන්ස. දැනෙනවා මේ යන මාර්ගය හරි කියලා. ආශ්‍රව ක්ෂය වෙනවා, නිවෙනවා කියන එක, හොඳටම ප්‍රත්‍යක්ෂයි.

**ආර්යයන් වහන්සः** ගොඩක් හොඳයි. ඇත්තට ම අපි අලමරියඥාන දර්ශනය කතා කරාට, අලමරියඥාන දර්ශනය කියන්නෙ මේ ධර්මය තුළ

විදර්ශනා යානිකයාට හමුවන සුවිශේෂ සංධිස්ථානයක්. ඒ කියන්නේ, මේ අපි කතා කරනවා විදර්ශනාව කියන එක. අපි දන්නවා සමථය කියන්නේ එක නිමිත්තක සිහිය පිහිටුවා ගෙන ලබන සමථ සමාධිය. සමථය තුළ ලෞකික සමාධි බුදුන් වහන්සේ බුද්ධත්වයට පත්වෙන්න පෙරත් මේ පස්වග මහණුන් පවා රූපාවචර බ්‍රහ්ම ලෝකවල අරූපාවචර බ්‍රහ්ම ලෝකවල ඒ සමාධිවල හිටියා. ප්‍රථම ධ්‍යානය, ද්විතීයික ධ්‍යාන, තෘතීයික ධ්‍යාන, චතුර්ධ්‍යාන. නමුත් බුදුන් වහන්සේ තමයි ලෝකෙට හෙළි කරන්නෙ මේ විදර්ශනාව. ඒ වෙනතුරුම තිබුණෙ ජටිලයෝ, නිගණ්ඨයෝ කරගෙන ගිය සමථ සමාධි සතළිස් කමටහන් අපි කතා කරන්නේ. සතිනිමිත්ත. එක නිමිත්තක සිහිය පිහිටුවා ගෙන සිත විසිරෙන් නැතුව තියාගෙන ලබන සමාධිය තමයි අපි සමථ සමාධිය කියන්නෙ. නමුත් මේ ලෝකෝත්තර භූමියේ බුදුන් වහන්සේ ලෝකෙට හෙළි කරන විදර්ශනා සමාධි පිළිබඳව මේ වන විටත් කතිකාව අඩුයි. ඇත්තටම අපිට ගොඩක් පොත්වල හමුවන්නේ 'සමාධි' සමාධි භාවේ තබ්බං" කියන කොට මේ ලෞකික, සමථ සමාධි ගොඩක් අය දන්නෙත් නෑ. අපි එහෙම කිව්වම අපිට වැරදිලා වගේ තමයි. සමහර අයට ඒ තරම්ම අවබෝධයක් නෑ. ඇත්තටම මොනවද මේ විදර්ශනාව, මොනවද මේ විදර්ශනා සමාධිය කියන එක පිළිබඳ බොහෝ අයට අවබෝධයක් නෑ. අද භාවනා පන්තිවල බුද්ධ දර්ශනය බොහෝ අඩුයි. බොහෝ අය කරන්නෙ සිහිය පිහිටුවා ගෙන සමථ සමාධියේ කටයුතු කරන එක.

ත්‍රිපිටකය තුළ ග්‍රන්ථධුරය තමයි ගොඩක් ඇවිල්ලා තියෙන්නෙ. ග්‍රන්ථ ධූරයත් අවශ්‍යයි. අවශ්‍ය නැතුව නෙවෙයි. මොකද මේ සූත්‍ර තුළින් තමයි අපිට අවශ්‍ය දේවල් මතු කරල ගන්න වෙන්නෙ. නමුත් විදර්ශනාව කියන්නෙ පොතක තියෙන දෙයක් නෙවෙයි. ඒක තමා තුළින් දැකිය යුතු දහමක්. ඒ තුළින් තමයි ධර්මය අප තුළින් දැකලා සසර දුකින් මිදෙන එක සිද්ධ වෙන්නෙ අපි තුළින් දැක්කොත් තමයි. විදර්ශනාව තුළින් තමයි ඇත්තටම මේ සසර දුක නිමාව සිද්ධ වෙන්නෙ. ග්‍රන්ථ ධුරය තුළින් අපිට එන්නෙ දැනුමක්. ඒ දැනුම තුළ තමයි අපි අසරණ වෙන්නෙ. දැනුම තවත් සංඛාර ගොඩක් බවට පත්වෙනව. නමුත් සංඛාර සමථය කිරීමට යන ගමන තුළ, තවත් සංඛාර ගොඩක් එකතු කර ගැනීම තුළ අපි නිවන් මගින් ඈත් වෙනවා. අපි නොදැනුවත්වම විදර්ශනය අහිමි වෙන්න ඒක හේතු වෙනවා. ඉතිං බොහොම පරිස්සම් වෙන්න ඕන. ඇත්තටම ග්‍රන්ථ

ධුරය අපිට අවශ්‍යයි. අවශ්‍ය නැතිව නෙවෙයි. අපිට ඒක උපමා කරන්න වෙන්නෙ දැලි පිහියේ උපමාවට තමයි. කුස්සියට පිහිය අවශ්‍යයි. නමුත් අපි ඒක පරිස්සමෙන් භාවිත කරන්න ඕනි දැනගෙන. අන්න ඒ වගේ දෙයක් මෙතන තියෙනවා. ඇත්තටම විදර්ශනා ධුරය අපිට පොතක ලියන්න පුළුවන් එකක් නෙවෙයි. ග්‍රන්ථ ධුරය වගේ සෛද්ධාන්තික දෙයක් නෙවෙයි. විදර්ශනා ධුරය කියන්නේ, **අපි තුළින් අපි දැකලා අපි අත්දකින දේ. මේක සාන්දිට්ඨික ධර්මයක්. ඒක ඒකාන්තයෙන් අපේ අභ්‍යන්තරයෙන් සිහියට අසුවෙන නුවණට අසුවෙන දහමක්. එය ප්‍රත්‍යක්ෂතාවය තුළයි සිදුවන්නෙ මේ සාන්දිට්ඨික, අකාලික, ඒහිපස්සික, ඕපනයික, පච්චුප්පන්න ධර්මය. මේක තමා තුළින් දැකිය යුතුයි.**

ඇත්තටම විදර්ශනා යානිකයාට තමයි මේ ධර්මය හමුවන්නෙ. මේ මග යන සෑම යෝගාවචරයෙක් ම, 'සමථ-විපස්සනා' 'යුගන්ධන්' ගමනක් තමයි මේ නිවන් මග කටයුතු කරන්නෙ. ඒක බුදුන් වහන්සේ "මහා සලායතන සූත්‍රයේ" මනා කොට පෙන්වා තියෙනවා. බුදුන් වහන්සේගෙන් භික්ෂූන් වහන්සේ නමක් ප්‍රශ්නයක් අහනවා හතරවන ධ්‍යානයට සම වදින්න ඕනිද කියලා මේ විදර්ශනාව වඩන්න. ඒ ප්‍රශ්න වලින් අපට වැටහෙනවා බුදු සමයෙත් මේ ප්‍රශ්න තිබුණා කියලා. ඒ කියන්නේ ප්‍රථම ධ්‍යානයට සමවැදිය යුතු ද? විදර්ශනවා වඩන්න, දෙවෙනි ධ්‍යානයට සමවැදිය යුතු ද? විදර්ශනාව වඩන්න කියලා. බුදුන් වහන්සේ මේකට දෙන පිළිතුර ඉතාම සෘජුයි. බුදුන් වහන්සේ දේශනා කරන්නේ ඕනෑම "චිත්ත ඒකාග්‍රතාවකින්" නිවන් දැකිය හැකියි මහණෙනි කියලා. එතනදි බුදුන් වහන්සේ දේශනා කරනවා ප්‍රථම ධ්‍යානයේ දී විදර්ශනා වැඩිය හැකිය. දෙවන ධ්‍යානයේදීත් විදර්ශනා වැඩිය හැකියි. මහණෙනි, තුන්වෙනි ධ්‍යානයේදීත් විදර්ශනයා වැඩිය හැකිය මහණෙනි, හතරවෙනි ධ්‍යානයේදීත් විදර්ශනා වැඩිය හැකියි මහණෙනි කියලා. එහෙම කියල නවත්වන් නෑ. බුදුන් වහන්සේ නැවතත් කියනවා, සමථ සමාධියක් නැතත් ඕනෑම චිත්ත ඒකාග්‍රතාවකින් නිවන් දැකිය හැකියි මහණෙනි කියලා. විදර්ශනවා වැඩිය හැකියි මහණෙනි කියලා. මෙතනදි අපට පැහැදිලි වෙනවා විදර්ශනාව කියන්නේ එන අරමුණේ ඇත්තටම ස්කන්ධයේ උදය වැය දැකීමටයි මහණෙනි නිවන් දැකීම සඳහා කළ යුත්තේ කියන කොටත් ස්කන්ධය කියන්නේ අරමුණ. අරමුණ හේතුවෙන්නේ "ස්කන්ධානානං පාතිභාවෝ - ආයතනානං පටිලාභෝ"

කියන තැනින්. එතකොට අරමුණක් එන්නේ ආයතනයක් හරහා. ඒ එන අරමුණ, ස්කන්ධයක් හරහායි.

අරමුණ කියන්නෙම ස්කන්ධයමයි. ස්ක්ධය දැකීමයි. අපි කිව්වේ සිතට එන අරමුණේ සත්‍යය දකිනවා කියන්නේ. එකම කාරණාව තමයි. **"ස්කාන්ධානානං පාථිභාවෝ - ආයතනානං පටිලාභෝ" එතකොට අරමුණක් එන්නෙ ආයතනයක් හරහා. සිතට එන අරමුණේ සත්‍ය දැකීමයි ස්කන්ධයේ උදය වැය දකිනවා කියනවා. ස්කන්ධයේ උදය වැය දැකීමමයි මහණෙනි නිවන් දැකීම සඳහා කළයුත්තේ කියලා බුදුන් වහන්සේ දේශනා කරනවා**. ස්කන්ධය කියන්නේ අරමුණ නම්, අරමුණේ සත්‍ය දකිනවා කියන්නේ එකම කාරණාව. අපි බොහොම සරලව දහම පැහැදිලි කරන කොට බොහෝ ඉගෙන ගත් අයට ඒ තුළ තර්ක විතර්ක ගොඩ නැගෙනවා. නමුත් ඒක හොඳින් ගළපා බැලුවම තමයි මේ කෙටි කරල කියන වචන, ඔව් ඒක ඇත්ත. ඒ අයට තේරෙන්නෙ මේක විශාල පරියායකින් අවසාන නිට්ටාවක් තමයි මේ කෙටි කරල කියන වචන, ඔව් ඒක ඇත්ත. බුදුන් වහන්සේ සුනීත, සෝපාක, කුමාර කාශ්‍යප පොඩි හාමුදුරුවෝ, විශාඛාව, රාහුල කුමාරයා වගේ අවුරුදු හතේ කුඩා දරුවන්ටත් මේ දහම දේශනා කරලා, ඔවුන් මගඵල ලබනවා. ඔවුන් සෝතාපන්න වෙනවා. එහෙමනම් අපට දැන් වැටහෙනවා මේ දහම ලොකු විෂය මාලාවක තියෙන එකක් නෙමෙයි. ඇත්තටම අප තුළ මේ අරමුණේ සත්‍ය දකින එක තමයි තියෙන්නෙ. ඒ නිසයි පොඩි දරුවෙකුට උනත් අපි කියන්නෙ බාහිර තියෙනවා නෙවෙයි, මේ අපි හිතන දෙයක් බව. අන්න ඒ වගේ සරල වචන වලින් කිවුවොත් වැටහෙනවා. "පුතේ මේක සිතුවිල්ලක්, පුතේ මේක බාහිර තියෙන එකක් නෙවෙයි; හැම එකම අපි හිතනවා පුතේ කියල කිව්වොත් මේ පුංචි වචන ටිකේ ලොකු දහම් පර්යායක් තියෙනවා ධර්මය පැත්තෙන් බැලුවොත්. ග්‍රන්ථ ධුරයෙන් ඒක විග්‍රහ කරන්න පුළුවන් ලොකු පැහැදිලි කිරීමක් කියලා. මේ තියෙන්නෙ ඇත්තටම සරලව පැහැදිලි කළ හැකි දහමක්.

ඒක හඳුන ගන්න එක පහසු නෑ. ඒක හඳුන ගන්නේ ඒ මග ගිය, ඒ ප්‍රත්‍යක්ෂතාව තුළ එය කෙසේ ද කියන එක හොඳින් අවබෝධයට පත්වුණ අයකුට බුදුන් වහන්සේ ඒ දේශනා කළ ආකාරයට ඒක අවබෝධ වෙනවා. ඇත්තටම බුදුන් වහන්සේත් සරලව මේ දහම දේශනා කරනවා, එක් එක්

අයගේ ස්වභාවය දැකලා. උදාහරණයක් ලෙස 'චුල්ලපන්තකට' සූත්‍ර කටපාඩම් හිටියෙ නෑ. චුල්ලපන්තකට මහා පන්තක සූත්‍ර පාඩම් කරන්න දුන්නා. චුල්ලපන්තකට සූත්‍ර පාඩම් වුණේ නැති නිසා සිවුරු හැරලා යන්න අදහස් කරනවා. බුදුන් වහන්සේ වන්දනා කරලා සිවුරු හැරලා යන්න ද කල්පනාව කියලා චුල්ලපන්තකගෙන් අහනවා. බුදුන් වහන්සේ, සූත්‍ර කට පාඩම් කරන්න ඕනි නෑ චුල්ලපන්තක මේක පිරිමදින්න කියලා සුදු රෙදිකඩක් දීලා උන්වහන්සේ පිණ්ඩපාතේ වඩිනවා. මේ තුළත් නිවන් දකිනවා කියන්නේ, මේ ලෝක ස්වභාවය අවබෝධ කර ගන්න සූත්‍ර කට පාඩම් කිරීමට අවශ්‍ය නැති බව ඒ පණිවුඩය අපිට එතැනින් ලැබෙනවා. එහෙම නේද මෙහෙණින් වහන්ස.

**මෙහෙණින් වහන්සඃ** එහෙමයි, ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සඃ** එතකොට මේ හැම තැනකින් ම යමක් අපිට නොවැටහෙනවා නම්, මේ ධර්මය තුළ හොඳින් ඒක දකින්න ඕනි. විෂයක තියෙන දෙයක් නෙවෙයි ඒක අපි හරියට දැක්කෙ නැතිකමත් එහෙනම් නොදැකීමක් තියෙන්න ඕනි කොතනක හරි. හොඳින් පිරිසිදු කර ගන්න ඕනි දැන් මේ කාරණාව. මෙතනදි අපට කියන්න ඕන වුණේ, මේ විදර්ශනාව අද සමාජයේ බොහෝ අය මේ ගැන කතිකා කරනවා අඩුයි. බොහෝ අයට අවබෝධය අඩුයි. බොහෝ අය හිතන් ඉන්නේ විදර්ශනාව කියන්නෙත් ග්‍රන්ථ ධුරය කියලමයි. විදර්ශනා ධුරය කියන්නේ ග්‍රන්ථ ධුරය නෙවෙයි. ඇත්තටම එහෙම දෙයක් නෑ. ඇත්තටම තියෙන්නෙ එකම නිවන් මගයි. "ඒකායන මග්ගෝ - අයං - භික්ඛවේ." මෙතනදි අපිම සකස් කර ගන්න ත්‍රිපිටකය අපිට ඉවහල් වෙලා තියෙනවා. උපකාර වෙලා තියෙනවා ගොඩක් දේවල් පැහැදි කර ගන්න දීර්ඝව පැහැදිලි කරලා තියෙනවා. හැබැයි ඒකට කොටුවෙන එක තමයි අපි ග්‍රන්ථ ධුරය ගැන කතා කරන්න හේතු වෙලා තියෙන්නෙ. ග්‍රන්ථ ධුරයට කොටුවීමයි අපි කියන්නෙ හිරවීමක් කියලා. ඒ වගේ ම අපි නිවන් මගය කියල එක එක තැන්වල හිරවෙනවා. භාවනා පන්ති කියන ස්ථාන අපිට වර්තමානයේ ගොඩක් හමුවෙනවා. ඒ පන්ති කියන එකේදිත් අපි කොටු වෙනවා. මේක පන්තියකට යන එකක් නෙවෙයි. **මේක අපේ ජීවිත කතාව. ඒ කියන්නෙ, අපිව අප තුළින් දැකල මේ සසර දුකින් මිදෙන්න ඕනි. අපි විසින් ම අපේ අභ්‍යන්තරය අවබෝධ කරගන්න දෙයක් තමයි මෙතන තියෙන්නෙ.**

ඇත්තටම මේ බුදු දහම කියන්නෙ, තුන් කාලයකට දාන්න පුළුවන් දහමක් නොවෙයි. මේක අකාලික දහමක්. මේ මොහොතෙම දකින දහමක්. එහෙනම් අපි බුද්ධ ධර්මය කියලා හිතාගෙන වෙනින් සංකල්ප ගොඩක් කරේ තියාගෙන ඒ සංකල්පවල හිරවෙලා ඉන්නකම් ඇත්තටම බෞද්ධයෝ කියලා කියා ගන්න විශාල පිරිසකට ඒක විශාල හිරවීමක්. මේ ධර්මය තුළ සිද්ධ වෙලා තියෙන විශාල අපරාධයක් වගේ අපිට දැනෙන්නෙ. මේ පතනා බෝධියකින් නිවන් දකිනවා කියන කතාව. මේක මේ යුගයෙම ඇති වූ එකක් මිස බුදු සමයේ එහෙම කතාවක් අපට හමුවෙන්නෙ නෑ. මේක අකාලික දහමක්. මේක සාන්දිට්ඨික දහමක්. මේ මොහොතෙම ප්‍රත්‍යක්ෂ වෙන දහමක්. මේ මාර්ගයේ කටයුතු කරන භික්ෂූන් වහන්සේලායි ඒ වගේ ම මෙහෙණින් වහන්සේලායි. මේ මාර්ගයේ කටයුතු කරන ගිහි පිරිසගෙන් යමක් ඉල්ලා සිටිය යුතුයි. ඒ තමයි තුන් කාලෙට දාන්න එපා මේ අකාලික දහම. ඒක බුද්ධ ධර්මයේ නාමයෙන් කරන විශාල අපරාධයක්. මොකද ඒක ගෞතම බුද්ධ ශාසනයට තිත තියන්න හේතුවෙන කාරණයක්. මේ මොහොතෙ දැකිය යුතු අකාලික දහම සමාජයට අහිමි කරනවා.

මේ ගෞතම බුද්ධ ශාසනයේ නිවන් දකින්න බෑ කියනවා නම්, ඒ මේ බුද්ධ ශාසනය ඝාතනය කරන ඝාතකයින්. මේ පතනා බෝධියක් එනකං ඉන්න ඕනි කියල කියනවා නම්, තමන්ගෙ නොහැකියාව තමන් තුළ තබාගෙන නිහඬ විය යුතුයි. එහෙම නැත්නම් මේ අකාලික දහම සමාජයට අහිමි කළා වෙනවා. මොකද වටිනා මාණික්‍ය රත්නයක් මේ ලෝකයේ කොහේවත් අපට හමුවෙලා නෑ. කිසිම ආගමක අපට හමුවෙලා නෑ, මෙවන් වටිනා මාණික්‍ය රත්නයකට යමෙක් වචනයක් භාවිත කරනවා නම්, ඒ බොහොම පරිස්සම් විය යුතුයි. ඒක දැනගෙන කළ යුතුයි. ඒක නොදැන කරන එක අතිභයානකයි. "ආනි" සූත්‍රවල බුදුන් වහන්සේ මනා කොට දේශනා කරනවා අනාගතයේ බුදු දහම විනාශ කරන මෙවැනි අය බිහිවන බව. එවැනි ආකාරයට භික්ෂුවක් මේ ශාසනයේ කටයුතු කරයි නම් බුදුන් වහන්සේ කියන්නේ "සංඝයා ඝාටක" භික්ෂුවක් කියලා, බුදුන් වහන්සේ ආනි බෙරේට උපමා කරනවා. මේ ධර්මය කියලා අපි කොතනක හරි හිරවෙලා එක එක දේවල් කරනවා නම්, ඒක මේ ශාසනයේ විනාශයට හේතු වෙනවා. මේ යුගයේ, මේ වගේ කාරණා බොහෝ තියෙනව.

සමහරු ආමිසයට ගැට ගැහිල ඉන්නවා. සමහරු පිටකයට ගැට ගැහිල ඉන්නවා. බුදුන් වහන්සේ බුදු සමයේ දේශනා කරනවා පිටකයේ තිබ්බට පිළිගන්න එපා කියලා. මාපිටක සම්පාදය, "මහෝප දේශනා" සූත්‍ර හොඳින් අධ්‍යයනය කරන්න ඕනි. මේ යුගයේ නැවත නැවත දේශනා කළ යුතුයි. එතරම් වටිනා සූත්‍ර මහෝපදේශනා සූත්‍ර තුළ බුදුන් වහන්සේ දේශනා කරනවා. "යමෙක් කිව්වට පිළිගන්න එපා, ඇහුවට පිළිගන්න එපා, දැක්කට පිළිගන්න එපා. මාපිටක සම්ප්‍රදායේ පොතේ තිබ්බට පිළිගන්න එපා. මම කිව්වා කියලා මම මෙහෙම කියල තියෙනවා කියල කියයි, ඒත් පිළිගන්න එපා කියලා බුදුන් වහන්සේ බුදු මුවින් ම දේශනා කරනවා. මෙන්න මේ මහෝප දේශනා සූත්‍ර. මේව කාටවත් ප්‍රතික්ෂේප කරන්න බෑ. මේ බුද්ධ දේශිත බුදුන් වහන්සේගේ වචනයෙන් ම කියල තියෙන දේවල්. මේ දහම විශ්වාස කරන එකක්, ඇදහිල්ලක් නෙවෙයි. පුද්ගල සරණ ගිහිල්ලා මේ යුගයෙ කාටවත් නිවන් මග හමුවෙන්නෙ නෑ. මේ නිවන් මග හමුවෙන්නෙ මේ ධර්මයට ගුරුන් කොට සලකන අයට පමණයි. බුදුන් වහන්සේ ව ආදර්ශයට ගන්න. බුදුන් වහන්සේ පුද්ගල සරණ ගියේ නෑ. පුද්ගල සරණ යන්න බෑ මේ මග යන අයට. මේ ධර්මය කියන එක පුද්ගලයෙක් දකින එකක් නෙමෙයි. පුද්ගලයෙක් නොදකින දහමක්, පුද්ගලයෙක් දැකල යන්න පුළුවන් ගමනක් නෙවෙයි. අපි මේ දේශනා කරන ධර්මය තමා වැදගත් වන්නේ. මේ මග යන කෙනා තමාගෙ සසර ගමන නිමා කර ගන්න එකයි වැදගත් වෙන්නෙ. මේ විඤ්ඤාණ මායාව, මායාවක් විතරයි. මේ විඤ්ඤාණ මායාව අපිට මවන හැම දෙයක් ම මායාවක්මයි. ඔබ දන්න ධර්මය පමණක් විශ්වාස කරන්න. අපි කියන්නේ, අපේ දේවල්වත් පුද්ගල භාවයෙන් ගන්න එපා. ඒක නිසා අපි පුද්ගලයෙක් දාලත් නෑ.

මේක නාම රූප උපරුජ්ජනය වන දහමක්. නාම රූප මතු කරගෙන කියන්න හැකියාවක් නෑ. එහෙනම් මේ දහම අවසානයේ කෙනෙක් හමුවෙන විදිහක් නෑ. මේක සත්ත්වයෙක්, පුද්ගලයෙක්, ආත්මයක් නැති දහමක්. අවසානයේ ආත්මයක් කරේ තියා ගන්නව නම්, එතන ධර්මය තියෙන්න විදිහකුත් නෑ. ඒ නිසා තමයි අපි සියලු දේවල් මනා කොට නුවණින් දැකලා, මෙවැනි දේවල් නුසුදුසුයි කියලා වැටහිල ඇත්තටම නාමයක්, රූපයක් නැතිව නිහඬව කටයුතු කරන්නෙ. ධර්මය පමණයි වැදගත් වෙන්නෙ. මේ ධර්මය ලෝකෙට හෙළි කළ යුතු බව අපිට

වැටහුණා. අපි යමක් අවබෝධ කළා නම් එය ලෝකෙට හෙළි කිරීම අපේ යුතුකමක්. ඒ යුතුකම අපි ඉටු කරා පමණයි. ඒ තුළින් යමක් යමෙකු ගන්නව නම් ඒක තම තමන්ට භාරයි. ඒකත් විශ්වාස කරන එපා. මේ මග කටයුතු කරල බලන්න. බුදුන් වහන්සේ ම කියනවා. " ඒහි පස්සිකෝ" "ඕපනයිකෝ" කියලා. එන්න බලන්න කියනවා මිසක් විශ්වාස කරන්න කියන්නෙ නෑ. ඒක බලලා තමන්ට ප්‍රත්‍යක්ෂ නම් විතරයි මේ සාන්දිට්ඨික ධර්මය භාර ගන්නෙ. ඇත්තටම මේ යුගයේ පුද්ගල සංඥාවෙන් වැළකිය යුතුමයි. අප විසින් ම, අපිව පිරිසිදු මග ගෙනියන්නෙ එන්න එදාටයි. මේ කතා කරන අප පවා විශාල භික්ෂූන් වහන්සේලා පිරිසකගේ ආභාෂය ලබලා තියෙනවා. ඒ අය අතර අපි කොටු ගැහුණා නම් අපිට මේ දහම හමුවෙන්නෙ නෑ. හැම කෙනෙක්ගෙ න් ම අපි ධර්මයයි දැක්කෙ, ධර්මයයි ගත්තේ. ඒ තුළින් අප දැක්ක දේ ලබා ගත් දේ අපගේ මේ අවසානය සඳහා අවබෝධය සඳහා උපකාරී වුණා. මේ ධර්මය ප්‍රායෝගිකව දකිමින් අපි අප තුළින් ධර්මය දකිමින් අවබෝධ කර ගත යුතු ධර්මයක් බව අප මතු කොට, ගත්තා "සෝ ධම්මං පස්සති, - සෝ මං පස්සති" කියන තැන.

**ධර්මය කියන්නෙ ඇත්තට ම දෙයක් නැති බවයි. ඒක තමයි මෙතන තියෙන ආශ්චර්යමත් වාක්‍යය. ඒ කියන්නෙ "ධම්ම" කියන්නෙ දෙයක් නැති බවයි. ධර්මයේ තියෙන්නෙ, ඉත්තභාවය, අන්‍යතාභාවයට පත්වෙන හැටි. ඒ කියන්නේ මේ සත්ත්ව ස්වභාවය, ඉත්ත ස්වභාවයයි, ඒක තමයි ආත්ම ස්වභාවය.** හැබැයි මේ දහම තුළ තිබෙන්නෙ අනාත්ම ධර්මයක්. මේ ධර්මය තුළ තියෙන වටිනාම දේ තමයි "පටිච්ච සමුප්පාද ධම්මේසු ධම්මං" කියන්නේ "ඉදප්පච්චතාව" කියල කියන්නෙ ඇත්තටම මෙය ඇති කල්හි මෙය වේ කියන කොට, සම්භූත වෙන දෙයක් අපි කතා කරනවා. නමුත් ඒක තියෙන දෙයක් නෙවෙයි. මෙන්න මේකයි ඇත නැත අන්ත වලින් මිදුණ දහමක ඇත්තටම ආශ්චර්යය, බාහිර දෙයක් තියෙනවා නම්, ඒක ඇත. එහෙම නැත්නම් නැත. බුදුන් වහන්සේ බුද්ධත්වයට පත්වෙන විට බ්‍රාහ්මණයෝ, නිගණ්ඨයෝ ජටිලයෝ බාහිර ඇත නැත යන අත්නවල 64 ක් ප්‍රශ්න. බොහෝ සූත්‍ර දේශනා වල ඒ නමින් ම සඳහන් වෙනවා. ඒ ප්‍රශ්න. බුදුන් වහන්සේ ලෝකෙට හෙළි කළේ ඇත නැත අන්ත වලින් මිදුණු දහමක්. සාශ්‍වත දෘෂ්ටියත්, උත්තේප දෘෂ්ටියත් යන දෙකෙන් ම මිදුණු දහමක් ලොවට හෙළි කළා.

ඇත කිව්වත් වැරදියි මහණෙනි, නැත කිව්වත් වැරදි මහණෙනි තියෙන දෙයක්, තියෙන ලෝකයක් නැත මහණෙනි. "සම්භූත" වෙනවා මහණෙනි. "හේතුං පටිච්ච සම්භූතා- හේතු භංගා නිරුජ්ජති." හේතු ඵල දහම බුදුන් වහන්සේ ලෝකෙට හෙළි කරන්නෙ. ඒ හේතුඵල දහම තුළ තියෙන ලෝකයක් නෑ. එයයි තියෙන ආශ්චර්යය.

හේතුඵල දහම කියන්නෙ "සම්භූත" වෙනවා කියන එකයි. "හේතුං පටිච්ච සම්භූතා හේතු භංගා නිරුජ්ජති" මේ කතාවේ තියෙන එකක් නෑ, "ඨිථියක් නෑ." "උප්පාද පඤ්ඤායතී- වයෝ පඤ්ඤායතී" ඨිතත්ත අඤ්ඤථත්තං පඤ්ඤායතී" මේ 'ඨිථිත්ත අඤ්ඤථත්තං පඤ්ඤායතී" කියන්නේ , "ඨිථිය" අන් ආකාරයට පත්වෙන භාවයක් පමණයි. ඨිතත්ත අඤ්ඤථත්ත පඤ්ඤායතී, ඨිථියක් නෑ කියන එකයි. ඇත්තටම වේගය තුළ අපට "ඨිථිතයක්" මැවෙනවා. ගඟ ගලනවා. ගලන ගඟක් අපි 'ඨිථිතියක්' පනවගෙන, අපි ගලන ගඟක් දෙයක් කරගෙන ඉන්නවා. **වැස්ස වේගයෙන් වහිනවා. වැස්ස කියන්නේ, වතුර බිංදු වැටෙනවට. අපි තියෙන වැස්සක් හදාගෙන ඉන්නවා. අන්න ඨිථියක් පනවගෙන ඉන්නවා. ඒ 'ඨිථිය' දෘෂ්ටියක්. ඒකමයි සක්කාය දෘෂ්ටිය. ඒකයි අපි සිත කියල දෙයක් නෑ කිව්වේ. සිත කියන්නෙ වේගෙකට ගඟ වගේ ගලනවා.** මේ සිතත් අර 'ස්පාර්ක්' වෙන වේගය පමණයි. 'ස්පාර්ක්' වන වේගෙට තියෙනවා වගේ දැනෙන එකක්. ඇත්තට ම තියෙනවා කියන එකයි සිත කියන්නෙ 'ඨිථියක්' කියන එක, එහෙම එකක් නෑ. මෙන්න මේක අවබෝධ කර ගැනීමයි ඇත්තටම මහා ආශ්චර්යයක් වෙන්නෙ.

ඇත්තට ම තියෙන දෙයක් අවබෝධ කර ගන්නව ද? නැති බවක් අවබෝධ කරගන්නව ද? ඒ කියන්නෙ අන්තෙකට ගිහිල්ලා නෙවෙයි. ඒ කියන්නේ ඇත නැත අන්ත වලින් මිදුණු දහමක් අවබෝධ කරගන්නවා කියන එක හිතනවට වැඩිය දුර්ලභ කාරණාවක්. ඒ මග තමයි අපි මේ යන්නෙ. ඉතිං දකින්න නුවණින්. හිතක සකස් වෙන සංඛාර ලෝකයක් කවදාවත් අපිට එළියෙන් දකින්න ලැබෙන්නේ නෑ. "මනෝ පුබ්බංගමා ධම්මා" මේක සිතුවිලි ලෝකයක්. "චිත්තේන නීයති ලෝකයක්." පුටුවක්, මේසයක්, ඇඳක්, ඉරක්, හඳක්, ගහක්, කොළයක්. අපට බාහිරින් තියෙනව කිව්වට, අපි සිතුවිල්ලක හිරවෙලා ඉන්නෙ. අපි සිතුවිලි වල ජීවත් වෙන්නෙ. අපි ඉන්නේ සංඛාරවලට කොටුවෙලා, අපි ඉන්නෙ

විඤ්ඤාණ මායාවට කොටු වෙලා. විඤ්ඤාණ මායාවේ අත්දැකීමෙන් එහා ගිය අත්දැකීමක් අපිට නෑ. අන්න එතනින් අපි දකින්න ඕනි. දැන් ඒ මූලික පැහැදිලි කිරීමත් සමග මෙහෙණින් වහන්සේගේ ප්‍රශ්න ඉදිරිපත් කරන්න.

**මෙහෙණින් වහන්සේ:** එහෙමයි, ආර්යයන් වහන්ස. ඔබ වහන්සේ දැන් දේශනා කරපු ටික අත්දැකීමෙන් ප්‍රත්‍යක්ෂ ලෙස දැනුණා. ආර්යයන් වහන්ස. නමුත් ඒක හැම මොහොතෙම නෙවෙයි. දැන් සිහියත් පවතිනවා. ඒ දැනෙන ස්වභාවය හැම මොහොතකම දැනෙන්නෙ නෑ. එදා ඒක දැනුමෙන් එහාට ගිය අත්දැකීම් ලැබුවත් ඒක තවත් කෙනෙකුට වචනයෙන් පැහැදිලි කරන්න අමාරුයි ආර්යයන් වහන්ස. ඒක තමාම අත්දකින්න ම ඕනි.

**ආර්යයන් වහන්සේ:** එහෙමයි, මේ දහම ඉතාම ගැඹුරු, ආශ්චර්යමත් දහමක්. මෙතනදි අපි ධර්මයත් එක්ක ම ධර්මයට අනුගතව ප්‍රායෝගික පැත්තට හැරිලා කතා කරොත් අපිට හරි සතුටුයි මෙහෙණින් වහන්සේලාගේ තියෙන උනන්දුව කැපවීමට. මේ යුගයේ වටිනා කාරණාවක් බුදු සමය හා සමාන කාරණාවක් අපි මේ කතා කරන්නෙ. මේ බුද්ධෝත්පාද නාලිකාවේ, ‘බුද්ධෝත්පාදෝ’ ආර්යයන් වහන්සේ හැම මොහොතම දකින්නෙ බුදු සමය වගේ තමයි, මොකද දකින්නෙ ධර්මයමයි. මේ සත්‍යය දකින නිසාමයි එහෙම වෙලා තියෙන්නෙ. සත්‍යය දකින කොට සත්‍යය ගැනමයි කතා කරන්නෙ.

**මෙහෙණින් වහන්සේ:** අපිටත් ඒක හොඳටම දැනෙනවා. ආර්යයන් වහන්ස. මේ බුදු සමයමයි කියල අපිටත් දැනෙනවා හොඳටම.

**ආර්යයන් වහන්ස:** ඇත්තටම ඉර පායන මොහොතේ සිට ඉර බහින මොහොත දක්වා, බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ වසර 3 ක් තිස්සේ මේ විදිහට ධර්මය දේශනා කරනවා. මේ දේශනා ප්‍රාතිහාර්යය තුළ බොහෝ දෙනාට හැකියාව ලැබිල තියෙනවා ඒ තුළින් තමන්ට අවශ්‍ය දේ තේරුම් කරගෙන, උපකාර කරගෙන තමන්ගේ ම සිත තුළින් දැකලා තමන්ගෙ නිවන් මග නිවැරදි කරගෙන, සකස් කරගෙන පිරිසිදු කරගෙන මේ යුගයෙත් ‘මගඵලලාභීන්’ බිහිවෙනවා. විදර්ශනා යානිකයෙක් කියන්නේ ඇත්තට ම ගොඩක් වටිනවා. සමාජයට ආදර්ශයක් වෙන්න

සැබෑම විදර්ශනා යානිකයෙක් කෙසේ විය යුතුද? කියන එක අපිට සිද්ධවෙලා තියෙනවා ඉස්මතු කරල දෙන්න. මේ විදර්ශනා සමාධිය ගැන සමාජයේ කතිකා නොවන යුගයක 'අලමරියඥාණ දර්ශනය' ගැන ඒ ප්‍රත්‍යක්ෂතාවයකින් හෙළි කළොත් හැරෙන්න, ඒක පොතකින් අපට කවදාවත් හමුවෙන්නෙ නෑ. අනිත් හැමෝටමත් ඒ දේ දකින්නට උත්සුකවීම, යම්කිසි පසුබෑමක් තිබුණ නම්, නෑ බෑ කියන එක පැත්තකට කරලා මේක කරන්න පුළුවන් හැකියි කියලා මේ උත්තේජය දෙන්න ඕන මේ සමාජයටම. අපට 'කමෙන්ට්' දාලා තිබුණා මේක මොන පොතේද තියෙන්නේ කියලා. මේක පොතක ලියන්න පුළුවන් එකක් නෙවෙයි. මේ විදර්ශනා සමාධිය පොතේ ලියන්න පුළුවන් ද? ඇත්තටම බෑ. ඒකට හේතුවක් තියෙනව. දැන් අපි ගත්තොත් 'අලමරියඥාන දර්ශනය' කියල කියන්නෙ, රූප දර්ශනයට එහා ගිය දැක්මක්.

'රූප දර්ශනය' කියන්නේ සාමාන්‍ය මස් ඇහැට පේන දර්ශනය. ඒකම තමයි අපි අර ගන්නේ රූප දර්ශනය කියලා. නාම-රූප දෙකක් කියලා දෙකක් අපට හමුවෙන්නෙ නෑ මේ දර්ශනය ගැන අවබෝධ වෙන කොට. ඇත්තටම **අපි සේරම තියෙනවා නෙවෙයි හිතනවා කියලා, සිතින්ම හදා ගත්ත ලෝකෙක අතරමං වෙලා ඉන්නෙ. මස් ඇහැට පේන දර්ශනයට එහා ගිය දර්ශනයක් තමයි "ධම්ම චක්ඛුසයට" අසුවන දැක්ම. කවදාවත් "ධම්ම චක්ඛුසයට" අසුවන දේ මස් ඇහෙන් දකින්න බෑ. ඒකයි "ආලෝකෝ උදපාදී, චක්ඛුං උදපාදී" කියල කිව්වෙ. "චක්ඛුං උදපාදි කියන්නෙ, ධම්ම චක්ඛුසය අවදි වෙනවා කියන එකයි.** ඒ ධම්ම චක්ඛුසය අවදි වෙනවා කියන එක ගැන අපිට මතකයි අපෙන් ප්‍රශ්නයක් ඇහුවා. ඒ ප්‍රශ්නය තමයි මේ සාමාන්‍ය විදිහට පේන දේට එහා ගිය දෙයක් පේන්න පුළුවන් ද? කියන එක. ඇත්තටම මේ 'ඥාණ දර්ශනය' පහළ වෙනකම් කිසි කෙනෙකුට ඒ ගැන අදහස් නැති වෙනවා. නමුත් ටිකෙන් ටික ටිකෙන් ටික කුතුහලයක් ඇති වෙන්නත් පුළුවන්. සැකයක් ඇතිවෙන්නත් පුළුවන්. විචිකිච්ඡාවක් ඇතිවෙන්නත් පුළුවන්. ඒත් කමක් නෑ. හැමෝම මොකුත් දැනගෙන එනවා නෙවෙයි නේ. හැමෝම එන්නෙ පෘථග්ජන භූමියේ ඉඳන්නෙ හැමෝම අනුසෝතය තුළ දීර්ඝ කාලයක් කටයුතු කරලනෙ එන්නෙ. අපි ටික ටිකනෙ අවබෝධය ඇති කර ගන්නෙ. මේක මෙහෙම වෙන්න පුළුවන් ද කියලා ප්‍රශ්න කරන එක විචිකිච්ඡාව ඇතිවෙන එක බොහොම සුන්දර කතාවක්. සාධු... කියන්න ඕන තැනක්.

**ඒ කියන්නෙ ඔබ ඒක මෙනෙහි කරන්න උත්සාහ කරනවා. ඔබ ඒක තව දැක්කෙ නෑ. ඒක නිසා ඔබට දැන් සැකයක් තියෙනවා ඇත්තටම එහෙම දෙයක් වෙනවද කියලා. මේ ප්‍රශ්නය ඔබ දියුණුව කරා ගෙන යනවා.** විමර්ශන බුද්ධියේ ස්වභාවය තමයි ප්‍රශ්න ඇසීම. මෙන්න මේක නිහතමානීව දකින්න ඕනි. බුදු සමයේ දී බුදුන් වහන්සේගෙන් හැම ප්‍රශ්නයක් ම අහනවා. ලෝකය කියන්නේ මොකක් ද? ඇයි අපට අද බැරි අපි කොතන ද ඉන්නෙ. අපි කොහොම ද? භික්ෂුවක් වෙන්නෙ. එහෙනම් එලොවත් මිදිලා, මෙලොවත් මිදිලා දෙලොවම සමව වාසය කරන්න ඕනි. ඒ කතාවෙ තේරුම මෙලොව වාසය කරන්න ඕනි. මෙලොවින් පැනල යන කතාවක් නෙවෙයි මෙතන. තේරෙනව නේද? මේ කියන කතාව එලොවයි මෙලොවයි කියල ලොකු කතාවක් මෙතන නෑ. හොඳයි ධර්මය දැක්කම පේනවා, **මේ අරමුණ ඇත්ත කර ගැනීම මෙලොව ඉර, හඳ, ගහකොළ, මේස පුටු කියන ලෝක සංඥා තියෙනවා කියන්නෙ මෙලොව. අරමුණ ඇත්ත වීම මෙලොව. හැබැයි ඒ අරමුණ සත්‍ය දැකල මිදෙන තැන එලොව. මෙලොවයි එලොවයි දෙකම තියෙන්නෙ අරමුණේමයි. බුදුන් වහන්සේ දේශනා කරනවා සූත්‍රවලත් පෙන්නන්න පුළුවන් මෙලොවත් එලොවත් අතර පරතරය නෙළුම් පතකත්, දිය බිඳකත් අතර ඇති පරතරය කියලා.** ඒ කියන්නෙ නෙළුම් පතත් දිය බිඳත් අතර කොයින් ද පරතරයක්. අන්න, ඒ අති සියුම් කතාවෙන් බුදුන් වහන්සේ ම පෙන්නනවා එලොවත් මෙලොවත් අතර පරතරය නෙළුම් පතත් දිය බිඳත් අතර ඇති පරතරයට සමානයි කියලා.

මේ එන අරමුණ ඇත්ත කරගත්තොත් එලොව, මේ එන අරමුණ සත්‍ය දැකල මිදුණොත් ඒ එලොව. ඒ කියන්නේ ඇත්තටම අරමුණ සත්‍යයක් නෙවෙයි විඤ්ඤාණ මායාවක්. ඒ විඤ්ඤාණ මායාව දැක්කොත් එලොව විඤ්ඤාණ මායාවෙන් මිදෙනවා. ඒ විඤ්ඤාණ මායාවට රැවටුණොත් මෙලොව. ඒ කියන්නේ විඤ්ඤාණ මායාව හැම තිස්සෙම දෙයක් පෙන්නනවා. විඤ්ඤාණය කියන්නෙ වෙන් කර දැකීම. දැන් අපි ගත්තොත් පුංචි දරුවා ඉපදෙන කොට මොකුත් දන්නෙ නෑ. හොඳම උපමාව තමයි පුංචි දරුවා මොන්ටිසෝරි යනකොට ඇහැට දෙනව ආලෝක හැඩතලය, කනට දෙනවා ශබ්දය. ශබ්දයකින් තමයි මේ ආලෝක හැඩතල වෙන් කළේ. එතකම්ම දරුවට එකම ආලෝක කතාවක් විතරයි. මේක ශබ්දයකින් වෙන් කරලා, අපි දෙයක් කර ගන්නේ

ඊට පස්සේ. එතන ඉඳලා දරුවට රතුපාට කියන්නෙ වෙනම එකක්. කහපාට කියන්නෙ වෙනම එකක්. අන්න ඒ වෙන් කරපු ගමන්, බන්ධන බලයක් එන්නේ. දෙක අතර ගැටීමක්, එක්කො ඒක හොඳයි, එක්කො මේක හොඳයි. හොඳ නරක දෙක අතර අන්ත දෙකක්. ඒකත් තියෙනවා. මේකත් තියෙනවා. අන්න භාෂාවක් හැදෙනවා. උත්තම පුරුෂ ප්‍රථම පුරුෂ මධ්‍යම පුරුෂ. එතන, මෙතන අතන තේරෙනවද මේ කතාව. මේ පුංචි දරුවට වෙච්ච දේ දැක්කොත්, පුබ්බේ නිවාසානුස්සති ඥානය තිබ්බොත් මේක දකිනවා. ඒකයි අපි කිව්වේ ත්‍රිවිද්‍යා නැතිව නිවන් මගක් නෑ කියලා.

පුබ්බේනිවාසානුස්සති ඥානය අල්ලන්න බැරි තැනකට දාලා විශාල අපරාධයක් කරලා තියෙන්නෙ. හැබැයි අපි පෙන්නුවා පුබ්බේනිවාසානුස්සති ඥානය. මේ එන අරමුණේමයි තියෙන්නෙ කියලා. අපි පෙන්නුවා ක්ෂණ සම්පත්තිය මේ තුළමයි තියෙන්නේ, ඒ ක්ෂණයේමයි, මේ සත්‍ය දැකලා "මිදුණොත් එතනයි ක්ෂණ සම්පත්තිය." මුළු ධර්මයම තියෙන්නෙ මේ අරමුණේ. මේ අරමුණම තමයි සිත කියන්නෙ. කියන්නේ බුදුන් වහන්සේ අරහත්ත සමාධියේ දී දේශනා කරන්නේ "යංහි යංහි තත්‍ර තත්‍ර විපස්සති" කියලා දකින සමාධියක්. එක අරමුණක්, එක අරමුණක් කියන්නේ? මේ සිත කියන්නෙ ප්‍රවාහයක්. වැස්ස වහිනවා වගේ. වතුර බිංදුවක් බිංදුවක් වැටෙනවා වගේ තමයි මේ සිතක් සිතක් ඇතිවෙලා ඇතිවෙලා නැතිවෙන එක. දැන් තේරුණාද? ඒකයි කිව්වේ **එක සිතක් දකින එකයි ධර්මය අවබෝධ කරනවා කියන්නෙ. ඒකයි ක්ෂණ සම්පත්තිය කියන්නෙ.**

ඒ දකින කොටම මොකද වෙන්නෙ. ඒකත් එක්ක දිගට තියෙනවා වගේ අර වැස්ස වගේ අපි ඉත්තත්වයක් දීලා මේක තුළ ලෝක සංඥාවක් විදියට මේක තුළ සත්ව භාවයක්, ඉත්තභාවයක් එකතු වෙලා ආත්ම භාවයක් ගොඩනැගිලා, අපි ආරෝපණයකට කොටු වෙනවා. අපිට **ආරෝපණය දිය කරන්න ඕනි.** ඒ කියන්නේ **තණ්හාව ක්ෂය කරන්න ඕනි.** "තණ්හක්ඛයෝ නිබ්බාණෝ." මේ වේගය තියෙනකම්, ආරෝපණය දිය වෙන්නෙ නෑ. මේ වේගේ තියෙනකම්, චුම්භකය වේගයෙන් කැරකෙනකම්, වික්ටෝරියා ඩෑම් එකෙන් විදුලිය එනවා වගේ. විදුලිය එන එක නවතින්නේ අර වේගයෙන් කැරකෙන චුම්භකය නැවතුණොත්.

ඒ කියන්නෙ චුම්භකයෙ තියෙනවා අන්ත දෙකක් ධන සෘණ කියලා. මේ අන්ත දෙක වේගෙන් කැරකෙන කොට මේ අන්ත දෙකෙන් එන ආරෝපණ එකට එකතු කරලයි ඔය ශක්තිය හදාගෙන හැමදේම කරන්නෙ. ඕක අපි පෙන්නුවා. මුළු පෘථිවියම උපමා කරගෙන. හැබැයි මේවා සංකල්ප විතරයි. මේවා කියන කොට කලින් ම කියන්න ඕනි උපමා, සංකල්ප විතරයි. මේ විදිහටම තමයි උපමේය "සිත" හැදෙන්නේ. මේ පෘථිවිය හැදෙන විදිහටමයි සිත හැදෙන්නෙ. අපිට ඒක ඕන තැනක ඔප්පු කරල පෙන්වන්න පුළුවන්.

අපි පැහැදිලි කරන දේ ඔබ තුළින් ඔබ බලන්න. ඔබට දවසක සත්‍යය වැටහේවි. මේ ඔක්කෝගෙම තියෙන්නෙ එකම න්‍යායයක්. අන්වීක්ෂයකට විද්‍යාඥයෙක් ගන්න පරමාණුවේ තියෙන්නෙත් මුළු විශ්වයේ ම තියෙන්නෙත් පෘථිවිය හැදෙන්නෙත් එකම න්‍යායකටයි. ඒක බුදුන් වහන්සේ පෙන්නනවා. සිත හැදෙන්නෙත් ඒ න්‍යායටයි. ඒ ස්වභාව දහමක් විතරයි. නොගැළපෙන අන්ත දෙකක් තිබ්බොත් මැද්දෙ ශක්තියක් උපදිනවා. ඒ නොගැළපෙන අන්ත දෙක බුදුන් වහන්සේ පෙනන්නවා මජ්ජේ සූත්‍රයේ **"යෝ උභො අන්තේ විදිත්වාන-මජ්ජේ මන්තා න ලිප්පති - තං බ්‍රෑහි මහා පුරුෂෝ - සේදසිබ්බනි මජ්ජගා" කියලා. නොගැළපෙන අන්ත දෙක කුමක් ද?** හැම තැනම එහෙමයි. මේක විශාල විද්‍යාවක්. ඇත්තටම **මේ විද්‍යාව නොගැළපෙන අන්ත දෙක අවිද්‍යාව. මේ චිත්ත නියාමය, කම්ම නියාමය, බීජ නියාමය, සෘතු නියාමය ගැන අපි කතා කරනවා.**

තවත් ගුරුත්වාකර්ෂණය ගැන කතා කරන කොට අපි විද්‍යුත් ආරෝපණයක් ගැන කතා කරනවා. අපි මේවා කතා කරන්නේ මේ සංකල්පවල හිරවෙල ඉන්න නෙවෙයි. අපි කියන්නෙ මේ තුළින් දකින්න කියලා හිත තුළ හැදෙන විඤ්ඤාණ මායාවයි නාම-රූප වල කතාව. විඤ්ඤාණ මායාවෙ නාම-රූප වල කතාව ඒ තරම් ගාම්භීරයි. ගැඹුරුයි. ඒ **ගැඹුරු ගාම්භීර ධර්මය. අපිට සරලව අවබෝධ වෙන කොට හැම තැනම පේන්න ගන්නවා, මෙයින් තොර දහමක් නැති බව.** අපි කතා කරන සංඛාර ලෝකයක්, සංකල්ප ගොඩක්. අපිට පේනවා මේකමයි වෙන්නෙ එයමයි වෙන්නේ. එයමයි වෙන්නේ කියලා. මොකක් ද ඒ? නොගැළපෙන අන්ත දෙකක් තිබුණොත්, කොන් දෙකක් තිබුණොත් මහණෙනි, අන්න

කොන් දෙකක් තිබුණොත් තමයි, මැද ශක්තියක් උපදින්නේ. ඒ කියන්නේ නොගැළපෙන අන්ත දෙකක් තිබුණොත් ධන සෘණ කියල, මැද්දෙ ස්පාක් වෙනවා. බැටරියේ කරන්ට් එක ධන සෘණ කියල තියෙනවා. වයරය දෙපැත්තේ ගාවපු ගමන් 'චටස්' ගානවා. හරියට අහසේ විදුලියක් කොටනවා වගේ. හරියට ම ඒ දෙකම එකයි. විදුලි කොටන්නෙත් ධන සෘණ කියන ආරෝපණ දෙකක් නිසා තමයි. එහෙම නේද?

**මෙහෙණින් වහන්සේ:** එහෙමයි.

**ආර්යයන් වහන්සේ:** විඤ්ඤාණ ශක්තිය ඇති වෙන්නෙත් මේ විදිහට තමයි. විදුලියක් කොටනවා වගේ තමයි. ස්පාක් වීමක්. ඒකම තමයි නොගැළපෙන අන්ත දෙකක් අතර ෂෝට් එක. විදුලි කොටන එකමයි මෙතන සිද්ධ වෙන්නේ. බාහිර දෙයක් තියෙනව වගේ දැනෙන එක, නැති දෙයක් තියනවා වගේ දැනෙන එකමයි ස්පාක් එක. ධන සෘණ අජ්ඣත්ත-බහිද්ධා කියලා බුදුන් වහන්සේ පෙන්නුවේ ඔය අන්ත දෙක. ද්වේතානුපස්සනා සූත්‍රවල පෙන්නන්නේ ඒ අන්ත දෙක. මේක ඕනිම තැනක පෙන්නන්න පුළුවන්. ඒකම තමයි පටිච්ච සමුප්පාදයට හේතුවෙන්නෙත්. ඒ ඕනිම තැනක මේක පෙන්නන්න පුළුවන්. අන්ත දෙකක් තිබුණොත්, ඒ දෙකක් අතර ස්පාක් එකක් තිබුණොත්, අන්න ඒක තමයි විඤ්ඤාණ මායාව. "යො උභො හන්තේ විදිත්වාන-මජ්ඣේ මන්තාන ලිප්පති-තං බ්‍රෑහි මහා පුරුෂෝ - සේද සිබ්බනි මජ්ජගා" ඒ කියන්නේ "යෝ උභො අන්තේ" අන්ත දෙකක් නැත්නම් මැදකුත් නෑ මහණෙනි කියලා. ඒ කියන්නෙ, නොගැළපෙන අන්ත දෙකක් තිබුණොත් මැද්දෙ ශක්තියක් උපදිනවා කියන කතාව. මේක තමයි නාම-රූප අර එළියෙ තියෙනවා, මෙතන මම ඉන්නවා. හැබැයි එහෙම දෙකක් නෑ මේ ධර්මය තුළ. දැන් ධර්මය අවබෝධ වුණාහම මොකද වෙන්නෙ. මේ ජේනව නෙමෙයි හිතනවා. හිතනව වුණාම මොකක්ද වෙන්නේ? එළියෙ දෙයක් නෑ කියලා හිතනවා විතරයි. එහෙම වුණාම අන්න, අන්ත දෙකක් නැති වෙනවා. අන්න ධර්මය අවබෝධ වෙනවා. අන්ත දෙකක් නැත්නම් මොකද වෙන්නේ. අපේ තියෙනවා නම් තියෙනවා කියල ඇතිවුණ ඉත්තත්වයක්, දෙයක් වගේ දැනෙන ගතියක් ඒකයි දියවෙලා යන්නේ. ඒ දියවෙනවා කියන්නේ, සත්ත්ව පුද්ගලභාවය දියවෙනවා කියන්නේ, ආත්මයයි දියවෙලා යන්නෙ. ආත්ම දියවෙලා ගියොත් මොකක් ද ඉතිරි

වෙන්නේ. අන්න නිවන ඉතිරි වෙන්නෙ. නිෂ්ක්‍රීයයි. අන්න එතනයි අපි පෙන්නන තැන. **අනිමිත්තයි, ශූන්‍යයි, අප්‍රණීතයි "චේතෝ විමුක්තිය."**

චිත්ත විමුක්තියක් කියන්නෙ මේ භෞතික විමුක්තියක් නෙවෙයි. චිත්තය කියන්නෙත් මායාවක්. මෙතන මොකුත් නෑ. ශබ්ද, වර්ණ, ගන්ධ, රස, පහස ආයතන පහේ ස්පාක් වෙන එක විතරයි. පොඩි දරුවට සිද්ධ වෙන්නෙත් ඒකමයි. **එහෙනම් මේ ප්‍රසාද ටික ශබ්ද, වර්ණ, ගන්ධ, රස, උණුසුම, ශීතල, තද ගතිය කියන මෙන්න මේවා ස්පාක් වෙනවා. වේගයක් තුළ ස්පාක් වෙනවා. එතකොට මොකද වෙන්නෙ, මේවා ටික එකට එකතු වෙලා දෙයක් වගේ දැනෙන එක තමයි අප ආත්මය කියලා හදාගෙන ඉන්නෙ. හේතුව නම් ශබ්ද, වර්ණ, ඵලය නම් ආත්මය කිව්වෙ ඒකයි. ඒකයි බුදුන් වහන්සේ කිව්වේ මහණෙනි, මේ හේතුව ඵලයට අයිති නෑ කියලා. මේ හේතු ඵල දහම දකින්න මහ නුවනක් ඕනි.** බුදුන් වහන්සේ ඕකට උපමා කරනවා කිරි වලින් ගිතෙල් හැදුවට, ගිතෙල් නැවතත් කිරි කරන්න බෑ කියලා. අද යුගයේ විදියට කියනවා නම් චීස් හැදුවට කිරි වලින්, චීස් කිරි කරන්න බෑ. මේකමයි ආත්මය හැදුණට ශබ්ද වර්ණ එකතු වෙලා, ආත්මය නැවත ශබ්ද වර්ණ වෙන්නෙත් නෑ. අපි අවසානයේ ඵලය කරේ තියාගෙන ඉන්නවා. ඵලය තමයි ආත්මය කියන්නෙ. අවසානයේ බැලුවොත් ආත්මය කියන්නෙ ශබ්ද වර්ණමයි. නමුත් අපිට ඒකෙන් ආපු ආරෝපණය ශබ්ද වර්ණ කියල අපිට දැනෙන්නෙ නෑ. මේකෙ ඵලය හේතුවට අයිති නෑ. ඵලයට අපි රැවටෙනවා. ආත්මය කියල දෙයක් කොහොවෙත් නෑ. ඇත්තටම තියෙන්නෙ මායාවක් විතරයි. චිත්තයක් විතරයි. ඒකයි මේක 'චිත්තේන නීයති ලෝකෝ කියල කිව්වෙ. මේක 'සංඛාර ලෝකයක්.' 'සකස් කර ගත්ත ලෝකයක්.' ඒකයි 'සළායතන ලෝකෝ' කියන්නේ. ඒකයි 'සළායතන නිරෝධෝ නිබ්බාණෝ' කිව්වෙ. ඒකයි බුදුන් වහන්සේ ඇස ලෝකයයි කියල කිව්වෙ. සළායතන කිව්වෙ ආයතන. ඇසේ උපතයි මහනෙනි උපත කිව්වෙ ඒකයි. මුළු ධර්මයම තියෙන්නෙ ඕතනයි. වෙනව කොහේවත් නෑ.

රවුම් ගහල වන්දනාවෙ ගියාට අපිට කවදාවත් නිවනක් හමුවෙන්නේ නෑ. නිවන හම්බෙන්නේ මේ ඇස කියන ලෝකෙ හරියට දැක්කොත්. මේ මොහොතෙ මේක දැක්කොත්. අපි නිවන උඩ ඉඳගෙන නිවන හොයන

අය. ඒකයි ඇත්ත කතාව. කොහෙවත් යන්න අවශ්‍ය නෑ. මේ මොහොතෙ මේ දකින ජේන එක, මෙන්න මෙතනින් විසඳන්නයි තියෙන්නෙ. මේකට මහා නුවණක් අවශ්‍යයි. මේ නුවණ පාදා ගන්නයි අපි මේ බණ අහන්නේ, සද්ධර්මය ශ්‍රවණය කරන්නේ. බුදුන් වහන්සේ ම සෝතාපත්ති අංගවල පෙන්නනවා කල්‍යාණ මිත්‍ර ඇසුර, සද්ධර්ම ශ්‍රවණය වැනි ධම්මානුධම්ම පටිපදාව, යෝනිසෝ මනසිකාරය. අපි මේ අනුසෝතයට ගඟ ගලන අතට දුවනවා. මුළු සමාජයම එහෙමයි. මේ ලෝකෙ ජනගහනය කෝටි 800ක් වෙනවා. කෝටි 800 ම ඒ විදිහට දුවනවා. ඔක්කොම දිවුවත් අපිට පළක් නෑ. අපිට ඒක ගැන අදහසකුත් නෑ. අපි මේ සත්‍ය දකිනවා. අපිට ධර්මය තුළ හමුවෙනවා පාත්තරය උඩුගං බලා ගිය කතාව. මෙතනයි පටිසෝතය. සමහරවිට මුළු ගඟම පහළට ගැලුවත්, සමහරවිට එක සිද්ධියක් තියෙනවා අන්න උඩුගංබලා යන. අපේ අභ්‍යන්තරය අපිට ප්‍රත්‍යක්ෂයි. මේ අන්ත දෙකෙන් මිදෙන හැටි අපි කියන්නෙ. අපි කතා කරන්නෙ අන්ත දෙකක් නැති දහමක් ගැන. අන්ත දෙකක් හදාගෙන මැදක් හොයන සමාජයක් අද තියෙන්නෙ. මධ්‍යම ප්‍රතිපදාව කියල අන්ත දෙකක් හදාගෙන මැද හොයන අය අපට හමුවෙනවා. එහෙම අන්ත දෙකක් කොහෙද තියන්නෙ. බුදුන් වහන්සේ දේශනා කරපු ධර්මය වලිගෙන් අල්ල ගත්තා වගේ. සර්පයා ඔළුවටම දෂ්ට කරන්නෙ. එයාලා පැටලෙනවා මිසක් වෙන මොකුත් හමුවෙන්නෙ නෑ.

"යො උභො භන්තේ විදිත්වාන" කියන තැනින් මේක ගළපගන්න ඕනි. "විනෙය්‍ය ලෝකේ" කියන තැනින් සතර සතිපට්ඨානය ගළපන්න ඕනි. "විනෙය්‍ය ලෝකේ" අන්න ලෝකයක් නැති බව දකින්නයි සතර සතිපට්ඨානය වඩන්නෙ. එහෙනම් මේක හරියට වැඩුවොත් බුදුන් වහන්සේ ඇප වෙනවා වගේ අපිත් ඇප වෙනවා මේ දේශනා අධ්‍යයනය කරන අයෙක් ඒකාන්තයෙන් ම නිවන් දකින බවට. මේ බුද්ධ ස්වභාවය තුළ වචන දෙකක් නෑ. ඒ බුද්ධ වචනමයි. ඔබ අවබෝධ කරන්න ඔබමයි මා කියලා. ඒකට හේතුව ස්වභාව දහමමයි. සියල්ල ස්වභාවදහම අවබෝධ කරන්න කියලයි අපි කියන්නෙ. ඔබ දාන්න ඔබේ නාම රූප මේ වෙනුවට. අපි කියනවා සාධු... සාධු... කියලා. ඇයි ඒ? ඔතන කෙනෙක් නෑ. ඔබට මේ දහම අවබෝධ වුණොත් ඔබේ නාම රූපත් දාන්නේ නැති බව අපි දන්නවා. එහෙනම් ඔබ දාන්නෙත් නැත්නම් අප දාන්නෙත් නැත්නම් අපි සේරම බුද්ධ ස්වභාවයට අත්වැල් බැඳ ගත්තා වගේ වෙනවා. ආර්ය

භූමියේ දෙන්නෙක් නෑ කිව්වෙ ඒකයි. අන්න සැබෑම ආර්ය භූමිය ශුද්ධ කරන කාලය ඇවිල්ලා. "අරියානං දස්සාවි - අරිය ධම්මේසු කෝවිදෝ- අරිය ධම්මෝ විනයෝ" තැනට අපි අන්න අනුගත වෙලා. ඒ ආර්ය භූමිය අන්න නැවතත් ඉස්මතු වෙනවා. ආර්ය භූමියේ නැවතත් බෝධි අංකුර වැවෙනවා. ඒක නවත්වන්න කිසි කෙනෙකුට හැකියාව ලැබෙන්නේ නෑ. මේ යුගයේ අපිට හොඳ දැක්මක් තියෙනවා. මේ දේවල් හොඳට නුවණට හසුවෙනවා. මේ බුද්ධෝත්පාද කාලයයි. අවුරුදු 2500ක් ගිය තැන නැවතත් මේ බුද්ධ ශාසනය පිබිදෙනවා කියන්නත් හේතු තියෙනවා. අපිටත් ඒක නුවණින් කියන්න පුළුවන් කාරණා තියෙනවා. එදත් ඒක කියන්න පුළුවන් කාරණා තිබිලා තියෙනවා. සමහරවිට පෘථග්ජන භූමියට මේවා එතරම් ගෝචර වෙන්නෙ නෑ. ඒ නුවණ නැති නිසා. නමුත් ආර්ය භූමියට මේ සියල්ල නුවණට අසුවෙනවා. හොඳටම දන්නවා මේ බුද්ධෝත්පාද කාලය කියලා. මේ යුගයේ මේ දහම ඉස්මතු වෙන එක කිසිවෙකුට නැවැත්විය නොහැකියි. සමහරවිට පෘථග්ජන ස්වභාවයෙන් තමන්ගෙ දෙයක් විදිහට පෙන්නන එක, ආත්ම සංඥාවෙන් දකින එක පුද්ගලභාවය මමත්වය ඉස්මතු කරන එක ඒක වෙන්න පුළුවනි. ඒ පෘථග්ජන ස්වභාවයෙන් මේක දකින හැටිනෙ. පෘථග්ජන ස්වභාවයටනෙ මේක දෙයක් වෙලා තියෙන්නෙ. ඒ අයත් එක් එක්කෙනා මිදි මිදී එනවනෙ ආර්ය භූමියට. එහෙනම් කතිකාව හොඳයිනෙ. ඒ අයටත් මේ මොහොතෙ කරන්න පුළුවන් කියන අදහස ඇවිල්ලනෙ ඔය කියන්නෙ. ඒ හැම අදියරක්ම අපි කියන්නේ හොඳයි කියලා.

බුද්ධ දේශනා කියන්නේ ස්වභාව දහමට අනුගත දේශනා. ශූන්‍යතා පටිසංයුක්ත දේශනා. ශූන්‍යතා පටිසංයුක්ත දේශනා කියන්නෙ දෙයක් නැති බවයි. බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේගේ අදහස දෙයක් නැති බවයි. "ඉදප්පච්චඡතාව" කෙනෙක් නැති බවයි. ස්වභාවදහම බණ කියනවා.

"ඉමස්මිං සති ඉදං හෝති - ඉමස්මිං අස්සති ඉදං නහෝති
ඉමස්මිං උප්පාදා ඉදං උප්පජ්ජති - ඉමස්මිං නිරෝධා ඉදං නිරුජ්ජති"

කිව්වෙ දෙයක් නැති බවයි. එහෙනම් අවිද්‍යා පච්ඡයාසංඛාරා කියන්නේ අවිද්‍යා කියන්නෙ දෙයක් කියල ගත්තොත් එතනමයි සංඛාරා. එහෙම වුණොත් ඒකමයි නාම රූප, ශබ්ද, වර්ණ, උණුසුම සීතල

තද ගතිය එකතුවෙන එක. ඒකමයි විඤ්ඤාණය. "නාමරූප පච්චයා විඤ්ඤාණ" විඤ්ඤාණ පච්චයා සලායතන කියන්නෙ ඒ ආයතනික සිද්ධියටයි. ඵස්ස කියන්නෙ දෙයක් කර ගැනීමටයි. එහෙනම් වේදනා, සංඥා, සංඛාරා, **ඵස්ස පච්චයා වේදනා, වේදනා පච්චයා තණ්හා, උපාධාන, භව ජාති ජරා මරණ, ශෝක පරිදේව සේරම තියෙන්නෙ දෙයක් කර ගත්ත තැනයි. පටිච්ච සමුප්පාද ධර්මයම තියෙන්නෙ අරමුණේ. අරමුණ දකින තැනයි. එහෙනම් මහඋපදේශනා මේ සේරම තියෙන්නෙ මෙතනමයි, මේ අරමුණේමයි. සත්තිස් බෝධි පාක්ෂික ධර්මම තියෙන්නෙත්, සතර සම්‍යක්ප්‍රධාන වීර්යය ගත්තත් මේ අරමුණේ සත්‍ය දැකල මිදෙන හැටියි තියෙන්නේ. මේ ආර්ය අෂ්ටාංගික මාර්ගය ගත්තත් සම්මා දිට්ඨිය කියන්නෙ. මේ අරමුණේ සත්‍ය දැකීමයි. ඒ තුළමයි සම්මා සතිය, සම්මා සමාධිය උපදින්නෙ.** සතර සතිපට්ඨානය වැඩුවත්, - මේකෙ මහා ගැඹුරක් තියෙනවා. ඒ කියන්නෙ ස්කන්ධයමයි. වේදනා සංඥා සංඛාරමයි. ස්කන්ධයේ උදය වැය දැකීමම කියන්නෙ ඒ වේදනා සංඥා සංඛාර වල හට ගැනීම හා නිරුද්ධවීම දැකීමයි.

එහෙනම් සතර සතිපට්ඨානය වැඩුවා කියන්නේ කායානුපස්සනා, වේදානුපස්සනා, චිත්තානුපස්සනා, ධම්මානුපස්සනාවයි. වෙන මොකවත් නෙවෙයි අපට ඕනිම තැනක පෙන්නන්න පුළුවන් මේ සතර සතිපට්ඨානයේ කතා කරන්නේ ස්කන්ධ ගැනමයි. ස්කන්ධයේ උදය වැය දැකීමයි නිවන්මග වන්නේ. එයමයි සතර සතිපට්ඨානය තුළත් තියෙන්නේ. එයයි පට්ඨාන හතරේ පැහැදිලි කරන කාරණා. මේවා ගොඩක් අයට අවබෝධයක් නෑ. සූවිසි පඨ්ටය කියල කතා කරාට සූවිසි පට්ටය ගැන අවබෝධයක් තියෙන්නේ කාට ද? ඔවුන්ට දැනෙන්නෙ ඕනි මේ කතා කරන්නෙ දෙයක් නැති බවයි කියලා. මේ මුළු ධර්මය ම වැලි මිරිකුවා වගේ පෙන්නලා දීමේ හැකියාව අප සතුයි. ඒ නිසයි අපි මෙහෙම සිංහනාදයක් කරන්නේ. මේ බුද්ධ ස්වභාවය කෙනෙක් පුද්ගලයෙක් හැටියට ගන්න එපා. බුද්ධ ස්වභාවය තියෙන ශ්‍රාවක බුද්ධ කෙනෙක් වෙන්න ගෞතම බුදුන් වහන්සේට ඒ තැන දීලා බුද්ධ ශ්‍රාවකයෙක් විදිහට කටයුතු කරන්න මොකද අපි මේ ධර්මය ගත්තෙ එතැනින්. මේ ධර්මය අපි පැහැදිලි කරන්නෙ එතැනින්. බුදුන් වහන්සේ දේශනා කළා "යමෙක් මේ ධර්මය අවබෝධ කරේ ඒ බුද්ධ පුත්‍රයෙක්මයි."

**මෙහෙණින් වහන්ස :** එහෙමයි ආර්යයන් වහන්ස. නමස්කාර වේවා.

# 02

# නුවණැත්තෙක් වී සිතුවිලි මායාවෙන් මිදී මොහොතට අවදි වන්න

**මෙහෙණින් වහන්සේ :** චිත්ත වේගයක් ගැන ඔබ වහන්සේ දේශනා කරද්දී අපට තේරෙනවා, සිතුවිලි එන්නෙ වේගයක් තුළනේ ආර්යයන් වහන්ස. ඒ වේගය තුළ සිතුවිලි එනවා දැනෙනවා. නමුත් ඒවා මගේ කරගන්නෙ නැතුව අරමුණෙන් මිදෙන කොට, ඒ සිතුවිල්ල නෙමෙයි. නමුත් වෙන සිතුවිලි එන ස්වභාවය තියනවනෙ, ඒක දැනෙනව වේගයක් තුළ එන සිතිවිලි ප්‍රවාහයක් කියල දැනෙනවා ආර්යයන් වහන්ස. අපි මේ තුළ කටයුතු කරන කොට ඒ වේගය අඩුවීමක් වෙනවද ආර්යයන් වහන්ස?

**ආර්යයන් වහන්ස:** ඔව්. ඒක හරි. ඇත්තට ම පෘථග්ජන ස්වභාවය තමයි "පෝනෝභවිකා" ස්වභාවය. **පෝනෝභවිකා ස්වභාවය කියන්නෙ, වේගෙට ගිනිබෝලයක් කරකවන කොට. වේගය නිසා තමයි අර ගිනි බෝල දෙකක් නැතුව, එකට ආලෝකය ගිනි වළල්ලක් විදිහට පේන්නේ. වළල්ලක් විදිහට පේන එක තමයි, අපිට ඒකීයත්වයක් පේන එක.** ඒකීයභාවය **ඒකම තමයි මේ අපිට සිත කියල පේන එක.** දහමට යොමුවෙන කොට වෙන්නෙ **ඇත්තටම සිත අපි දකින කොට, සිතට සිහියක් පවතිනවා. සම්මා සතිය තුළ, ධර්මය අසන කෙනාට** සද්ධධර්ම ශ්‍රවණය තුළ. **දෙයක් නැති බව දැනෙන කොට, ඒක මෙනෙහි වෙන්නත් යම්කිසි පොඩි කාලයක් ගතවෙනවා.** සිහියට යම්කිසි ඉඩක් යනවා. අන්න, ඒ තුළ **අර වේගය අඩු වෙන්න ගන්නවා.** ඒ වගේ ම **ඒක බලගැන්වෙන්නෙ නෑ. බලගැන්වීම තුළ, අර චිත්ත අනුව්‍යංජන හැදෙන වේගෙත් අඩු වෙනවා. අර උද්යෝගය උද්දීපනය අඩු වෙනවා, උජ්ජිතදි**

**කියන එක අඩුවෙනවා. එතකොට 'පෝනෝභවිකා' ස්වභාවය "නන්දිරාග ය" අඩුවෙන කොට ඔක්කොම අඩු වෙනවා,** එක ම මට්ටමකින්. හැබැයි නැතිවෙන අවස්ථාවක් අපිට හමුවෙන්නෙ නෑ. කොහොමත් සිතක් ඇති වෙලා නැති වෙන එක සාමාන්‍ය ස්වභාවයක්. හැබැයි වේගය අඩුවීමක් සිද්ධ වෙනවා. සිතිවිලි ගලන වේගය, 'විතක්ක විචාර' එන වේගයක් තියෙනවනේ, ඒ වේගය අඩුවෙනවා. හැබැයි මේකෙ විග්‍රහය ඕක නෙවෙයි. ඒක දකින්න. ධර්මය තුළ කියන්නෙ මෙන්න මෙහෙමයි. **'සිත' කියන්නෙ වේගයක් නිසා සකස් වෙන දෙයක්. එන අරමුණ නෙවෙයි, අරමුණ එන්නෙ වේගයක් නිසයි. අරමුණ හැදෙන්නෙ වේගයක් නිසයි, අරමුණ කියන්නෙ සිතනෙ. අරමුණ කියන්නේ ශබ්ද වර්ණ ස්පාර්ක් වෙලා හැදෙන එකක් නෙ. දෙයක් වගේ දැනෙන එකනෙ.** 'සෙන්සස්' වල ස්පාක් වීමක්නෙ. මොන ආයතනයෙන් ආවත් **අරමුණ එන්නෙ, සෙන්සර් එකකින් නෙ.**

**මෙහෙණින් වහන්සේ:** අරමුණ තියෙනකං ඒක හට ගන්නවා කියන එක නේද ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්ස:** නෑ. ඊටත් වඩා ගැඹුරුයි. මේ කියන එක. ඒ කියන්නේ **ප්‍රසාදයට හේතුව, වේගයයි.** ඒ කියන්නෙ බිත්තිය තියෙනව කිව්වට මේ ඇස කියන එක, **ඒ කියන්නෙ ප්‍රසාදය කියන එක චිත්තක්ෂණ කෝටි ගාණක් පහළ වෙලා තමයි බිත්තිය කියන එක පේන්නෙ.** ස්පාර්ක් වෙන වේගයට තමයි, ඇස කියන ආලෝකයට දෙයක් වගේ පේන්නෙ. දෙයක් කියන්නෙ පොත මේස නෙවෙයි. දෙයක් කියන්නෙ චක්ඛු විඤ්ඤාණය. **චක්ඛු විඤ්ඤාණය කියන්නෙ වර්ණ හැඩතලයක් විතරයි.** ඒ වර්ණ හැඩතලය, ඇසට පෙනීම කියන එක වේගයක් තුළයි වෙන්නෙ. ඒ කියන්නේ වර්ණ හැඩතලය, චක්ඛු විඤ්ඤාණ ගැනයි මේ කතා කරන්නේ. **ඇහෙන් ගහන්නෙ ෆොටෝ එකක්නෙ, වර්ණ හැඩතලයක් නෙ.** පුංචි දරුවගෙ ප්‍රභාෂ්වර සිතට ගිහාම මේක පේනවා, ස්කන්ධ මට්ටමට. එතකොට වේගය තුළයි ඒ කියන්නෙ හිරු එළියට කණ්ණාඩියක් ඇල්ලුවම ඒකෙන් ස්පාර්ක් එකක් නෙ වෙන්නෙ. දිලිසෙනවනෙ. **ඒ ස්පාර්ක් වෙන වේගෙ, ගොඩක් වේගෙ වැඩි නිසා තියෙන එකක් වගේ දැනෙනවනෙ. ඒ ස්පාර්ක් එක තියෙන එකක් බවට පත්වෙනවනෙ. ඒ තියෙනව වගේ දැනෙන්නෙ වේගයක් තුළයි.** ගඟ තියෙනව වගේ දැනෙනවනෙ. ගඟ

තියෙනවා වගේ දැනෙන්නේ ගඟ ගලන හින්දනෙ වේගයෙන්. නැත්නම් ගඟක කතාවක් නෑනෙ. නැත්නම් ගඟක් හම්බෙන්නෑ. ගඟ කියන්නෙ වේගෙන් ගලන නිසයි. වැස්ස වහිනවනෙ. වැස්ස කියන්නෙ වේගෙටනෙ.

මේ මූලාරම්භයටයි මේ යන්නෙ. පොතත් හැදිල තියෙන්නෙ මේ ඔක්කොම එකට එන වේගය නිසයි. ඒක හරි. නමුත් අපි දැන් එක ආයතනයක් ගමු, ඇස කියන ආයතනය ගත්තොත් ආලෝකයක්, තියෙන ආලෝකයක් බවට පත්වෙන්නෙ වේගය නිසයි. මේ මුළු ධර්මයම සංඛාර ලෙසයි තියෙන්නෙ. **සංඛාරා කියන්නෙ වේගෙ, වේගෙට සකස් වෙනවා කියන එකයි. දැන් මේකෙ මැවුම්කරුවා වේගෙමයි. ඒ කියන්නෙ අනුසෝතය, සෝතය, සෝතය කියන එකමයි, 'ඕජාව'.** ඒ කියන්නෙ ඇස ස්පාර්ක් වෙන්න එපැයි දිගටම. **එක ස්පාර්ක් එකක්, එක සිතක් නෙවෙයි. ස්පාර්ක් වන වේගෙට සක්කායක්, සක්කාය දෘෂ්ටියක්. ඒ කියන්නේ, කාය කියන්නෙ ගොඩක්. වේග ගොඩක්, එකක් වගේ දැනෙන එකක්.** ඒ කිව්වේ, ඝන සංඥාවක් තමයි අපි ඇසුරු කරන්නෙ. පොත කියල ගත්තත් ඒක ඝන සංඥාවක්. ඒකයි **"රූපං රූපත්තාය සංඛතං අභිසංකරෝති."**

ඒ කියන්නේ අර ඇසෙන් එන ආලෝකය, නැවතත් ශබ්ද වර්ණ එකතු කරල දෙයක් කරල තියෙනවා. "රූපං රූපත්තාය සංඛතං අභිසංකරෝති" "සංඛාර සංඛාරත්තාය සංඛතං අභිසංකරෝති." ඒක නැවත නැවත නැවත නැවත මේක යනව, ඒ ගොඩ මේ ගොඩ, ඒ ගොඩ මේ ගොඩ. පළවෙනි එක දැක්කොත් එහෙම අපිට එන්න ඕන **ආලෝකයේ ප්‍රසාදයක්නෙ. චක්ඛු විඤ්ඤාණයෙන්. දැන් ඇස කියන්නේ නෑ නේ පොතක් කියලා, පොතක් කිව්වට, ඇසට ආවේ නෑනෙ පොතක්. චක්ඛු විඤ්ඤාණය දන්නෙ නෑනේ මේ පොතක්ද? මේසයක් ද කියලා. සෝත විඤ්ඤාණය දන්නෙත් නෑනේ පොතක්ද මේසයක්ද කියලා.** තේරුණා නේද මෙහෙණින් වහන්සේට.

**මෙහෙණින් වහන්සඃ** එහෙමයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සඃ** නමුත් මෙතන කියන්න යන්නේ, විඤ්ඤාණයක කතාවක් නෑ සංඛාරයක් නැතුව. විඤ්ඤාණය කියන්නෙ මේකට භාවිත කරන වචනයක් විතරයි. මේක සෝත විඤ්ඤාණය, ඝාන විඤ්ඤාණය,

මේ ජිව්හා විඤ්ඤාණය, මේක කාය විඤ්ඤාණය, මේ පටිත්ථිත විඤ්ඤාණය, මේ අනිදස්සන විඤ්ඤාණය. පළවෙනි එක තමයි මේ වචන ඔක්කොම බොරු. වචන ඇත්ත කර ගත්තොත් මේ ධර්මය හම්බවෙන්නෙ නෑ කාටවත්. ඒකට හේතුව **අද ගොඩක් අය ග්‍රන්ථ ධුරයේ වචන වල එල්ලිලා ඉන්නෙ. ඒ අය දන් නෑ මේ බොරු සංකල්ප ගොඩක හිරවෙල ඉන්නෙ කියලා.** මේ වචන එකක්වත් ඇත්ත නෙවෙයි. ඒකයි කිව්වේ නිවනත් පැත්තකින් තියන්න. පාරුවත් බිමින් තියන්න. මේ එකක්වත් ඇත්ත නෙවෙයි. මේවා අවබෝධ කර ගන්න භාවිත කරන මෙවලම් ටිකක් විතරයි, සංකල්ප ටිකක් විතරයි. ඒ කියන්නේ හැම වචනයක් ම බොරුවක්, සංඛාරයක්, ශබ්දයක්, වර්ණයක්. වෙන මොකුත් නෑ. ශබ්දයක කොහෙන්ද ඇත්තක්? වර්ණයක කොහෙන් ද ඇත්තක්? ඒකෙ දෙයක් තියෙනවද? පොතක් එහෙම දෙයක් නෑ. පොත කියන්නේ ශබ්දයකුයි, වර්ණයකුයි. ශබ්දයකුයි වර්ණයකුයි කවදාවත් එළියෙන් හම්බ වෙනවද? නෑ. ඒකයි පොත කවදාවත් එළියෙන් හමුවෙන්නෙ නෑ කිව්වෙ.

ඒකයි කිව්වේ 'ඇස නිත්‍යද?' 'අනිච්චං භන්තේ.' ඇස කියන්නේ පේන බව. ඇස කියන්නෙ මස් ඇහැට නෙවෙයි. දැන් පේන්නෙ පොතක්. පොතක් කියන්නේ ශබ්දයක් වර්ණයක්. ශබ්දයක වර්ණයක් කොහෙවත් පොතක් හමුවෙනවද? නෑ. ඒකයි 'අනිච්චං භන්තේ' කිව්වේ. 'අනිත්‍ය දුක්ඛ අනාත්ම කියන්නෙ, මේක අවබෝධ කරන ධර්මයක් 'අනිච්චං' කියන්නේ. අවබෝධ කරොත් ශබ්ද වර්ණ. අපි ඇසුරු කරන්නෙ පොතක්. පොත කියන්නෙ ශබ්දයක්, පොත කියල අපි දැම්මෙ ශබ්දය. ඇමෙරිකාවේ හිටිය නම් 'බුක්.' චීනෙ හිටිය නං 'චාං'. එහෙනම් ශබ්දය ඇත්තක් ද? පොතක් කියල දෙයක් තියෙනවද? නෑ. එතකොට මේ කතාව තුළ පළවෙනි මේ ස්පාර්ක් එක වේගය තමයි මේ සියල්ලම. විඤ්ඤාණය කියන්නෙ සංඛාරයක්. සංඛාර කියන්නේ ගොඩක්. ඒ කියන්නෙ පළවෙනි ආලෝකය පවා වේගයටයි 'ස්පාර්ක්' වෙනව වගේ පේන්නෙ. ආලෝකය පවා ස්පාර්ක් එකක නිර්මාණයක්. **ආලෝකයක් කියන්නෙ ස්පාර්ක් ගොඩක නිර්මාණයක්. ඒක ආලෝක හැඩතලයක්. වර්ණයක් එන් නෑනෙ. වර්ණය මෙහෙ හැදෙන එකක් නෙ. වර්ණ එළියෙ තියෙන එකක් නෙවෙයි.** ආලෝක හැඩතල වෙනස් වෙන්නෙ. හැඩතලයට,

වර්ණ මෙහෙන් හැදෙන එකක්. හැඩතලයක අඩු වැඩිවීමක්, අපට ආලෝකයෙන් හමුවෙනවා. හැඩතලවල හමුවීම,

**අර යෂ්ටි ශෛල කේතු ශෛල වල වර්ණ දාලා ගන්නවා, පාට දාල ගන්නවා. ඒකෙන් එන එක, අපි ඊට පස්සෙ කියනවා මේකය කියලා, ශබ්දයක් දාලා. ඔය වගේ නිර්මාණය තමයි ආයතනික කෘත්‍යය.** දැන් ආයතනයක් නම් මොකක් හරි නිර්මාණය කරන්න එපයි. එතකොට ආයතනය නිර්මාණය කරේ ඕක. අවසානයේ ආයතන නිර්මාණය කරේ පොතක්. පොත නිර්මාණය වුණේ ශබ්දයෙන්. ආවේ වර්ණ හැඩතලයක්. **වර්ණ හැඩතලයක වර්ණ තිබුණෙත් නෑ, වර්ණ මෙහෙ හදා ගත්තෙ.** හැඩතලයක් හරි, හැඩතලයක් කියන්නෙ ආලෝකය අඩු වැඩි වන ස්වභාවය. අර අඩු වැඩි වන අර හෙවනැලි වගේ කතාව. ආලෝකය අඩු වැඩි වන ස්වභාවයට, මෙතන යෂ්ටි සෛල කේතු සෛලවල චක්ඛු විඤ්ඤාණය මෙතන සකස් වෙන එකක්. **ඔය වර්ණ එකක් වත් එළියෙ නෑ, ඇත්ත කතාව. හිරු එළියට ප්‍රිස්මයක් ඇල්ලුවම වර්ණ 7ක් පේනව වගේ, අපේ චක්ඛු විඤ්ඤාණයේ 'නාභි' ගතවෙලා. මේ වර්ණ ටික මැවෙන එකක්. අපිට එළියෙ අත්දැකීමක් කවදාවත් නෑ.** ඇහැ පියාගෙන බලන්න. එළියෙ කොහොමද කළු පාටද?

**මෙහෙණින් වහන්ස :** මොකුත් නෑ.

**ආර්යයන් වහන්ස**: ඒ කියන්නෙ අපිට එළියෙ අත්දැකීමක් නෑ. ඒකයි අපි කියන්නෙ, අපිට කවදාවත් එළියෙ අත්දැකීමක් නෑ කියලා. ඒකයි කිව්වෙ **මේක සංඛාර ගොඩක් කියලා. සංඛාර කවදාවත් එළියෙ හම්බ වෙන්නෙ නෑ. අපිට එළිය ගැන අවබෝධයකුත් නෑ. අපි ඉන්නෙ** fantacy world **එකක, 'සිතුවිල්ලක ඉන්නෙ.' ඒ සිතුවිල්ලත් මෙතනම වර්ණ ගොඩක, මෙතනම හදා ගන්න ශබ්ද ගොඩක්.** 'කර්ණසංඛ පටලය' හෙල්ලෙන් නැත්තං ශබ්ද නෑනේ. ඒ කියන්නේ කන් බෙරේ හෙල්ලෙන එකනෙ, මේ ශබ්දය කියන්නෙ එතකොට කෙනෙක්ගේ කන් බෙරේ හීනි වෙන්න පුළුවන්. තුනී වෙන්න පුළුවන්. ඒ අනුව තමයි එයාගේ ලෝකෙ. සමහර අයට රතුපාට පේන්නෑ. සමහර අයට නිල්පාට පේන් නෑ. සමහර අයට ඒවා අඩුවෙන් වැඩියෙන් පේන්නෙ. ඒ අනුව තමයි ලෝකය. සමහර අයට රතු පාට විතරයි පේන්නෙ. එතකොට රතුපාට ලෝකයක්. එළියේ මොන්ටිසෝරි යන කොට පොඩි ළමයට පෙන්නුවොත් පුතේ මේ කහපාට

කියලා, ඒ හැඩතලයට එකම පාටින් ගොඩක් අඩු වැඩි වෙලා පෙනුණත් අර ශබ්දය අඩු වෙච්ච පාටට දානවා. එයාගෙ හුස්ම යනකං කවුරුත් දන්නෙ නෑ එයා පාට දැක්කෙ නෑ කියලා. එයා කහ කියනවා රතු කියනවා නිල් කියනවා වර්ණ හැඩතලවලට. හැබැයි එයාගෙ අභ්‍යන්තරයේ එන හැඩතලය කාටවත් පේන්නෙ නෑ. කාටවත් කියන්න බෑ. මොකද තව කෙනෙක් ඕක දකින්නෙ විඤ්ඤාණයකින්මයි. ඒකයි අපි කිව්වේ විද්‍යාඥයෙක් දුරේක්ෂයකින් එළිය බැලුවොත් එළියෙ තියෙන දෙයක් නෙවෙයි තමන්ගෙ විඤ්ඤාණයමයි දකින්නෙ කියලා.

අපේ බුදුන් වහන්සේ මහා විද්‍යාවක් එළියට දානවා. මේ විද්‍යාව තව අවුරුදු 10000ක් ගියත් වෙනස් වෙන්නැති පුදුමාකාර විද්‍යාවක්. මේකෙ ලොකු කතාවක් අපිට කියන්න තියෙනවා. අභිඤ්ඤා දේශනා වල අපි කියන්න උත්සාහ කරන්නෙ ඒකමයි. ඒක හරි දැවැන්ත කතාවක්. මේ මුළු ගැලැක්සිය එකට හැදෙන විදිහටම තමයි විඤ්ඤාණයත් හැදෙන්නෙ. කවුරුහරි බැහැර කරන්න පුළුවන්. මේවා සංකල්ප, සංඛාරා කියලා. ඔව්... එහෙම බැහැර කරන්න පුළුවන්. ඒත් පේනවනෙ, මේකෙ තියෙන්නෙ එකම කතාවක්. ඒ කියන්නෙ අන්වීක්ෂයකින් බැලුවත් ඉලෙක්ට්‍රෝන ප්‍රෝටෝන කැරකෙනවා. අර විශ්වයේ රූපයමයි ඇඳෙන්නෙ. න්‍යෂ්ටිය වටේ ඉලෙක්ට්‍රෝන ප්‍රෝටෝන කැරකෙනවා. මේ ගැලැක්සි එකේ රූපයමයි හැදෙන්නෙ. අන්වීක්ෂයකින් බැලුවත් පේන්නෙ ඒකමයි. ඒක තමයි කියන්නේ **නොගැළපෙන අන්ත දෙකක්. ඉලෙක්ට්‍රෝන, ප්‍රෝටෝන කැරකෙනවා කියන්නේ, අන්වීක්ෂයෙන් බලන පරමාණුව.** එතකොට ඒකම තමයි විඤ්ඤාණය කියන්නේ.

බුදුන් වහන්සේ දේශනා කරන්නෙ, 'යෝ උභන්තේ විදිත්වාන' සූත්‍රයේ තියෙන්නේ නොගැළපෙන අන්ත 2ක් අතර ශක්තියක් ඉපදීම. ඒක තමයි ගුරුත්වය හැදෙන්නෙ හේතුවත්. ධන ඍණ කියන පෘථිවියේ අන්ත 2ක් මේ කැරකෙන වේගයට හැදෙන, ගුරුත්වාකර්ෂණ බලය. **ඕකම තමයි විඤ්ඤාණ මායාව. එළියෙ අතන තියෙනවා, මෙතන තියෙනවා කියලා, අන්ත 2ක් කැරකෙනවා. එතකොට ශක්තියක් උපදිනවා. ඒක තමයි ආත්මීය ආරෝපණය.** ඒකම තමයි ස්නායු පද්ධතිය හරහා දුවන මි.වො. 5 කරන්ට් එක. මේක හරියට ජෙනරේට් වෙනව. හරියට ටර්බයින් එකක් වගේ, එකම සිස්ටම් එක. වික්ටෝරියා ඩෑම් එකේ විදුලිය හදන්නෙත්

ධන සෘණ කියල. චුම්භකයක් කරකවනවා. ඒකෙන් ගෙවල් වලට ධන සෘණ කියන ආරෝපණ 2. ඇවිල්ලා ෂෝට් කරපු ගමන් AC හදනවා. මෙතන අයිස් කැට හදනවා. මෙතන උණුසුම හදනවා. ආලෝකය හදනවා. පෘථිවියක් ම හදනවා. ඔය විද්‍යුතයෙන් පොඩි පෘථිවියක් හදල පෙන්නන්න පුළුවන්. ඔය ගත්ත ආරෝපණ දෙකෙන්. එකම කතාවක් මේ කියන්නෙ. මුළු විශ්වයේම තියෙන්නෙ ඕන.

අර විද්‍යාඥයෝ 'බිග් බෑන්' කියල පෙන්නුවේ, මේ බුදුන් වහන්සේ පෙන්නුව එකමයි. ඒ කියන්නෙ එක අංශුවක චලනයක් නිසා එන වේගයක් නිසා අන්ත දෙකක් හැදෙනවා. බුදුන් වහන්සේ මේක පෙන්නුවේ දිය සුළියකට උපමා කරලා. **දිය සුළියේ උපමාව තමයි විශ්වයේ නිර්මාණය. ආරම්භය. 'බිග් බෑන්' කියන්නෙ ඒක.** අපිට බුදු දහම පෙන්නන්න පුළුවන්. විද්‍යාඥයෝ මුකුත් හොයා ගත්තෙ නෑ කියලා පෙන්නන්න අපට පුළුවන්. අවුරුදු 2500කට කලින් මේ 'බුදු ඇසට' දැකපු එකමයි මේ විද්‍යාඥයෝ කියන්නෙ. 'බිග් බෑන්' කියන්නෙ බුදුන් වහන්සේගෙ තියරි එක. මොකක්ද? තියරි එක. දිය සුළියක උපමාව. නොගැළපෙන අන්ත දෙකක් අතර ගැටීමක් නිසා ඇතිවන වේගය නිසා දිය සුළියක් වගේ හැදෙන එක. මුළු විශ්වයේ ම කතාව ඕකමයි. විද්‍යාඥයෝ වෙන දෙයක් කියන්නෙ නෑ. තාම ඒකමයි කියන්නෙ. එක අංශුවක චලනය වීම, අන්ත 2ක් හැදීම. ඒ තුළ වේගයක් ඇතිවීම. අන්න ඒ තුළ පෘථිවියක් හැදීම. එච්චරයි. 'බිග් බෑන්' කියන්නෙ පිපිරීම. ඒක තුළ චලනයක්. අන්ත 2ක් වේගයක් තුළ කරකැවිල භ්‍රමණයක්. ඇත්තට වේදය තුළ තියෙන්නේ භ්‍රමණයට ලෝකෙ මැවෙනවා කියලනෙ. මහා බ්‍රහ්මයා ලෝකෙ මැව්වා කියලා.

මේ අය පුද්ගල සංඥාවකින් පොත් ලියාගෙන තිබ්බට, ඔහොම දෙයක් නෙවෙයිනෙ ඕකේ මූලයේ තියෙන්නෙ. මූලයේ තියෙන්නේ වේගයක්, භ්‍රමණයක්. භ්‍රමණය වන වේගය තුළ මේ පෘථිවිය තුළ මැවීමක්. ඇත්තටම මහා බ්‍රහ්මයා ලෝකය මැවුවා කියන්නෙ, වේගය තුළ පෘථිවිය නිර්මාණය වුණා කියන එකයි. මේ හැමදේම අපිට පැහැදිලි කරන්න පුළුවන්. විශේෂයෙන් ම ක්‍රිස්තියානි ආගම සම්පූර්ණයෙන් ම ඔය, ජේසුස් වහන්සේ කියන්නෙ කෙළින් ම මළවුන්ගේ ලෝකය ගැන. **මළවුන්ගේ ලෝකය කියන්නේ අතීත සංඥා වල ඉන්න එක, මළවුන්ගෙ**

**න් 'පරිවුට්ඨාන' වෙනවා කියන්නෙ. මේ විඤ්ඤාණ මායාවෙන් මිදිලා අර සිහියට අවදි වෙන එක. "සබ්බ පාපස්ස අකරණං-කුසලස්ස උපසම්පදා" කියන එක තමයි, මළවුන්ගෙන් පරිවුට්ඨාන වෙනවා කියන්නෙ. මළවුන්ගේ ලෝකය කියන්නෙ අතීත සංඥා.** අතීත සංඥා කියන්නෙ විඤ්ඤාණ මායාව. විඤ්ඤාණ මායාවෙ ඉන්නකං අපි අසරණයි. **'ධම්මං සරණං' කියන්නෙ, විඤ්ඤාණ මායාවෙන් මිදිලා ධර්මය දකින එක. ඕක තමයි මළවුන්ගෙන් පරිවුට්ඨාන වෙනවා කියන්නෙ.** බුදුන් වහන්සේ දේශනා කරපු ධර්මයම තමයි මේ ක්‍රිස්තියානි ආගමේ තියෙන්නෙ. මේකෙ මූලය කවුරුත් දන්නෙ නෑ. සත්‍ය අවබෝධ වුණාට පස්සෙ සියලු ආගම් අපට පෙන්නත හැකි, ඔය එකකවත් වෙන දෙයක් නෑ එකම දෙයයි තියෙන්නෙ කියලා.

**සියලුම තැන්වල මූලයට ගියොත් තියෙන්න එකම දෙයයි. එකම කතාවයි. ඒ සත්‍ය ධර්මයයි. ඒ සත්‍ය ධර්මය කිසිම ආගමකට අයිති එකක් නෙවෙයි.** නමුත් අපට අද මනා කොට පෙන්නන්න පුළුවන් ඒ බුද්ධ දේශිත ධර්මය. ඒ කියන්නෙ ගොඩක් ආගම් බිහිවෙන්නෙ ඊට පස්සෙ. බුදුන් වහන්සේ මේක හොඳට ගළපලා හොඳට විග්‍රහ කරලා සක්සුදක් සේ පෙන්නලා එළියට දෙනවා ස්වභාව දහක් කියන එක. ඒක ගොඩක් සමීපයි වේදයට. නමුත් එයාලගෙ දෘෂ්ටිය හිරවෙන තැනක් එනවා. ඒ එයාලා ආත්මය තියාගෙනයි ඒ ඔක්කොම කරන්නෙ. බුද්ධ කාලයට ගියාම අපිට අහන්න ලැබෙනවා එක එක මුනිවරු, ඍෂිවරු හිටිය නම් දාගෙන, බුද්ධ කියන නමට බුද්ධ ස්වභාවයේ කවුරුත් හිටියෙ නෑ. බුද්ධ කියන ස්වභාවයට හැමෝම උත්සාහ කරමින් හිටියා, ඔය ජෛන, මහාවීර කියල එක එක නම් තියෙන අය. බුද්ධ ස්වභාවයට කවුරුත බයේ හිටිය. මොකද බුද්ධ ස්වභාවය තමයි පරම **'නිශ්ඨාව'** වෙන්නේ කවදහරි. අන්න එතනට කවුරුත් නමක් දාල තිබුණෙ නෑ. අන්න එතනට තමයි, බුදුන් වහන්සේ මින් එහා දෙයක් නෑ කියලා.

බුදු ඇසට අසුවෙලා බුදුන් වහන්සේ, එයමයි 'බුද්ධ කියන' එක කියනවා. මේ සත්‍ය, 'බුද්ධ' බුද්ධ කියන්නේ කෙනෙක් නෙමෙයි. ඒකයි අර 'උපක' අහනව, "ස්වාමීනී ඔබ මනුෂ්‍යයෙක් ද? දෙවියෙක් ද, බ්‍රාහ්මයෙක් ද, ගන්ධබ්බයෙක් ද? ඔය නම් ලිස්ට් එකම එදා බුදු සමයෙ තියෙනවා. එතන දී බුදුන් වහන්සේ සත්ත්වයෙක් නෙවෙයි කියනවා. පුද්ගලයෙක්

නෙවෙයි කියල ඉවරයි. **'බුද්ධ කියන්නෙ' මේ ලෝක ස්වභාවය තුළ, එක ම ස්වභාවයයි.** ඒ 'බුද්ධ ස්වභාවය' පමණයි. අපි කතා කරන කිසිම තැනක ඉන් එහා නෑ. **පරම සත්‍යය නම්, බුද්ධ. ඒ 'බුද්ධ ස්වභාවය' කියන්නේ, ආත්මයක්, සත්වයෙක්, පුද්ගලයෙක් නෙවෙයි.** ආත්මයක්, සත්වයෙක්, පුද්ගලයෙක් කියාගෙන, මැටි රූප හදාගෙන බුද්ධ කියාගෙන, හැබැයි ඒක හොඳයි සම්මුතිය තුළ මොනවහරි කේන්ද්‍ර කර ගන්න. මේ පෘථග්ජන මනසේ ස්වභාවය බොළඳ ස්වභාවයක්. බොළඳ ස්වභාවයට ඒ තියුණු නුවණ නැති නිසා තමයි සෛද්ධාන්තිකව එවැනි සිද්ධාන්ත වල හිරවෙලා ඉන්නෙ. එතන තමයි අවිද්‍යාව තියෙන්නේ. ඒකයි මිථ්‍යා දෘෂ්ටියට හිරවෙලා ඉන්න හේතුව. නමුත් එතැනින් ගැලවුණේ නැත්නං, විවර කරේ නැත්තං **අසරණ මනුෂ්‍යාව එතැනින් එහාට ගන්න බෑ, පරම සත්‍යයට අවදි කරගන්න බෑ. ඒක නිසා තමයි අපිට මේ සත්‍යය නෙවෙයි කියලා පෙන්නන්න සිද්ධ වෙන්නෙ.**

බුදුන් වහන්සේ පිරිනිවන් පෑවට පස්සේ මිහිඳු මාහිමියන්ගෙ කාලෙ කතාවලත් අහන්න ලැබෙන්නෙ බුදු පිළිමයක් තිබ්බා කියල නෙවෙයි ගස් කොළං වලට මිනිස්සු වැන්ද කියලයි. ඒ නිසා තමයි සංඝමිත්තා තෙරණිය බෝධීන් වහන්සේ වැඩම කරවන්න හේතුව. බුදුන් වහන්සේ පිට දුන් වෘක්ෂය කියන තැනින් මිනිස්සු බුද්ධ ධර්මයට යොමු කර ගැනීමට බෝධීන් වහන්සේ කියල ගත්තම, ඇත්තටම මේ මිනිස්සු බුද්ධ ධර්මය කෙරෙහි යොමු කරන්න පුළුවන්. හොඳ කටයුත්තක් ඒ කරල තියෙන්නෙ. බුදු පිළිමයක් තිබුණෙ නෑ කියන එකයි, ඔය කතාවෙ ඊළඟ එක. ඉතිහාසය අපි කතා කරන්න ඕනි ධර්මය පැත්ත විතරයි. අපි ඒවා මතු කරල දෙනව විතරයි. අපිට කියන්න ඕනි වුණේ මෙතන මොකුත් නැති ස්වභාවයක්. අන්තවලට යන්න එපා කියන එකත්, නිදහස් මනසකට මේක හසුවෙනවා කියන එකත්. මේ කතාව මෙහෙණින් වහන්සේට කියන්න හේතු වෙන්නේ මෙතන පෙන්නන්නේ. දැන් වේගෙට මැවෙනවා කියන කොට, මෙහෙණින් වහන්සේ හිටපු තැන තමයි, මේ සිතුවිලි වේගය අඩුවෙනවා කියලා සිතුවිලි වේගයක් ගැන තමයි කතා කරේ. නමුත් අපි පෙන්නුවේ ඊට එහා ගිය, ප්‍රසාදයේ ම වේගයක් නිසයි කියන එක.

**මෙහෙණින් වහන්සේ:** එහෙමයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** එතකොට සියල්ල සමබර වෙනවා. ඒකයි "සංඛාර සංඛාරත්තාය සංඛතං අභිසංකරෝති" කියන්නෙ ලොකු කතාවක්. ගැඹුරින් ගැඹුරට ගියොත් තමයි ඒක පේන්නේ. පළමු ස්පාර්ක් එක පවා සංඛාරයක ඵලයක්. ඒ කියන්නේ පළවෙනි ස්පාර්ක් එක පවා, වේගයට තියෙනවා වගේ, දැනෙන එකක්. ඒකමයි එතකොට ශබ්දයක් තියෙනවා වගේ දැනෙන එකක් වෙලා, දෙක ම එකට අන්තිමට එකතු වෙන කොට ඒකත් දෙයක් වෙලා තියෙනවා වගේ දැනෙනවා. සම්පූර්ණ කතාවම " සංඥා අභිසංකරණයක්" තියෙන්නෙ. අවසානයට එන තැනින් තමයි අපි ගන්නෙ පොත, මේස, ඇඳන් කියන තැනින් එතැනිනුත් ඒක නවතින්නෙ නෑ. ඊට පස්සේ පොත කියල නවතින්නෙ නෑ. මනෝ විඤ්ඤාණයක කතාවක් ඇවිල්ලා මනෝ ද්වාරයක කතාවක් එන්න හේතුව ඒකයි. අපි මේවා හොඳට පැහැදිලි කරල තියෙනවා. සත්ත්වයෙක් පුද්ගලයෙක් නෑනෙ. ආත්ම කතාවක් නෑනේ මෙතැන. වේගයක් තුළ තියෙනවා වගේ දැනෙන එකක්නෙ මේ වෙන්නේ. ශබ්දෙත් එහෙමයි. වර්ණයත් එහෙමයි. වේගයක් තුළ තමයි සකස් වෙන්නෙ.

අපි මෙහෙම හිතමු. දැන් බිත්තිය දකින කොට චිත්තක්ෂණ කෝටි ගණනක් පහළ වෙනව කියන්නේ, තත්පරයකට කෝටි වාරයක් ස්පාර්ක් වෙනවා. මේ බිත්තිය තියෙනව වගේ පේන එක. එතකොට ඒ විදිහට ම තත්පරයකට කෝටි වාරයක් ශබ්දය ස්පාර්ක් වෙනවා. 'කර්ණ සංඛ පටලය' හෙල්ලෙන එක. ශබ්දය එනකොටම ඒකෙ ඔය වේගෙ තියෙනවා. එතකොට ඔය දෙක ම එකට ආවොත් මොකද වෙන්නෙ. **දැන් ඇහැට එන ආලෝක හැඩතලය, තත්පරයට කෝටි වාරයකින් ස්පාර්ක් වෙවී එනවා. ශබ්දයත් ඒ වගේ ස්පාර්ක් වෙවී එනවා. ඔය දෙක ම එකට එන එකයි 'චිත්තය' කියන්නෙ. තත්පරයට කෝටි වාරයක ස්පාර්ක් එකක්, ඉන්ද්‍රිය ගෝචර නෑ වෙන් කරල දකින්න. වෙන් කරල දැක්කොත් 'විභජනය' වෙනවා. 'විභජ්ජවාදය' වෙනවා.** වෙන් කරලා දකින්න බෑ. දකින්න බැරි නිසා මොකද වෙන්නෙ, අර ගොඩම එකට එකතු වෙලා එන එක තමයි 'සක්කාය' කියන්නෙ. එතකොට මේ දෙක ම එකට එන එක තමයි අර සංඛාර කියල කියන්නෙ. ආයෙමත් සකස් වෙනවා එකට එකතු වෙලා කියන එක තමයි මේකෙ තේරුම. මනෝ විඤ්ඤාණ කියන්නේ ශබ්ද, වර්ණ, ගන්ධ රස පහස සියල්ලම එකට එන එක. මනෝ විඤ්ඤාණය කියන්නේ මොළේ ඇතුළෙ තියෙන කතාවක්

නෙවෙයි. ශබ්ද, වර්ණ සේරම එකට එනවා වේගය නිසා. එකට එකතු වෙලා එනවා. එතකොට ඒක වෙන් කරන්න බෑ. **මේ පැත්තෙන් පිච්ච මල කියන කොට ඔය පැත්තට පිච්ච මල කියන රූපය එනවා, චිත්තය කියන්නෙ.**

ඇත්තටම අර බට මිටි දෙකේ ම එකතුවක්, ශබ්ද වර්ණ වෙන් කරන්න බෑ, චිත්තයක් කියන එකේ අපිට හීනෙන් පෙනෙන්නෙ. ඒකට සංඥාවක් කියන වචනය අපි භාවිත කරන්නෙ ඒකයි. **"මනසංච පටිච්ච ධම්මේසු- උප්පජ්ජති මනෝ විඤ්ඤාණං" කිව්වෙ, මනසට 'ධම්ම' අරමුණු වෙනවා කිව්වේ. අර දෙක ම එකට එනවා කියපු එකයි මනස කියන්නේ, වෙන එකක් නෙවෙයි. ඒකමයි මනෝ ද්වාරය, මනෝ විඤ්ඤාණය.** ඒකත් ඊට පස්සෙ දෙයක් වෙලා, ඒකත් නැවත ස්පාර්ක් වෙන ගොඩට එකතු වෙනවා. ද්වාරයක් විදිහට ඒක එනවා. වේගයක් තුළ මේක ඉවර වෙන්නෙ නෑ. ඒක අර විද්‍යුතය වගේ කන්වර්ට් වෙනවා. විද්‍යුතයෙන් ඕන වෙලාවක අපිට ලයිට් දාන්න පුළුවන්. AC දාන්න පුළුවන්. රස්නය ගන්න පුළුවන්. අර සල්ලි වගේ. අපි ඕක පෙන්නුවා. **"පටිඝ සම්පස්සයට" "අධිවචන සම්පස්සය" කියන්නේ. කතාවේ තියෙන ගැඹුර පෙන්නුවා, ඒ කියන්නෙ මේක බඹරෙ වගේ. දිගටම ස්පාර්ක් වෙනවා. ඒ කියන්නෙ හුස්ම වැටෙන්න පටන් ගත්ත මොහොතෙ ඉඳල හුස්ම නවතින මොහොත වෙනකම් දිගටම ස්පාර්ක් වෙනවා. නවතින්නෙ නෑ. දිගටම බඹරෙ කැරකෙනවා. දිගටම අර ගිනි වළල්ල කැරකෙනවා. ඒ කියන්නෙ අර ගිනි බෝලේ කොහෙද තියෙන්නෙ කියල හොයන්න බෑ.** දිගටම ඒක එනවා කොතනින්ද? ආවේ. පොත කියන එක දෙයක් වෙච්ච ගමන් ම, පොත කියන එක සංඥාවට බඹරේ ආපු ගමන් ම මොකද වෙන්නෙ එතන ඉඳල දිගටම පොත තියෙනවා. පොත ආයෙ කවදාවත් නැති වෙන්නෙ නෑ. ඇයි අර බඹරෙට, අරක එකතු වෙලා එනවා. අර බඹරේ උපමාව ඕක තමයි.

මේ මොහොතෙ අපි දෙයක් දකින කොට අර එදා දැකපු එක ද, ඊයෙ දැකපු එක ද හොයන්න බෑ. ඒකට හේතුව බඹරෙ වේගෙන් කැරකෙනවා. කැරකෙන කොට දැන් මොකක් හරි දකින කොට දැන් බඹරෙ තියෙනවා අර ඔක්කොම. ට්‍රිලියන් ගාණක දත්ත තියෙනවා. එතකොට මේ ඕන එකක් වදිනවා. ඒ කියන්නෙ මේක අවසානයක් තියෙන්නෙ ආරෝපණයක්

විදිහටයි. ඒ කියන්නෙ වික්ටෝරියා ඩෑම් එකේ වතුර දාන කොට චුම්භකය කැරකෙන කොට විද්‍යුතය හැදෙනවා. සාමාන්‍යයෙන් නිවසකට එන්නෙ විද්‍යුතය විදිහට. දැන් අපි මේ විද්‍යුතය නිවසට අරගෙන ලයිට් එක දානවා, AC එක දානවා. විද්‍යුතය භාවිත කරල ඕන දෙයක් හදන්න පුළුවන් නෙ. මේක දැන් අපි අර ශබ්ද, වර්ණ සේරම ආවට, අපිට එන්නෙ පොත මේසෙ ඇඳ කියන ඒවා එන්නෙ. එකට එකතු කරල දෙයක් කරගෙන නෙ ඉන්නෙ. දෙයක් කර ගත්තට පස්සෙ පොත මේසේ ඇඳ කියලනෙ ද්වාර වලින් එන්නෙ. ඒක ඊට පස්සේ, මනෝ ද්වාරයට එන කොට ඔක්කොම එකට, එනකොට සංඥාවක් විතරයි.

අපි දැන් ආයතන මට්ටම ගත්තොත් දැන් අපිට පේන්නෙ මේව එළියෙ තියෙනවා කියලනෙ මේවා. අපි එහෙමනෙ මේවා ගන්නෙ. අපි මෙහෙම ගමුකො. දැන් ප්‍රසාද වෙනවනෙ. **ශබ්ද වර්ණ, ගන්ධ රස පහස දැන් ප්‍රසාද, ඒ ප්‍රසාද මට්ටම ද්වාර මට්ටමක්නෙ. මනෝ විඤ්ඤාණයෙන් මේක හඳුනා ගන්නෙ පොත මේසේ ඇඳ කියලනෙ. පොත් මේස ඇඳ, ඉර කියන්නේ ලෝක සංඥානෙ.** පුංචි දරුව ඉපදෙන කොට දන්නෙ නෑනෙ, මේක ඇමරිකාව ද, එංගලන්තෙ ද, බුද්ධාගමේ ද, දිව්‍යලෝකයක් තියෙනවද? නිරයක් තියෙනව ද? කියලා. **පුංචි දරුවා මුකුත් දන්නේ නෑනේ, ප්‍රභාස්වරං චිත්තංනෙ.** ඊට පස්සේ මේ සේරම දේවල් බවට පත්වෙනවනෙ. වර්ණත් නෙවේ, ශබ්දත් නෙවේ, පුටු, පොත, මේස කියලා චූන් එකක් එනවනෙ. අර උද්දීපනයක් එනවනේ. "අභිනන්දති අභිවදති අජ්ඣෝසාය. තිට්ඨති යාරූපේ නන්දි - තදූපාධානං භවෝ" කියන කොට, මෙතන ඛජ්ජනීය වග්ගයට එනකොට එනවා "රුප්පන්තිකෝ ආයුසෝ රූපං වදේති" නැවත නැවත නැවත **රුප්පනය නිසා රූපයක් බවට පත් වෙනවා. දෙයක් බවට පත් වෙනවා. ඊට පස්සේ ඒක මනෝ ද්වාරය තුළ දේවල් තමයි තියෙන්නෙ. මනෝ ද්වාරයේ තියෙන්නෙ ශබ්ද වර්ණ කියල නෙවෙයි. මනෝ ද්වාරයේ තියෙනවා ඉර, හඳ, පොත, මේසේ, ගහ, කොළ, කියලා. දැන් මේක චිත්‍රපටියක කතාවක් වගේ.** ඒ කියන්නේ මේකෙ පොත් මේසේ ඇඳ කියන ඒවා තමයි ස්පාර්ක් වෙන්නෙ.

බලනකොටම අපිට පේන්නෙ බිත්තියක් නෙ. **අපට මේ හතර මහ භූත පේන්නෙ නෑ නේ. ශබ්ද, වර්ණ කියල පේන්නෙත් නෑ නේ. පේන්නෙම බිත්තියක්නෙ.** අනික් පැත්ත බලන කොට පේන්නෙ ජනේලයක්නෙ. මේ

ඔක්කොම, නම් නෙ පේන්නෙ. ශබ්දෙත් වර්ණෙත් එක්ක එකතු වෙච්ච දෙයක් වගේ දැනෙන ගතියක්නෙ එන්නෙ. ඒක ඇතුළෙ ලෝකයක් තියෙන බවට ආරෝපණයක් තියෙනව නේ. අපි තණ්හාව කියන්නෙ. රාග, ද්වේශ, මෝහ කෙළෙස් කියන්නෙ. මේකෙ තියෙනව චිත්තාරෝපණයක්. මේ චිත්තාරෝපණය කියන්නෙ අර බලාගාරෙන් ගත්ත කරන්ට එක වගේ කියලයි මේ කියන්නෙ. අපි කිව්වෙ පොඩි දරුවට ස්පාර්ක් වෙන්නෙ 5000 යි. තාත්තට 11000 කිව්වෙ. ඒ කියන්නේ **ගිනි බෝලේ ගිනි වළල්ල වගේ කැරකෙන කොට, අපි ඇසුරු කරන්නෙ ගිනි වළල්ල. ගිනි බෝලේ ඇසුරු කරන්නෙ නෑ.** වටපිට බලන කොට අපිට පේන්නේ පොත් තියෙන, අඹ ගස් තියෙන, නා ගස් තියෙන, දිව්‍ය තියෙන නිරයක් තියෙන තිරිසන් අපායක් තියෙන අර භව සංඛාර ඔක්කොම එකතු කර ගත්ත එකක්. එකතු කරගෙන **'භවරාමා' කියන තැනක ඉන්නෙ.** අපි එතැනින් නේද මත්වෙලා ඉන්නෙ. ඒක ඇතුළෙ හැදිලා තියෙනවා නේද අර තණ්හාව, ඊර්ෂ්‍යාව, වෛරය, අර පුංචි දරුවට තිබුණෙ නෑ නෙ ප්‍රභාස්වර සිතේ නෑ.

දැන් මොකද වෙලා තියෙන්නෙ. දැන් ඒවා තියෙන්නෙ. දැන් අර අන්ත දෙක දිගටම දෙනව. එක එක විදිහට හද හදා, තව තව වැඩිකර දෙනවා. එක්කො ඇලෙනවා, එක්කො ගැටෙනවා. හැම පැත්තෙන්ම දෙනවා. දැන් ඔක්කොම ආරෝපණයක් විදිහට ඒ කියන්නෙ තණ්හාව දැන් අපිට ඉතිරි වෙලා තියෙන්නෙ. අර කියනවනේ "තණ්හාව නැමැති වඩුව" - "මා තා දුටිමි." "තට නිවස සෑදීමට නැවත මා ඉඩ නොදෙමි." **අවසානයේ අපේ හුස්ම යන කොට මොකද වෙන්නෙ. මෙන්න මේ ආරෝපණය අපි කිව්වෙ අර සිරස වගේ, ටීවී එක කැඩෙනවා. ඒරියල් එක නිසා බලපු ෆිල්ම් එක තමයි, අපි මේ බලාගෙන ඉන්න කතාව. මේ ඉර හඳ තියෙන, වටේ ඉන්න අය ඔක්කොම ඉන්න චිත්‍රපටිය.** උදේට ඉර පායනවා බහිනවා වගේ දැන් චිත්‍රපටිය දුවනව නේ. දැන් දුවන්නෙ ඒරියල් එක තියෙන හින්දා. **ඒරියල් එක තිබ්බත් වැඩක් නෑ. ටීවී එකක් තියෙන ඕනි බලන්න. ටීවී එක තමයි අපේ කය. මේක උපමාවක්. ඒරියල් එක තමයි දැන් ආයතන හය.** අවසානයේ අපි බලන්නෙ චිත්‍රපටිය. දැන් චිත්‍රපටිය තුළ මොකද වෙලා තියෙන්නෙ, දැන් අපි තුළ යම්කිසි ප්‍රමාණයකින් තියෙන තණ්හාව තව තව වැඩිවෙනවනෙ. සංඥා අභිසංකරණයකට එක් වෙනවනේ. දැන් මේ තණ්හාව කියන්නෙ ආරෝපණ බලයනෙ, ඇලෙන

ගැටෙන බවනෙ. දෙයක් වෙලා නවතින්නෙ නෑ නෙ. ඒ දේත් අපිට ඕනි වෙනවනෙ. අපි බන්ධන බලයකට කොටු වෙනවනේ. ඒකනේ හන්දියක් පෙන්නන්නෙ මෙතන.

ඒ කියන්නේ "යාරෑපේ නන්දි" කියල කිව්වේ, ඒ කියන්නේ "භව රාමා" කියන එත. ඒ කියන්නේ "තධූපාධානං භවෝ" කියන එක ආවනේ. භව කියන්නෙ, අපි දෙයක් කර ගත්ත කියන එකමනෙ. ඒ තුළනෙ මේ රාග ද්වේෂ මෝහනෙ. ධන ඍණ කියන විද්‍යුතය තියෙනවනෙ නෙගටිව් පොසිටිව් කියලා. ධන ඍණ අන්ත දෙකේ බලය වැඩි වන එකනෙ මේ විද්‍යුතය කියන්නෙ. ඒ වගේ අපේ මේ තණ්හාව අඩු වැඩි වෙනවා. අපි මේ නිවන් දකින කොට ධර්මය දකින කොට වෙන්නෙ, දේවල් නැති බව දකින කොට වෙන්නේ, කරන්ට් එක අඩු වෙනවා, ආරෝපණය අඩු වෙනවා. හැබැයි දේවල් තියෙන බව දැනෙන්න දැනෙන්න ඒවා තව අල්ල ගන්න අල්ල ගන්න "උපාධානය" කියල පෙන්නන්නෙ ඒකයි, රාග ද්වේෂ මෝහ වැඩි වෙනවා. පින කියන්නේ මේක අඩුවෙන කොට සිත පිරිසිදු වෙනවා, මේ රාග, ද්වේෂ, මෝහ තුනී වෙන එක තමයි ඇත්තටම පින කියන්නෙ. **බුදුන් වහන්සේ කියන්නෙ ඒක තමයි, ධර්මයක් දේශනා කරනව නම්, ඒක ආර්ය විනයට ගැළපෙන්න ඕන කියන්නෙ, රාග, ද්වේෂ, මෝහ වැඩිවෙන්න බෑ, ඒක තුනී වෙන්න ඕනි. රාග, ද්වේෂ, මෝහ තුනී වන 'ක්ෂීණාශ්‍රව' රහතන් වහන්සේ ගිය මග යන්න ඕනි. ඒකයි නිවන් මග.**

ඝන සංඥා කියන්නේ රාග, ද්වේෂ, මෝහ වැඩි වෙලා එන තීව්‍රතාව ඝනයි. තීව්‍රතාව අඩුවෙන කොට සුකුම ලෝක පෙන්නනවා, බුදුන් වහන්සේ රාග, ද්වේෂ, මෝහ අඩු නම් 'සුකුම ලෝක' රාග, ද්වේෂ, මෝහ වැඩි නම් දුගතිය පෙන්නනවා ඝනයි කියලා. පහළ ලෝකවල උපදින්න තියෙන බලය වැඩියි. අපේ මේ කතාවෙ ටීවී එක කියන්නෙ අපේ ශරීරය. ඒරියල් එක කියන්නෙ ආයතන ටික. ඒකෙ ෆිල්ම් එක තමයි දැන් මේ යන ෆිල්ම් එක. **දැන් මොකද වෙන්නෙ ටීවී එක කැඩෙනවා, ශරීරයේ හුස්ම යනවා. හුස්ම යනවා කියන්නෙ, ඒරියල් එක වැඩ කරන්නෙ නෑ. ආයතන ටික ඉවරයි. එතකොට මොකද වෙන්නෙ අර සිරස වගේ තරංගය තියෙනවනෙ, තවත් ටීවී එකක අහුවෙනවා.** දැන් තේරෙනවද? ඒකයි කිව්වේ "මානීය මක්කටෝ- අති මානීය කුක්කුරෝ" **ගති නිමිති,**

**කම්ම නිමිති කියන්නේ, ලෝකයක් තියෙනව කියල කියන්නේ, සංඥාව තියෙනකං උප්පත්තියක් තියෙනවා. ලෝක සංඥාවෙන් මිදෙන තැනැයි මෙතන "භව නිරෝධයට" එන තැන.** මේ මොහොතෙම හැබැයි භව නිරෝධය දකිනවා. **මේ ධර්මය දකින කෙනා, මේ මොහොතෙම නිවන් දකිනවා. මේ මොහොතෙම අර බැටිරියේ කරන්ට් නෙගටිව්, පොසිටිව් එක බහිනවා. මේ ස්වයංව රිචාජ් වෙනවා.**

දැන් අපි වාහනයක තියෙන බැටිරිය, වාහනෙ රෝද කැරකෙන කොට බැටිරියක් එවෙලෙම චාජ් වෙවී තමයි යන්නෙ. ඒ වගේ තමයි අපේ තියෙන රාග, ද්වේෂ, මෝහ මේ මොහොතෙම චාර්ජ් වෙනවා. හැම ක්ෂණයක් ක්ෂණයක් පාසා 'රිචාර්ජ්' වෙවී යන්නෙ. අනුසෝතය තුළ තමයි වාහනය දුවන්නෙ. රෝද කැරකෙන කොට බැටරිය චාර්ජ් වෙන හින්දා. රෝද කැරකෙන කොට බැටරිය චාජ් වෙනව ව ගේ, වටපිට බලන කොට හැම එකම දකින කොට ඇහෙන කොට, තණ්හාව චාර්ජ් වෙවී තියෙන්නෙ. අනුසෝතය තුළ ඕක චාර්ජ් වෙවී යනවා දිගටම. පටිසෝතය තුළ වෙන්නෙ මොකක් ද? දෙයක් නැති බව අපිට අවබෝධ වෙනවා. මේ ලෝක සංඥා බිඳ වැටෙනවා. ලෝක සංඥා බිඳ වැටෙන කොට අර බැටිරිය චාර්ජ් වෙන එක වගේ, මෙතන තණ්හාව 'සිස්ටමැටිකලි' රාග, ද්වේෂ, මෝහ 'ඔටෝ චාර්ජ්' වෙන එක නවතිනවා, තියෙන බැටිරිය බහින්න ගන්නවා ටික ටික. එතකොට වාහනයේ බැටිරිය චාර්ජ් වුණේ නැත්නං කියනවා මේ බැටිරිය දුර්වලයි. දැන් ඒකෙන් වැඩක් නෑ. **අන්න ඒ වගේ හැම මොහොතෙම අපේ තියෙන තණ්හාව නමැති ආශාව නැමැති රාග, ද්වේෂ, මෝහ නමැති චිත්තාරෝපණය දියවේගෙන යනවා.** ධර්මයේ සත්‍ය දකින කෙනාට, පටිසෝතය තුළ ඒක සිද්ධ වෙනවා.

එතකොට **මේ මොහොතෙ උපාදාන වෙන්නෙ නෑ කියන්නෙ බැටිරිය චාර්ජ් වෙන්නෙ නෑ. කලින් ආපු ආරෝපණය තියෙනවා. 'උපදිගොඩ' තියෙනවා. ඒක නැතිවෙලා නෙවෙයි. බැටිරිය අලුතෙන් චාර්ජ් වෙන්නෙ නෑ. එතකොට චාර්ජ් එක නැති නිසා ටික ටික බැටිරිය බහින්න ගන්නවා.** අන්න ඒක තමයි කියන්නෙ මේ මාර්ගයේ යන කෙනාගේ 'නිබ්බදන්නි, විරාගන්ති, නිරෝධන්ති, පටිනිස්සග්ගානුපස්සි' කිව්වෙ ටික ටික බැටිරිය බැහැගෙන යනවා. ඒ කිව්වෙ ක්ෂීණාශ්‍රව රහතන් වහන්සේ, ඒ කිව්වෙ සංඛාර ධර්මයෝ, සංඛත ධර්මයෝ, ක්‍ෂය ධම්මා, වයධම්මා කියල

කිව්වෙ. ක්‍ෂය ධම්මා වය ධම්මා කියලා කිව්වෙ ක්‍ෂය වී ගෙන යනවා, වැය වී ගෙන යනවා. **ඒ කියන්නෙ චිත්තාරෝපණය ක්‍ෂය වී ගෙන යනවා වැය වී ගෙන යනවා.** ඒ කියන්නෙ රාග, ද්වේෂ, මෝහ ටික ටික දියවී ගෙන යනවා. උපාදානය වෙන්නෑ කිසිම දෙයක්, ලෝකෙ තියෙන බවට ගන්නෙ නෑ. තියෙන බවට ගන්න කල්ම අර නැති දෙයක් තියෙන බවට අන්ත දෙකකට ගිහිල්ලා, තණ්හාව වැඩිවෙලා මේක සම්පූර්ණයෙන් ම අර චිත්‍රපටිය දුවන එකට තව තව බලගැන්වෙනවා. අර ලෝක සංඥා තියෙනකං තව තව උපදිනවා කියලා කියන්න හේතුව තමයි මේ ආරෝපණය.

අර මෙතන කතා කරන එක ඔතෙන්ට එන්නෙ තරංගයෙන් කියනව වගේ අංශු කම්පනයක් මේකෙ තියෙන්නෙ. ඔය ආරෝපණය බලය ඔක්කොම අංශු කම්පන ස්වභාවයක්. ඕක ධාතු මනසිකාරය විදිහට කිව්වොත් අංශු කම්පන ස්වභාවයක්. එතකොට චංචල කම්පන ස්වභාවය තමයි 'අබොජ්පා චේතෝ විමුක්තිය' කියල කියන්නෙ අකම්පිත ස්වභාවයක් බවට පත්වෙනවා. කම්පනය වෙනකම් අංශු කම්පන ස්වභාවය තියෙනකම්ම චිත්තාරෝපණය කියන එක තියෙනවා. ඒ අංශු කම්පන ස්වභාවය දියවීගෙන යන කොට ම, ඒකයි කිව්වෙ ඝන සංඥා සුකුම වෙනව කියන්නෙ අකම්පිත ස්වභාවය. රාග, ද්වේෂ, මෝහ තුනී වී ගෙන යනවා. ඕක වෙනම පර්යායක්. එක ම ධර්මය ආකාර කිහිපයකට පැහැදිලි කරනවා විතරයි. මේකෙ වෙන්නෙ එකම දෙයයි. රාග, ද්වේෂ, මෝහ තුනී වෙන එකයි. ඒකම තමයි අංශු කම්පනය දියවෙනවා කියන්නෙ. ඒකම තමයි චිත්තාරෝපණය දිය වෙනව කිව්වෙ. ඒකම තමයි ඝන සංඥා සුකුම වෙනවා කියන්නෙ. ඒකට තමයි අකම්පිත ස්වභාවය. "අබොජ්පා චේතෝ විමුක්තිය" කිව්වෙ. ඒකයි මේක අනිමිත්තයි, ශූන්‍යතයි, අප්‍රාණිතයි චේතෝ විමුක්තිය කියල කියන්නෙත් මේකමයි.

අර කම්ම නිමිති, ගති නිමිති කියන්නෙ, ලෝක සංඥා තියෙන නිසයි. ලෝක සංඥා තිබුණොත්, මේ හුස්ම යනකොට දැන් මේ මොහොතෙත්, හැම මොහොතෙම හුස්ම ඇති වෙනව, නැති වෙනවනෙ. **හැම මොහොතෙම සිතක් ඇති වෙනවා නැති වෙනවනෙ. එක් ක්ෂණික සිතක උදය වැය දකින්නාට සම්මුති මරණය හමු නොවේ කියන්න හේතුව**

**තමයි මේ හැම මොහොතෙම නිමිත්තක් සකස් වෙවීනෙ තියෙන්නෙ. ඒ නිමිති සකස් වෙන් නෑ නෙ. ධර්මය අවබෝධ වෙනකොට. අනිමිත්ත වෙනවනෙ. නිමිති බලගැන්වෙන්නෙ නෑ. නිමිති නැතුව නෙවෙයි. පොත මේසය තියෙනවා. ඒවා බලගැන්වෙන්නෙ නෑ. අභිසංකරණයකට ලක් වෙන්නෙනෑ. ඒක ප්‍රකට වෙන්නෑ. අනිමිත්ත වෙනව.** අන්න ඒ නිමිති බලගැන්වෙන් නැති ස්වභාවය මේ මොහොතෙ අත් දකින කෙනෙක් මේ මොහොතෙත් ඒ ස්වභාවයට පත් වෙන්න ඕනි. මේ ධර්මය අහන මොහොතෙත් එයාට මේ අවබෝධය ඇතිවන්න ඕනි. මෙතන දෙයක් නැති බව. ලෝකයක් නැති බවට තියෙන අවබෝධය. මෙතන ශබ්ද, වර්ණ ගොඩක්, මෙතන පොත් මේස ඇඳන් දෙයක් නැති බවට තියන අවබෝධය.

බාහිර පොත් මේස ඇඳන් තියෙනකම් එයා සෝතාපන්න වෙන්නෙ නෑ. සෝතාපන්න කියන්නෙ පටිසෝතයට එන එක. පටිසෝතය කියන්නෙ ලෝක සංඥා 'විනෙය්‍ය ලෝකේ' කියන තැනට එනවා. විනෙය්‍ය ලෝකේ අභිජ්ජා දෝමනස්සානං කියන තැනට එනවා. ඒ කියන්නෙ දුක දෝමනස්ස නැතිවෙන්නෙ, සත්ත්වයා දුකින් මිදෙන්නෙ ලෝකයක් නැති බව දැක්කොත් විතරයි. එතකං කවදාවත් දුකින් මිදෙන්නෙ නෑ. බාහිර දෙයක් තියාගෙන කොච්චර අනිත්‍ය දකිනවා කිව්වත් කිසිම කෙනෙකුට නිවනක් හමුවෙලා නෑ. මිථ්‍යා දෘෂ්ටිය කියන්නෙ ලෝකෙ ඇත්ත කර ගත්ත තැන, සම්මා දිට්ඨිය කියන්නේ මේකෙ සත්‍ය දකින තැන. ඒ කියන්නේ ලෝක සංඥා වලින් මිදෙනවා. ලෝක සංඥාවෙන් මිදුණොත් ලෝකෙම සංඥාවක්නෑ බැස ගන්න. හට ගන්න සෑම සිතකම සංඥා සුකුම වී ගෙන යන තැන ලෝක සංඥා වලින් මිදුණ තැන අන්න ඒකයි කිව්වෙ පටිසෝතය කියලා. අනුසෝතය කියන්නෙ බාහිර ඇත්ත කරගෙන බාහිර දේවල් තියෙනව කියල ගත්තු තැන. පටිසෝතය කියන්නෙ එහෙම දෙයක් නෑ. මේක චිත්තයක් කියල ගත්තු තැන. නමුත් සිතෙත් දෙයක් නෑ කියන්නෙ අනාගාමි. සිතේ දෙයක් තියෙනකං නැවත සකස් වෙනවා. **හැබැයි අනාගාමි කියන්නෙ නැවත උපදින්නෙ නෑ. මොකද පොත් මේස ඇඳන් කියල දෙයක් සිතෙත් නෑ. බාහිරත් නෑ. කොහෙවත් නැති බවට අවබෝධයි. සෝතාපන්නයි කියන්නෙ බාහිර දෙයක් නැති බව දැකලා**

**මිදෙන තැන.** අනාගාමී කියන්නෙ සිතෙත් එහෙම දෙයක් නෑ කියල මිදෙන තැන.

මේ හැම දේශනාම ගොඩක් වැදගත්. සෝතාපන්න වෙන්නෙ කොහොමද තමන්ටම සාන්දිට්ඨිකයි. අනාගාමී වෙන්නෙ කොහොමද? තමන්ටම සාන්දිට්ඨිකයි. එතකොට තමන්ට මේ ලෝක සංඥා තියෙනකං තමන් දන්නව සෝතාපන්න වෙලා නෑ කියලා. සිත ඇතුළෙ මේ සංඥා තියෙනකම් තමන් දන්නව, තමන් අනාගාමී වෙලත් නෑ. හැබැයි මේ දෙපැත්තෙන් ම මිදෙන කොට තමන්ට දැනෙනවා පුදුම සුකුම ස්වභාවයක්. ඒ සුකුම ස්වභාවය තුළ 'න අගාමී'. නැවත උප්පත්තියක් නෑ. අන්න ඒකයි මේ ධර්මය ශ්‍රවණය කරල අපිට කතා කරන අයට අපි කියන්නෙ ඔබට නැවත උප්පත්තියක් නෑ කියලා. අපි ඵල ගැන කතා කරන්නෙ නෑ. අපි මේ ධර්මය දකින්නෙ, ධර්මය තුළ ලෝක සංඥා එයාට තියෙනවද කියල බලන්නෙ, ලෝක සංඥා වලින් මිදිල ද කියල අපි බලන්නෙ, සිත ඇතුළෙ ලෝකෙක මෙයා ඉන්නව ද සිත ඇතුළෙනුත් මෙයා මිදිල ද ඔය ලෝක දෙකෙන් ම මිදුණ කෙනෙකුට විතරයි අපි එහෙම කියන්නෙ.

මේ දහම අපි කියන්නෙ මනා අවබෝධයකින්. ඒ කියන්නෙ ගෞතම බුදුන් වහන්සෙ අද වැඩ සිටිය නම් සැරියුත් හිමියන්ට කිව්වා වගේ කියනවා, එසේය, එසේය. **බුද්ධෝත්පාද ආර්යයන් වහන්ස මේ දෙසුම මහා විශිෂ්ටයි කියල කියනවා. ඒ කියන්නෙ ශබ්ද වර්ණ කියල කඩපු ගමන් ම ඇත්තටම කිව්වොත් ලෝක සංඥා දෙකෙන් ම මිදිලා ගිහිල්ලා නිවනටමයි එන්නෙ.** ශබ්ද වර්ණ කියල මේ ධර්මයට ගන්න හේතුව තමයි, මේක කිසිම පොතක නැතත් අපිට වැඩක් නෑ. අපි දන්නවා බුදුන් වහන්සේ මේක දේශනා කරපු බව. "බාහිය සූත්‍රයට" ගිහාම "දිට්ඨේ දිට්ඨ මත්තං" "සුතේ සුත මත්තං" කිව්වම **"දිට්ඨි සුත" එකතු වුණාම ලෝකයක් හැදෙනවා. ඒක තමයි බුදුන් වහන්සේ "බාහිය" තාපස තුමාට කියපු කෙටිම ධර්මය. ඊටත් වැඩිය කෙටි දහමක් අපි කියනවා.** ගෞතම බුදුන් වහන්සේ අභිබවා යනවා කියන කතාවක් අපි ගාව නෑ. මේ බුද්ධ ස්වභාවය තුළ අභිබවා යාමක් කවදාවත් සිද්ධ වෙන්නේ නෑ. බුද්ධ ස්වභාවය තුළ දෙයක් නෑ. ඒකට හේතුව ධර්මය නම් ධර්මයයි. ධර්මය

විග්‍රහ කරන දක්ෂතාවත් ඒ ගැඹුරත් ඒ නුවණත් විතරයි තියෙන්නෙ. බුද්ධ ස්වභාවයට බුද්ධ ස්වභාවය පමණයි. මේ දහම තුළ ඔබයි මායි දෙන්නෙක් නෑ කියල ඔබ මේ දහම අවබෝධ කළොත් සමානයි. වචන අපි භාවිත කරනවා සම්මුතිය තුළ මේක පෙන්නල දෙන්න ඕනි නිසා, ශ්‍රාවක, සම්මා සම්බුද්ධ කියලා ස්ථාන ගත කරන්න ඕනි නිසා. නමුත් මේ ස්වභාවය එකමයි.

**මෙහෙණින් වහන්සඃ** එහෙමයි, ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සඃ ඒ උත්තරීතරත්වයයි. "ක්ෂීණාජාති උසිතං නා පරං ගච්ජන්ති"** කියන තැනයි. අපි කිසිම විචිකිච්ඡාවක් සැකයක් නැතුව මහා සිංහනාදයක් කරනවා ඉන්ද්‍රඛීලයක් වගේ, ඒක හැම පැත්තෙන් ම අපට ප්‍රත්‍යක්ෂයි. ඒ සත්‍යය ධර්මය තුළ අනාගාමි ද නැද්ද කියන එක තමාට ම සාන්දිට්ඨිකයි. තමන්ටම සාන්දිට්ඨිකයි සෝතාපන්න ස්වභාවය. ඒ ස්වභාවයත් විහරණ ස්වභාවයත් ඒ තුළ මග යන කොට ඇතිවන විහරණ ස්වභාවයත්, ඒ තුළ අවසානයේ තිබෙන සමාපත්ති ස්වභාවය තුළ අපි සත්‍ය හෙළි කරන කොට යමෙක් දුරකතනයෙන් හරි තමන්ගෙ ප්‍රත්‍යක්ෂතාව හෙළි කරන කොට අපි බලනව මොහු කොතනද ධර්මය තුළ රැඳී සිටින්නෙ. මොහු බාහිර සංඥා වලින් මිදිල ද දෙයක් වගේ ඉත්තත්වයක් තුළ ආත්ම දෘෂ්ටියක හිරවෙලා ඉන්නවද සිතින් මිදිල ද කියල අපි විමර්ශනය කරනවා සොයා බලනවා, ඔහුගේ අභ්‍යන්තරයෙන් විතක්ක ස්වභාවය අනුව. **ඒකයි "විතක්ක සංඥා සමුදය චරන්ති" ඒ කිව්වෙ. ඒ කියන්නෙ "ප්‍රපංච සංඥා සංඛා සමුදය චරන්ති" කියන එකයි.** "සංඥා සංඛා සමුදය චරන්ති" කියන්නෙ ලොකු කතාවක්. **මේ තියෙන්නෙ නිවනට තියෙන කතාවක්. ඒ තව කෙනෙක්ගෙ ස්වභාවය. ඒ අනුව දැකල කියන්න පුළුවන් ස්වභාවයක්. ඒක තමයි පරචිත්ත විජානන ඥානය කියන්නෙ.** අපි මේ ඥාන ගොඩක් පෙන්නල තියෙනවා. තිවිද්‍යා පුබ්බේ නිවාසානුස්සති ඥානය, චුතූපපාත ඥානය, ආසවක්ඛය ඥානය වගේ, බුදුන් වහන්සේ දේශනා කළ බුද්ධ දේශනා සියල්ල ම අභිඥා ඥානයට හසුවන ඒ පරම සත්‍යය ලෝකෙට හෙළි කරල තියෙනවා.

අවුරුදු 2500ක් ගිය තැන මෙයයි සත්‍යය. ඔබ අත්හදා බලන්න. ඔබටම ප්‍රත්‍යක්ෂ වේවි කියලා. සක් සුදක් සේ සම්පූර්ණයෙන් ම සුද්ධ කරලයි මේ කියන්නේ. මේකෙ ආය මොකුත් ඉතුරු වෙලා නෑ.

**"සෝපදිසේස නිබ්බාණ" කියන්නේ, ආයතනවල නිරෝධය දැකල මිදුණයි කියන්නේ රහතන් වහන්සේ නමක් මරන්න බෑ, මැරිලා ඉවරයි. "සලායතන නිරෝධෝ නිබ්බාණෝ" එයමයි. "භව නිරෝධෝ නිබ්බාණෝ" කියන්නෙ. එයමයි තණ්හක්ඛයෝ කියන්නෙ. ක්ෂිණාස්‍රව රහතන් වහන්සේ ගිය මග.** අද දේශනයෙන් විශාල පර්යායක් එළියට එනවා. මෙහෙණින් වහන්සේලාට විතරක් නෙවෙයි මුළු සමාජයටම වටිනවා. ඒ බුද්ධ ස්වභාවයට අවදි වෙලයි, අනුගතවයි ඒ ප්‍රකාශය කරන්නෙ. ආර්ය භූමියේ එල නෑ. පෘථග්ජන භූමියට එල අවශ්‍ය වුණාට, ආර්ය භූමියට එල අවශ්‍ය නෑ, ක්ෂීණාස්‍රව ස්වභාවයයි. ඒ ක්ෂීණාස්‍රව ස්වභාවයට මගපෙන්වීමක් විතරයි ආර්ය භූමියේ සිදුවෙන්නෙ. **"අරියානං දස්සාවි - අරිය ධම්මේසු කෝවිදෝ - අරිය ධම්මෝ විනයෝ" කියන තැන තියෙන්නෙ ඒ දක්ෂතාව. අන්න ඒ විනය, ආර්යය විනයයි. ආර්යය විනය තුළ දෙයක් හමුවෙන්නෙ නෑ.**

**මෙහෙණින් වහන්සේ :** එහෙමයි ආර්යයන් වහන්ස. නමස්කාර වේවා!

# 03

# සසර වඩන්නකු නොව, ආර්යය භූමිය ස්පර්ශ කර සසර මිදෙන්නකු වන්න

**උපාසිකාව:** මට දැනගන්න ඕනි ආර්යයන් වහන්ස හැම තිස්සෙම නෙමෙයි බොහෝ වෙලාවට කෙනෙක් තව කෙනෙක් දිහා බලාගෙන ඉන්න විදිහට උදාහරණයකින් කියනව නම් මම, මම දිහාම බලාගෙන ඉන්න විදිහ ඒ කිව්වේ මම කරන දේ මටම, තව කෙනෙක් කරනව වගේ පෙනෙන අවස්ථාවල් තියෙනවා. ඔබ වහන්සේගේ බණකින් මට තේරුණා ඒක ක්‍රියා සිතක් කියලා. එහෙම අවස්ථා එනකොට ඒ සිතට දැනෙන්නෙ අර ලොකු කලබලයක් මොකුත් නෑ. ඒක වෙනස් කරන්න ලොකු බලයකුත් නෑ වගේ. ඉතා ශාන්තව කෙනෙක් තව කෙනෙක් දිහා බලාගෙන ඉන්නවා. ඒක හැම තිස්සෙම තියෙන්නෙත් නෑ. ඊට පස්සේ තව සිතක් එනවා. මගෙ ප්‍රශ්නය තමයි ආර්යයන් වහන්ස, ආර්ය භාවයට පත් වුණ රහතන් වහන්සේලාගේ හිත මම දැන් කියපු තත්ත්වයේ කිසි ගැටීමකුත් නෑ. එකම විදිහට තියෙනවා හෙළවෙන් නැතුව. මට තියෙන ප්‍රශ්නය තමයි ඒක හැම තිස්සෙම තියෙන් නැත්තෙ පුහුණුව මදි නිසා ද?

**ආර්යයන් වහන්සඃ** පළවෙනි එක තමයි තමන් දිහා පවතින සිහිය. **තමන්ගෙ සියල්ල ම අසුවෙන සිහිය තමයි "ඥානය" කියන්නේ.** "ඥානය" දියුණු වෙනව කියන්නෙ ඒකටයි. සම්මා සතිය තැනයි අපි මේ කතා කරන්නේ. "සති සම්පජනනය" කියන කොට අපිට හමුවෙනවා ආකාර කීපයකින්. බුදුන් වහන්සේත් පෙන්නනවා ලෞකික සමාධි වල තියෙන වචනම විදර්ශනා සමාධි වලදීත් භාවිත කරනවා. අවස්ථාව පෙන්නුම් කරන්න විතරයි ඒ වචන භාවිත කරන්නෙ. පළවෙනි එක මේ වචන ඇත්තක් නෙවෙයි. වචන භාවිත කරනව විතරයි. සන්නිවේදන මාධ්‍යයක් විදිහටයි මේ වචන පරිහරණය වෙන්නෙ. මේ වචන බලගන්ව

ගන්න හොඳ නෑ දෙයක් තියෙනව වගේ. වචන දෙයක් කර ගන්න හොඳ නැහැ. එහෙම දෙයක් මේ මාර්ගය තුළ අපට හමුවෙන්නෙ නෑ. කාය සංඛාර, වචී සංඛාර, මනෝ සංඛාර කියන කොටත්. වචනය පවා සංඛාරයක් වගේ අපිට දෙයක් වගේ දැනෙනව නම්, ඒක ආත්ම ස්වභාවයක්මයි. ඒක සංඛාර බවට පත් වෙනවා. වචනයත් දෙයක් වෙන්න බෑ. අර නිවනත් අත්හරිනව වගේ පාරුවත් කරේ තියාගෙන යන්න එපා බිමින් තියන්න කිව්ව වගේ වචන වලත් මෙතන ගන්න කියලා කිසිම ස්වභාවයක් හමුවෙන්නෙ නෑ. මෙන්න මේ අවබෝධය තමයි මේ විඤ්ඤාණ මායාව අවබෝධ වෙන එක.

විඤ්ඤාණ මායාව සිතුවිලි. සිත තුළ හට ගන්න සියලු සිතුවිලි 'සබ්බ සංඛාර' ඒ කියන්නේ "සබ්බ පාපස්ස අකරණං" අකුසල් මයි. සිතුවිලි කියන්නෙ විඤ්ඤාණ මායාව මයි. සිතුවිලි කියන්නෙ රැවටීමමයි. නාම රූප නිසා හට ගත්තු **මේ විඤ්ඤාණයේ දැනගැනීම කියන එක ඇත්තක් වෙන් නෑ. ඒක මායාවක්මයි. මේ මායාවේ සිතුවිලිවල ඇත්ත, සිහියට අසුවෙනවා. තමන්ට කේන්ති ගිය බව සිහියට හසුවෙනවා. තමන් සතුටින් ඉන්න බව සිහියට හසුවෙනවා. තමන්ට මේ මොහොතේ කුමන සිතක් ද? ඒක සිහියට හසුවෙනවා. මේ සිහිය කියන්නෙ සිතුවිල්ලක් නෙවෙයි. ඒක නිකං වලාකුළු වගේ සිතුවිලි යනවා, අවකාශය වගේ තමයි සිහිය. එතකොට මේ සිහිය, සිතුවිලි දිහා බලාගෙන ඉන්නවා වගේ. අර අවකාශය, වලාකුළු දිහා බලාගෙන ඉන්නව වගේ.** මේක උපමාවක් විතරයි. මේ ස්වභාවය තමන්ගෙ අභ්‍යන්තරයෙන් ම අසුවෙනවා. ඒක " ධම්ම චක්ඛුසය" අවදි වෙනවා. ඒ කියන්නෙ ඒ ස්වභාවය මතුවෙනවා. ඒ කියන්නෙ කුසලස්ස උපසම්පදා. අපි කියමු. "සබ්බ පාපස්ස අකරණං." "සබ්බ පාපස්ස අකරණං" කියන කොට "සියලු සිතුවිලි අකුසල්" වෙනකොට "කුසලස්ස උපසම්පදා" කියන්නෙ මෙන්න මේ සිහිය. මෙතන රාග, ද්වේෂ, මෝහ පනවන්න බෑ. ඒ කියන්නෙ, දෙයක් පනවන්න බෑ. දෙයක් නිරූපණය වෙන්නෙ නෑ. මෙතන මේ කුසලය කියන එක මේ සිහියයි. එතකොට මේ ඥානයයි.

අපි දන්නවා මේ ඥාන දස ඥාන විදිහට විදර්ශනාවෙ පෙන්නනවා. **සාමාන්‍ය දකින දේට එහා ගිය අවධියක් තමයි මේ "විදර්ශනා" කියල කියන්නෙ.** මේ වචන හොඳට දකින්න ඕනි. අපි දන්නවා 'අලමරිඥාන

දර්ශනය' පෙන්නන කොට මේ "උපක්ලේශ සූත්‍රය" තුළ බුදුන් වහන්සේ ම පැහැදිලි කරනවා මෙතන මේ **සාමාන්‍ය රූප දර්ශනයට එහා ගිය අධිගමයක් තියෙනවා කියලා.** අධිගම දර්ශනයක් ලබනවා කියලා. මෙන්න මේක තමයි මේ අධිගම දර්ශනය. **රූප දර්ශනයට එහා ගිය ඕබාසයක්.** "ඕබාසය" කියන්නෙ සමාධිමත් ස්වභාවයක් අවදි වෙනවා. අන්න එතන තමයි 'අලමරියඥාන දර්ශනය' කියල කියන්නෙ. විදර්ශනය කියන්නෙත් එතනමයි. එතකොට විදර්ශනා සමාධිය තමයි මේ අපි කතා කරන්නෙ. ඔය සිහියත් එක්ක යන තමන්ගෙම විඤ්ඤාණ මායාවෙන් අවදි වෙලා, ඒ හසුවන කුසල සිත "ඥාන සම්ප්‍රයුක්ත" කුසල සිතක්. ඥාන සම්ප්‍රයුක්ත කියන්නෙ මේ ඥානයයි. මෙයයි කුසල සිත. එතකොට මේ තමයි අපි ලෝකෝත්තර සිත් හැටියට දකින්නෙ. එතකොට මාර්ග සිත්, ඵල සිත්, මාර්ග සිත් 4 යි, ඵල සිත් 4යි. සෝවාන්, සකෘදාග ාමී, අනාගාමී, අරහත්වය. ඒ විදිහටම මාර්ගයට එන මාර්ගයේ කටයුතු කරන සිත්. ඒවා ඵල සිත්. ඒවා ක්‍රියා සිත්.

ඔබතුමිය කියපු එක හරි. මේක ක්‍රියා සිත්. සිතක් පනවන්න බෑ. **සාමාන්‍යයෙන් සිතක් කියන්නෙ විඤ්ඤාණ මායාව. නමුත් මෙතන එහෙම නෙවෙයි. මෙතන කුසලය තියෙන්නෙ. මෙතන තියෙන්නෙ නාම රූප වලින් මිදුණ ස්වභාවයක්. විඤ්ඤාණය අනිදස්සන වන ස්වභාවයක්. මෙන්න මේ ස්වභාවය සිහියට හසුවෙනවා. අර "විඤ්ඤාණ අනිදස්සන" වන ස්වභාවය සිහියට තමා හසුවෙන්නෙ. මේ සිහිය දියුණු වුණාම මේක "සම්මා සතිය." මොකද මේක සම්මා දිට්ඨිය හරහා එන්නෙ.** සාමාන්‍ය සති නිමිත්ත වඩන එක සම්මා දිට්ඨිය හරහා නෙවෙයි එන්නෙ. එකම නිමිත්තක සිහිය පිහිටුවා ගෙන ඉන්න එකේ ආත්මයක් තියෙනවා. ආත්ම දෘෂ්ටිය තුළයි ඉන්නෙ. එතන දෙයක් තියෙනවා. ඒක දේක පිහිටගෙනයි ඉන්නෙ. මේ ස්වභාවයට දෙයක් නෑ. නාම රූපත් නෑ. මේ ස්වභාවය තුළ සිහියට අහුවෙනවා, ඥානයට අහුවෙනවා කියන්නෙ, සම්මා සතිය කියන්නෙ සම්මා දිට්ඨිය හරහා එනවා කියන්නෙ, මෙතන්ට එන්න ඕන. සත්ත්ව පුද්ගල දෘෂ්ටියෙන් මිදිලයි. සත්ව පුද්ගල දෘෂ්ටියෙන් මිදෙන්නෙ "සත්‍ය ඥානය" තුළින්. සද්ධර්ම ශ්‍රවණය, කල්‍යාණ මිත්‍රයාගේ පණිවුඩය. ධම්මානුධම්ම ප්‍රතිපදාව තුළ තමයි මේක හමුවෙන්නෙ. යෝනියෝමනසිකාරයත් එක්ක. මේ මාර්ගයේ යන කෙනාටයි යෝගාවචර කෙනාටයි මේක හමුවෙන්නෙ.

මෙතන ලොකු වචන ගොඩක් වගේ පෙනුණාට එහෙම දෙයක් නෑ. මෙතන ඔබතුමිය කිව්වා හරි. මේ සිහියට හසුවන තැනයි. මෙතනමයි කුසලස්ස උපසම්පදාව. මෙතනමයි ඥානය කියන්නෙ. ඔබතුමිය ඉතාම දක්ෂයි. ඉතාම හොඳයි. ප්‍රඥා ගෝචරයි. අපිට මතකයි ඔබතුමිය මුලින් කතා කරපු ස්වභාවය. ඔබතුමිය බොහොම වේගෙන් ඉස්සරහට ඇවිත් ඉන්නවා. ඔබතුමිය ඉතාම ඍජුයි. ඒ "සක්ඛෝ ඍජුකෝ" කියන එක. මෙතන දෘෂ්ටිවලින් මිදෙන්න නම්, අපි ළඟ තියෙන්නෙ ඕන පන්නරයක් අභ්‍යන්තරයේ බිත්තර කට්ට කැඩුව වගේ, හිර කූඩුව සුනු විසුණු කරගෙන එළියට එනවා වගේ. මේකේ ඇත්තටම දෘෂ්ටි ගොඩක් තියෙනව අපි හිරවෙච්ච ඒවා. එදිනෙදා ඒවා අල්ලගෙන බැසගෙන ගැට ගැහිල ඉන්න දේවල් කියල හදා ගත්ත ලෝක සම්මත වලට අපි හිරවෙල ඉන්නවා. නමුත් ඒවා දෘෂ්ටි. ඇත්තටම ඒවා සත්‍ය නෙවෙයි. මේ භාෂාව පවා සත්‍යයක් වෙන්නෙ නෑ. එතකොට විශාල ඍජු භාවයක් තියෙන්න ඕනි. ඇත්තටම ශබ්ද වර්ණ කියල ගන්න කොට දරුව පවා ශබ්ද වර්ණ වෙන්නෙ. සිතනවා වෙන්නෙ ශබ්ද වර්ණ විතරයි. චිත්තයක් විතරයි. ඒක බාහිර කවදාවත් හම්බ වෙන්නෙ නෑ. පොත කියන්නෙ ශබ්දයක්. ශබ්දයක් වර්ණයක් කියන්නෙ චිත්තයක් කවදාවත් බාහිර දෙයක් වෙන්න විදිහක් නෑ.

දෙයක් කියල දැනෙන ගතිය තමයි "සත්ත්ව" "ඉත්ත" කියල කියන්නෙ. සෙන්සස් වලින් ම එන ආරෝපණයක් තුළ අර විද්‍යුතය වගේ මෙතන එන ස්වභාවයක්. ඒ ස්වභාවය තමයි චිත්තාරෝපණය කියල කියන්නෙ. අපි මේ පැත්තෙන් කතා කරන කොට ශබ්දයක් මැවෙනවා. ඔය පැත්තෙන් චිත්ත රූප මැවෙනවා. ඔක්කොම මේ චිත්තාරෝපණය ඇතුළෙයි තියෙන්නෙ. ඔබතුමියගෙ ම අභ්‍යන්තරයේ මැෂින් එක වැඩ කරනවා. ආයතනික කෘත්‍යයක් සිද්ධ වෙනවා කියන්නෙ ඕකයි. අපි මේ සත්‍ය තමයි මේ ගවේෂණාත්මකව ලිහා ගන්න හදන්නෙ. මේක අවබෝධ කරගන්නයි හදන්නෙ. "සංඛිතේ නිබ්බිදාය" කියන්නෙම ඒ සත්‍ය අවබෝධ වන තැනයි. එතකොට මේ සත්‍ය අවබෝධ වෙන්නෙ මෙන්න මේ සිහියටයි. ඔන්න ඔතන ඉස්සලම අපි අල්ල ගන්න ඕනි. ආසවඛ්‍යා ඥානය කියල කියන්නෙ ඔය සිහියට තමයි ඒක හසුවෙන්නෙ. ඒ කියන්නෙ කලින් අපේ ස්වභාවය දැන් අපේ ස්වභාවය. අපිට තේරෙනවා අපේ කෙලෙස් ටික ටික ක්ෂය වී ගෙන යනවා. යම්කිසි සැහැල්ලුවක්

දැනෙනවා. සුඛයක් දැනෙනවා. දුකෙන් මිදෙනවා. **ආස්‍රව කෙලෙස්, රාග, ද්වේෂ, මෝහ ටිකෙන් ටික ටික දියවෙන බවට තියෙන මෙන්න මේක හසුවෙන්නෙ සිහියටයි. ඥානයටයි. ඒකයි ඥාන සම්ප්‍රයුක්ත කුසල සිතක් කියල කිව්වෙ මේ ක්‍රියා සිතයි.**

ඔබතුමිය බොහොම දියුණු මට්ටමකින් ඔය භාෂිතය කරන්නෙ. ඔබතුමියට ඒ අවබෝධය දැන් ඇතිවෙලා තියෙන්නෙ. දැන් ඔබතුමියට තියෙන්නෙ ඔබතුමියගෙ අභ්‍යන්තරයේ තියෙන රාග, ද්වේෂ, මෝහ ස්වභාවය දියවීගෙන ගිහිල්ලා, අරහත්වය කරා යන මාර්ගය හමුවෙලා තියෙනවා. ඔබතුමිය නිවන් දකින යම් මගක යනව නම්, ඒ මග තුළ යන වාහනයේ යතුර තමයි මේ හමුවෙලා තියෙන්නෙ. ඔබ දැන් වාහනය ස්ටාර්ට් කරන්නයි හදන්නෙ. ඔබ සමහරවිට ස්ටාර්ට් කරගෙනයි ඉන්නෙ. ඔබ දැන් නිවන් මග කටයුතු කරන්නෙ. ඒ කියන්නෙ මේ සිහියට හසුවෙනවා, මේ ඥාන සම්ප්‍රයුක්ත කුසල සිතට හසුවෙනවා ආසවඛ්‍යා ඥානය මෙතනට හසුවෙනවා. **මෙතන තමයි වැදගත් ම තැන පෙන්නන්න ඕනි, ත්‍රිවිද්‍යා තියෙන්න ඕන යමෙකුට මේ මග යන්න. සිත් දකින්න ඕනි. සිත කොහොමද හැදෙන්නෙ කියල දැනගන්න ඕනි. පුබ්බේ නිවාසානුස්සති ඥානය තියෙන්න ඕනි. ඉපදෙන කොට තණ්හාවක් නොතිබුණ බවත්, පසුව මේක ආයතන ඔස්සේ දෙයක් දැන ගැනීම තුළ, "අජ්ජෝසාය තිට්ඨති" බැස ගත්තා දෙයක් කර ගත්තා. "යාරූපේ නන්දි" අන්න ඒක ඇත්ත කර ගත්තා. ඒකට ඇලීමක් ආවා. බන්ධනයක් ආවා. "තදූපාදානං භවෝ" දෙයක් වුණා.**

ඉර හඳ ගහ කොළ හැම දේම දෙයක් වගේ. දැනෙන චිත්ත ඇතුළෙ අපි ආරෝපණයක මනෝමය ආරෝපණයක් ඇතුළෙ හිරවෙලා ඉන්නවා. ඒක තමයි අපි ඉන්න 'ෆැන්ටසි' එක. විඤ්ඤාණ මායා ලෝකයක අපි අතරමං වෙලා ඉන්නෙ. **එළියෙන් අපි මේ හැම එකම පෙන්නන්න යන්නෙ.** අපි මේක එළියෙ තියෙනවා කියල දෙයක් කරගෙනයි ඉන්නෙ. **අපි ජීවත් වෙන්නෙම සිතක් ඇතුළෙ. ඉත්තත්වයක් තමයි ජීවත් වෙනව කියන්නෙ. තියෙනව වගේ දැනෙන ගතියක්. එහෙම දෙයක් නෑ. අන්න ඉත්තත්වය බිඳ වැටෙනවා. මේ සත්‍ය දකින කොටම. ඒ කියන්නේ සත්ත්ව පුද්ගල දෘෂ්ටිය බිඳ වැටෙනවා. "නිස්සත්තෝ නිජ්ජීවෝ ශූන්‍යයෝ" කියන තැනට එනවා. අනාත්ම ධර්මය හමුවෙනවා.**

ඒ අනාත්ම ධර්මය කියන්නෙ ඇත්තටම, බුදුන් වහන්සේ අහනවා, මහණෙනි, "චක්ඛුං නිච්චංවා - අනිච්චංවා" "අනිච්චං භන්තේ" මහණෙනි. ඇස කියන්නෙ පේන බව. දැක්කෙ මේසයක්, පුටුවක්, ගහක්, පොතක්. පොතක් කියන්නෙ ශබ්දයක් විතරයි. ශබ්දයක් කොහොමත් එළියෙ නෑ. "අනිච්චං භන්තේ" කිව්වෙ ඇසට එන්නෙ කෙළින් ම පොතක්. පොතක් එන්නෙ නෑ. ඇසට එන්නෙ ආලෝක හැඩතලයක්. නමුත් පොතක් කියල එහෙම දෙයක් නෑ. ඇත්තෙන් ම ශබ්ද වර්ණ. ශබ්දෙන් වර්ණෙන් තමයි මේවා වෙන් කරේ. **මොන්ටිසෝරි දරුවට කහපාට රතුපාට කියල වර්ණ ටික වෙන් කළේ ශබ්දයෙන්. ශබ්දයෙන් වෙන් කරපු ගමන් මොකද වෙන්නෙ, අන්න එතන අන්ත දෙකක් එනවා. ඒ කියන්නේ ද්වේතාවක් හැදෙනවා.** ඒ කියන්නෙ ඒ කහ, මේ රතු - ඒ කියන්නේ ඒක හොඳ ද? මේක හොඳ ද? අන්න **මිම්මකට, මැනීමකට එනවා. අස්මිමානය එනවා.** ඒක දෙයක් වුනොත් එතන මමත් ඉන්නවා. "ඒතං මම - ඒ සෝ හමස්මිං එමේසෝ අත්තා" මේ සිද්ධිය තමයි මෙතන බුදුන් වහන්සේ පෙන්නන්නෙ, **ආත්මය හැදෙන හැටි. 'හේතුව නම් ශබ්ද වර්ණ, 'ඵලය' නම් ආත්මය. හේතු ඵල දහම තුළ තියෙන්නෙ මෙයයි. මහණෙනි, කිරෙන් ගිතෙල් හැදුවට, ගිතෙල් නැවත කිරි කරන්න බෑ. නූතන උපමාවක් ගන්නව නම්, කිරි වලින් චීස් හැදුවට චීස් නැවත කිරි කරන්න බෑ. මේ ශබ්ද වර්ණ වලින් ආත්මයක් හැදුණට ඒ ආත්මය තුළ, නැවත ශබ්ද වර්ණ වෙන් කරන්න බෑ.**

ඒ කියන්නේ අපි පරිහරණය කරන්නෙ දිගට ම ආත්මයක්. ආත්මීය දැනීමක්. සත්වයෙක් පුද්ගලයෙක් ඉන්නවා කියලා. බුදුන් වහන්සේ පෙන්නනවා මහණෙනි ඇස අනිත්‍ය නම් පොත, ඉර, හඳ කියලා දෙයක් කියල ලෝක සංඥාවක් හමුවෙන්නෙ නැත්නං ඇස අනිත්‍යයයි. "අනිච්චං භන්තේ" කියල සංඝයා පිළිතුරු දෙනවා. මහණෙනි එහෙනං එය දුකයි. දුකයි කිව්වේ දෙයක් නෑ කියන එකයි. එහෙනම් මහණෙනි එය ආත්ම වශයෙන් ගත හැකිද? "නො හේතං භන්තෙ."මේකෙ ආත්මයක් නෑ. මෙන්න මෙයයි භව නිරෝධයක් දකිනව කියන්නෙ. නියම බෞද්ධයක් කියන්නෙ. "ඉඳ භික්ඛ වේ භික්ඛු" මේ ශාසනයේ භික්ෂුවක් කියල බුදුන් වහන්සේ කිව්වේ සංඝ රත්නය එහෙම කිව්වොත් පමණයි. සංඝ රත්නය එහෙම කියන් නැත්තං එතන භික්ෂුවක් නෑ. බුදුන් වහන්සේ එතැනින් තමයි භික්ෂුත්වය පනවන්නෙ. "රූපං නිච්චංවා අනිච්චංවා" අනිච්චං

භන්තේ' 'චක්ඛුං නිච්චංවා අනිච්චංවා' - 'අනිච්චං භන්තේ' එතනින් තමයි මහණෙනි එය අනාත්මය කියල කිව්වෙ. ආත්මයක් නැති බව පෙන්නුවේ.

එහෙනම් මෙන්න මෙතන තමයි ඔබතුමිය දැන් ඉන්නෙ. ඔබතුමිය දැන් මෙතෙන්ට එන්න ඕනි. ඔන්න ඔතන පදනම දාගෙනයි. ඒ කියන්නෙ අනාත්ම ධර්මය හඳුනාගෙනයි. සත්‍ය ඥානය තුළයි ඒක සිද්ධ වෙන්නෙ. සත්‍ය ඥානය තුළ දර්ශන සමාපත්තිය තුළයි ඒක තියෙන්නෙ. ඒක කිසිම ආගමක නෑ. බුදුන් වහන්සේ **පෙර නොඇසූ විරූ දහමක් හැටියට " පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු"** කියල ලෝකෙට හෙළි කරේ ඔන්න ඔය පණිවුඩය. ඔය පණිවුඩය දෙනව පස්වග තවුසන්ට අන්න කොණ්ඩඤ්ඤට වැටහුණා කියල. අන්න එතනදි කොණ්ඩඤ්ඤ තාපසතුමා මේ අසන මොහොතෙම, ලෝකයක් නැති බව දෙයක් නැති බව අවබෝධ කරල නිවන් දකිනවා. මේක තමයි ඇත්ත කතාව. මේ ශාසනයේ පළවෙනි ශ්‍රාවකයා වෙන්නෙ කොණ්ඩඤ්ඤ තාපසතුමා කිව්වෙ අන්න ඒ නිසයි. එතැනින් තමයි මේක පටන් ගන්නෙ. **මේ ශාසනයේ පළවෙනි භික්ෂුව ශ්‍රමණ කොහෙන් ද හැදෙන්නෙ, ධර්ම ශ්‍රවණය තුළයි. මේ කල්‍යාණ මිත්‍රයා මතමයි ආනන්දය ශාසනය පවතින්නෙ කිව්වෙ. යමෙක් මෙම ධර්මය අවබෝධ කරගැනීමට නම් කල්‍යාණ මිත්‍රයා ධර්මය දේශනා කළ යුතුමයි.**

මේ බුද්ධ දර්ශනය ඒ විදර්ශනා ධුරය තුළ කවුරු හරි සත්‍ය මතු කරල ගත්තොත් එය ලෝකෙට හෙළි කරොත් බුද්ධ ශාසනය බැබලෙනවා. ඒතාක් බුද්ධ ශාසනය තියෙන්නෙ කාලයේ වැලි තලාවට සැඟව ගිහිල්ලා. අද මේ යුගය වන විට මේ කර්තව්‍ය යයි මේ බුද්ධෝත්පාද නාලිකාවෙන් සිදුවෙන්නෙ. මේ අවබෝධය ඇති වෙන එකයි වැදගත් වෙන්නෙ. මේක විශ්වාසයක් නෙවෙයි. ඇදහිල්ලක් නෙවෙයි. මේක ප්‍රත්‍යක්ෂ ධර්මයක්. ඔබතුමිය කියන්නෙ ඔබතුමිය අභ්‍යන්තරයේ දකින උපමා නම් අපි සාධු... සාධු... කියනවා. ඔබතුමිය මේ මග යනවා කියන්නෙ ඔබතුමිය මේ මග අවසාන කරෝතින් දෙදෙනෙක් ඉතුරු වෙන්නෙ නෑ. ස්වභාව දහමක් පමණයි. ස්වභාව දහමටයි බුද්ධ ස්වභාවයටයි අවදි වෙන්නෙ ඒ ස්වභාව දහම තුළ සියල්ල බුද්ධ ස්වභාවය බවට පත් වෙනවා. ඔය මොනව කීවත් අනිමිත්තයි අප්‍රණිතයි. අන්න අනිමිත්ත, ශූන්‍ය අප්‍රණීත

චේතෝ විමුක්තිය තුළ ඒ කියන්නෙ බුද්ධ ස්වභාවය තුළ සියල්ලම සමානයි. එකම ස්වභාවයයි.

ඒ කියන්නෙ **ආත්ම දෘෂ්ටිය තියෙනකම් අපි වෙන් කර ගන්නවා මේ මගේ මේ අනුන්ගෙ කියලා. හැබැයි ආත්ම දෘෂ්ටිය බිඳ වැටුණ ගමන් "අත්තානු දිට්ඨිං ඌහච්ච - මච්චු රාජා නපස්සති" අන්න මරණයක් නෑ. මර බියක් නෑ. ඉන්න කෙනෙක් නැතිවෙනවා. ඉන්න කෙනෙක් නැති වෙන විට සියල්ල සමානයි. සියල්ල අහිමි වෙන්නාට සියල්ල ලැබේ කිව්වෙ ඔන්න ඔතනයි. ඒකයි "බුද්ධ දේශිතය."** මෙන්න මෙතන අපිට දකින්න ලැබෙනවා දැන් ඔබතුමිය කිව්වා ඒක ක්‍රියා සිත. ඔබතුමිය ඒක අඳුර ගත්තා. ඒක හරි. ඔව්, ඒකත් හරි. ඔබතුමිය කිව්වා ඒකට අවදි වෙලා ඉන්න පුළුවන් කියලා. ඔව්, ඒකත් හරි. ඔබතුමිය කිව්වා ඒක දිගටම පවතින්නෙ නෑ කියලා. ඒකත් ඇත්ත. ඒක තමයි යෝගාවචර අවස්ථාව. ඒ කියන්නෙ විහරණ භූමිය සමාපත්ති අවස්ථාව තමයි අරහත්ත සමාධිය ඒ කියන්නෙ සතර ඉරියව්වෙන්ම ඒක පවතිනවා. ඔතෙන්ට එන්න ටිකක් අමාරුයි. ඔබතුමිය ප්‍රඥාවන්තයි කියන්නෙ **විඤ්ඤාණ මායාව ඔතන දකින එකයි. 'ප්‍රඥාව ප්‍රඥා භාවේ තබ්බං විඤ්ඤාණං පරිඤ්ඤෙදයියං" කිව්වෙ ඒකයි.** ප්‍රඥාව කියන වචනෙ බුදුන් වහන්සේ භාවිත කරන්නේ විඤ්ඤාණ මායාවේ සත්‍ය දැකීමටයි. විඤ්ඤාණ මායාවේ සත්‍ය දකින්නට ලැබෙන්නේ ඔය ඥානයටයි සිහියටයි.

ඒකමයි "යථාභූත ඥානය" කියන්නෙ. **යථාභූත වන ආකාරය දකින ඥානය "යථාභූත ඥානයයි."** යථාභූත ඥානය තුළ තමාගේ ම කෙළෙස් ස්වභාවය දියවීම, සිහියට හසුවෙනවා. එතන තියෙනවා ආසවඛ්‍යා ඥානය, එතන තියෙනව පුබ්බේ නිවාසානුස්සති ඥානය. සිත දැකලයි ඒක වෙන්නෙ. චුතූපපාත ඥානය තියෙනවා. හැම අරමුණ ම සත්‍යයට අවදිවීම තුළයි චුතූපපාත ඥානය එතන එතන ඒ සිත දකින එකයි මිදෙන එකයි. එතකොට මුඤ්චිතු කම්‍යතා ඥානය කියන්නේ සම්පූර්ණයෙන් ම මේ අරමුණින් මිදි මිදී යන ගමන. ඒ එන හැම දෙයකින් ම මිදීගෙන යන ස්වභාවය යි. උදයව්‍ය ඥානය. ඇතිවන සිත් නැති වන ස්වභාවය. වය ඥාන, භයතුපට්ඨාන ඥාන. මේ සියල්ලම තමාට හමුනොවන ස්වභාවයක් දැනෙන කොට කෙනෙක් පුද්ගලයෙක් නැති බව දැනෙන කොට ඥානෙට හසුවෙනවා, සිහියට හසුවෙනවා, මුලින් ම ඇති වෙනවා

පොඩ්ඩක් අර බියක්, චකිතයක් ඇති වෙනවා කෙනෙක් හමුවෙන්නෙ නෑ. තමන්ට තමන් කියලවත් කෙනෙක් හමුවෙන්නෙ නෑ.

**උපාසිකාව:** ඒක මට දැනුණා ආර්යයන් වහන්ස මට මෙතන දෙයක් නෑ කියලා. ඒ මොහොතෙ ඇඟ හිරිවැටිල අකුණක් ගහනවා වගේ දැනිලා, දුකක් වගේ ම සතුටක් වගේ දැනුණා.

**ආර්යයන් වහන්සේ :** ඔව්. ඇත්ත.

**උපාසිකාව:** ඔබ වහන්සේගෙ බණ මම දිගටම දිගටම ඇහුවා. අහල වාඩිවෙලා මෙනෙහි කරා. චිංගලන්තෙ නෝන කෙනෙක්, මම ඒ ගොල්ලන්ටත් පිං දෙනවා ඒ ප්‍රශ්නෙ ඇහුවට සත්‍ය ඥානය ගැන. එදා තමයි මට සත්‍ය ඥානය ගැන හොඳටම අවබෝධ වුණේ. ඒ අවබෝධය ආවට පස්සේ ඒක ආයෙ යන්නෙ නෑ කියලා මට තේරුණා.

**ආර්යයන් වහන්සේ:** ඒක තමයි සෝතාපන්න මාර්ගයට එන එක. ඇත්තටම ඔබතුමිය සෝතාපන්න මාර්ගය තුළ කටයුතු කරනවා. අපි ඵල ගැන කතා කරන්නෙ නෑ. අපි ගොඩක් කතා කරන්නෙ මේ මාර්ගයේ යන ගමන ගැනයි. ඔබතුමිය දැන් දුගතියක වැටෙන් නැතුව යන මගක සුගති පරායන වීමක් අපිට පේනවා. අපි නිතරම මේ සත්‍ය පෙන්නනවා. මොකද ඒ යෝගාවචරයා අසරණ වෙනවා. “නියත සම්බෝධි පරායනය” කියල ඒක නිසාම අපි කියනවා. **බාහිර ලෝක සංඥා තියෙනකම්, ලෝකෙක උපදින බවත් අපි කියනවා. දැනුමෙන් හරි මුලින් ම ඒක අවබෝධ කර ගන්න ඕනි. පසුව ඒක ප්‍රත්‍යක්ෂ වෙන කොට තමා තුළින් තමාටම සාන්දිට්ඨික වෙනවා සියලු ලෝක සංඥා වලින් මිදෙන බවක්. ඒත් එක්කම තමන් සෝතාපන්න වන බවත්, තමන්ට ම සාන්දිට්ඨික වෙනවා.** ඒ වගේ ම තමාගෙ සිතේ යම්කිසි ලෝක සංඥාවක් තියෙනව නම් තමයි සිතේ දුකක් තියෙන්නේ. සිතේ දුකක් කම්පාවක් ඇතිවන ස්වභාවය තියෙනකම් අර කාම රාග පටිඝ කියන ස්වභාවය තියෙනවා. ඒ කියන්නෙ සකෘදාගාමි භූමිය තමාට හමු වෙනවා. හැබැයි සිත ඇතුළෙත් ලෝක ස්වභාවයක් සංඥා ස්වභාවයක් සිතෙත් නැති බවට අවබෝධයක් තුළ අභ්‍යන්තරයෙන් ම මිදීමක් දැනෙනවා නම්, ඒ තමයි අනාගාමි භූමිය.

මෙන්න මේ යායුතු මාවත ලිපිනය පෙන්නන්න ඕනි. ඉතිං ඒත් එක්කම කිසිම දේකට කම්පාවක් නැතිව මිදීමේ ස්වභාවයක් දැනෙනව නම් ඒ අරහත්ත භූමිය. එයයි "අලමරියඥාන දර්ශනය" හමුවෙන තැන. ඔබතුමිය ඉන්න ස්වභාවය අපි ටිකක් පෙන්නුවේ. ඔබතුමිය නියත සම්බෝධ පරායනයි. ඔය කියන භූමිය තුළ ඒ කියන්නෙ ඔය පටිසෝතය තුළ ඔබගේ අවබෝධය හොඳින් පත්තියං වෙලා ඒ කියන්නෙ බහුලීකතා වෙලා හොඳින් මාර්ගයට ප්‍රවේශ වෙන්න. ආර්ය අෂ්ටාංගික මාර්ගය තමයි ඔබතුමිය යන මාර්ගය. ඔබතුමිය මේ මාර්ගයේ කටයුතු කරන ආකාරයත් හරි. එතකොට අපිට තව ඔබතුමිය අහපු ප්‍රශ්නෙම කොටසක් තියෙනවා. ඒ කියන්නෙ ඔබතුමිය දැන් සිහියට අවදි වෙලා ඉන්න ක්‍රියා සිත හරි. ඔබතුමියට ඔබතුමියගෙම අභ්‍යන්තරයට සිහියක් පවතිනව නේද? ඒ තුළින් ඔබතුමිය හඳුනා ගෙන තියෙනව නේද ඔබතුමියගෙම අභ්‍යන්තරයෙ කම්පන ස්වභාව, ලෝක සංඥාවල ස්වභාව. වැටහෙනවද ලෝක සංඥාවල ස්වභාවය කියන්නෙ මොකක්ද? කියන එක. ඔබතුමිය ඒක පැහැදිලි කරොත් අපිට යම්කිසි හඳුනා ගැනීමක් තියෙනව ඔබතුමිය ගැන. මොනවද එතකොට ලෝක සංඥා කියන්නෙ?

**උපාසිකාව:** ඇස, කන, නාසය, දිව යන ආයතනවලින් ගන්න සංඥා ටික.

**ආර්යයන් වහන්සේ:** හරි සරලයි... හරි සරලයි... පොත, මේසේ, ඉර, හඳ, ගහකොළ කියල අපි කියනවනෙ. වචනවලින් මේවා මේවා කියල හඳුනා ගැනීම්, නාම රූප ටිකක්. ඒ මේසේ, පුටුව, ඇඳ, ඉර, හඳ, දිව්‍යලෝක, බ්‍රහ්ම ලෝක ඔය අපි කතා කරනවානෙ බාහිරිනුත් රූප හදාගෙන මේ එන ආරම්මණ රූප දේවල් කරගෙන, ශබ්ද දේවල් කරගෙන කතාබහ කරනවනෙ. ලේනෙක් ඉන්නව, කපුටෙක් ඉන්නවා. අපිට මේසයක් තියෙනවා, ඉරක් තියෙනවා. එතකොට මේවා තියෙනව වෙලා නේද? සංඥා ගොඩක් තියෙනව නේද? ඒවා තමයි ලෝක සංඥා කියන්නෙ. ඒවා තමයි සංඥා. **ලෝකය කියන්නෙ මේ අපි හදා ගත්ත දේවල්මයි. කොහෙවත් තියෙන ඒවා නෙවෙයි සිතුවිලි.**

**උපාසිකාව:** එහෙමයි ස්වාමීන් වහන්සේ. දැන් අපි පොත කිව්වම, හඬටනෙ මේ රූපය එකතු කරන්නෙ කියල කියනවනෙ. මම එක දවසක් වාඩිවෙලා ඇහෙන ඇහෙන ශබ්දත් එක්ක ඔබ වහන්සේ කියපු එක

බැලුවා. ඊට පස්සෙ ඔබ වහන්සේ කියනව වගෙ අර යටි නූල ඇද්දම ලිහෙනව වගෙ ඊට පස්සෙ ආර්යයන් වහන්ස ඒකට තියෙන චූන් එක ඇත්තටම නැති වෙලා ගියා.

**ආර්යයන් වහන්සේ:** ඒක හරි. ඒක තමයි ඔබතුමියට වෙච්ච පරිවර්තනය. මීට කලින් ඔබතුමිය කියන කොට ම අපිට තේරුණා. ඔබතුමිය හිරවෙලා හිටිය යම්කිසි සංඥා ගොඩක. ඒවා ඇත්තටම ලෝක සංඥා. රෝසමල පිච්ච මල කියනව වගේ, සමන්, නිමල්, කමල් වගේ අපි රූප ගැට ගහගෙන මේ ඉන්නවනෙ ශබ්ද වර්ණ විදිහට. ඒවා තියෙනව කියල සංඥාවක් තියෙනවනෙ. එහෙම දේවල් නෑ. අඹ ගස්, නා ගස්, පුටු, ඇඳ, මේස, ඉර. අපි හදා ගත්ත ශබ්ද වර්ණ වලින් දා ගත්ත ඒවා. **ශබ්ද වර්ණවලින් දාගත්ත ඒවා ඇත්ත කරගෙන ලෝකෙ ජීවත් වෙනව කියන්නෙ ඒක මනෝමයයි. කොහෙවත් එළියෙ තියෙන එකක් නෙවෙයි. අපේ හිත ඇතුළෙයි අපි ඉන්නෙ. අපි එළියට යන්නෙ නෑ. ජීවත් වෙනව කියන්නෙ අපි චිත්තයක් ඇසුරු කරන්නෙ.** ඒ කියන්නෙ දරුව ඉන්නෙ අපේ හිතේ. ගෙවල් තියෙන්නෙ අපේ හිතේ. අපේ හිත ඇතුළෙ. **දේවල් එළියෙ තියෙනව කියල සිතුවිල්ලක ඉන්නවා.** ඒක සංඥාවක්. එහෙම දෙයක් කොහෙවත් නෑ. ඒක අවබෝධ වෙනකොට වෙන්නෙ එහෙම දෙයක් බාහිර කොහොමත්ම හම්බ වෙන් නැති බව. බාහිර අපි හිතන දේවල් බාහිර නැති බවට අවබෝධ වෙනවා. බාහිර නැති බවට කැඩිල ගිය ගමන් ම අපි සෝතාපන්න පැත්තට එනවා. අනුසෝතයට යන්නෙ නෑ. මොකද බාහිර කම්පනය වෙන්න දෙයක් නෑ. අපි මේ බාහිරයි කියල හිතන එකක් තියෙන්නෙ. දැන් පැහැදිලිද?

**උපාසිකාව:** එහෙමයි ස්වාමීන් වහන්ස.

**ආර්යයන් වහන්ස:** ඒ ලෝක සංඥා වලින් මිදෙනව කියන්නෙ ඒ ස්වභාවය සිහියට අසුවෙනවා නේද? ඔබතුමිය උදාහරණයක් කිව්වා. යටි නූල ඇද්ද වගේ. කම්පනය වන ස්වභාවය නැති වුණා කියල නේද?

**උපාසිකාව:** එහෙමයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** ඔබතුමියට අවබෝධයක් තියෙනවා නේද ලෝක සංඥා කියල ගන්නෙ මොනවද කියලා.

**උපාසිකාවඃ** එහෙමයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සඃ** ඒවා සිතුවිලිවල තියෙනකම් දුකයි කියන අවබෝධෙත් තියෙනවා නේද? එතකොට බාහිරත් එක්ක තමන් ගැටෙන් නැත්නං, බාහිරෙන් ඒවත් එක්ක තියෙන කම්පන ගතිය නැතිවෙනවා කියන්නෙ, බාහිරෙන් මිදෙනවා කියන්නෙ ඒක නේද මේ සෝතාපන්න ස්වභාවය කියල වැටහෙනවා නේද?

**උපාසිකාව ඃ** එහෙමයි ආර්යයන් වහන්ස. ඔබ වහන්සේ දේශනා කරනවා අර... නිකං වලාකුළු වල ඇවිදින තත්ත්වයක්. ඒක නැතිවෙලා යන කොට එහෙම තත්ත්වයක් ඇත්තටම දැනෙනවා ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සඃ** සෘද්ධිමය ස්වභාවය මේ කියන්නෙ නේද? අර ඔක්කොගෙන් ම මිදෙන ස්වභාවයක් එනකොට එවැනි ස්වභාවයක් එනවා. එහෙමද? එහෙම නැත්නං අදහස් කරේ මොකක් ද?

**උපාසිකාවඃ** ආර්යයන් වහන්ස මම අදහස් කළේ පාවෙන ස්වභාවයක්.

**ආර්යයන් වහන්සඃ** එතකොට දැන් අපි සංඥා ගොඩක හිරවෙලානෙ ඉන්නෙ මේ. බැසගෙනනෙ ඉන්නෙ. ඒවයින් මිදෙන බව ඔබතුමිය හොඳින් පැහැදිලි කරා. ඒ වගේම යටි නූල ඇද්දම සේරම ලිහිගෙන යනව කියපු එකත් හොඳ උපමාවක්. ඔබතුමියමයි ඉදිරිපත් කළේ. බොහොම හොඳයි. අපි ඇත්තටම සාදු සාධු කියනවා. ඒ වගේම ඔබතුමිය ටිකෙන් ටික සත්‍යයට අවදි වේගෙන යනවා. බොහොම හොඳයි. ඔබතුමියට ඒක තුළ ලොකු සැහැල්ලුවක් දැනෙනවා. ඔබතුමියට සියලු ප්‍රශ්න විසඳෙනවා නේද? මේ අවබෝධය ඇතිවෙන කොට. යම් ප්‍රශ්න තිබුණා නම් ඒ ඔක්කොම විසඳෙනව නේද?

**උපාසිකාවඃ** ඒක පුදුම ආශ්චර්යයක් ආර්යයන් වහන්ස. අපි වෙනදා මේවා පසුපස්සෙන් දුවල ගිහිල්ල ලබා ගන්න උත්සාහ කරපුවනෙ මේ ලැබෙන්නෙ. ඒ ලැබුණත් දැන් ගාණක් නෑ ආර්යයන් වහන්ස. ඔබ වහන්සේට ගොඩක් පිං ආර්යයන් වහන්ස, ඒ වගේ ම මට මේ ධර්මය අහන්ට යොමු කළ සියලු දෙනාටත් මම පිං දෙනවා.

**ආර්යයන් වහන්සඃ** ඔබතුමියට සත්‍ය අවබෝධ කරන්න ප්‍රඥාව තියෙනවා. ඇත්තටම ඔබතුමිය දුකින් මිදෙනවා. අපිට ඒක පේනවා. අපි

දකින්නෙ නෑ ඔබතුමියට උප්පත්තියක් තියෙනව කියල. මේ ඔබතුමියගේ අන්තිම ආත්මභාවය බවට පත්වෙයි. ඔබතුමිය දුගතියක වැටෙන්න හේතු නෑ. පටිසෝතයට එනවා. නියත සම්බෝධි පරායන වෙනවා. ඒ කියන්නෙ ඔබතුමිය හඳුනා ගත්තා මොකද්ද මේ විඤ්ඤාණ මායාව කියලා. අර මහණෙනි, ගසක් ගඟට ඇලවී තිබෙන්නෙ යම් සේ ද ඒ ගස ගඟටමයි වැටෙන්නෙ කිව්ව වගේ ඔබතුමිය නිවනින්මයි සැනසීම ලබන්නෙ.

**උපාසිකාවː** සාධු... සාධු ...

**ආර්යයන් වහන්සː** ඉතිං ඒක තව ටිකක් හොඳින් ඔබතුමියට ළං කරගෙන කරන්න යන හැමදේම පැත්තකට තියල මේකටම යොමුවෙන්න. ඔබතුමිය කොතනට ගියත් ඔබතුමියට ධර්මයට කමටහනක් ලැබිලා ඔබතුමිය නිවනටම ප්‍රවේශ වෙයි. ක්‍රියා සිත අවදි වෙයි.

**උපාසිකාවː** එහෙම එකක් තියෙනවා ආර්යයන් වහන්ස. විඤ්ඤාණ මායාවෙන් කොච්චර මායම් දැම්මත් තව ඥානයකින් බලලා, සමහරවිට මටම හිනා පහළ වෙන අවස්ථා තියෙනවා මේ නටන නාඩගං බලලා.

**ආර්යයන් වහන්සː** හැබැයි ඔබතුමියට දැනෙයි කෙළෙසුත් එහෙන් මෙහෙන් මායා රැඟුම් දානවා අර තණ්හා රති රඟා අර මාර දූවරු වගේ වටේට කැරකෙනවා වගේ. නේද?

**උපාසිකාවː** මට හිතෙනවා ආර්යයන් වහන්ස, මට මේවා මෙහෙම ආවනං බුදුන් වහන්සේට කොහොම එන්න ඇද්ද කියලා.

**ආර්යයන් වහන්සː තණ්හා, රතී, රඟා කියල මේ කියන්නේ ඇත්තටම මේ ආත්මයනෙ. ආත්ම දිට්ඨියනෙ සුනු විසුනු කරල බුදුන් වහන්සේ සම්මා සම්බුද්ධත්වයට පත්වෙන්නෙ. "ත්‍රෛයිලෝක නාථ" කියල. අපි කියන්නෙ එතැනනෙ ඒ ආත්මය කියන එක.** මේ එක අරමුණකම පෙන්නනවනෙ. ඒ අරමුණෙන්නෙ කුඩු කර ගන්න ඕනි. මේ එන අරමුණේම පෙන්නනව ඕක. ඕක දකින්න ගන්න කොට හැම අරමුණකම ආත්ම දිට්ඨිය කුඩු වෙලා යනවා.

**උපාසිකාවː** චතුරාර්ය සත්‍යයම එකම අරමුණක් කියන එක පැහැදිලියි ආර්යයන් වහන්ස. ඔබ වහන්සේගේ ධර්මය නම් ආශ්චර්යයක් ආර්යයන්

වහන්ස. බුදුන් වහන්සේට පසුව අපිට මෙහෙම ධර්මයක් අහන්න ලැබීම ආශ්චර්යයක්.

**ආර්යයන් වහන්සඃ** ඇත්තටම මෙහෙම දේශනා කරන එක අපිටම ආශ්චර්යයක් වෙලා තියෙන්නෙ.

**උපාසිකාවඃ** ඔබ වහන්සේ මේ ධර්මය දේශනා කරන්නේ අවබෝධ කරගෙන ප්‍රත්‍යක්ෂතාවකින් බවට අපට සැකයක් නෑ ආර්යයන් වහන්ස. එහෙම නැතුව ඔබ වහන්සේ දේශනා කරන විදිහට අවබෝධ නොකළ කිසිම කෙනෙකුට දේශනා කරන්න බෑ, කියන එක හොඳටම තේරෙනව ආර්යයන් වහන්ස. ඔබ වහන්සේට ගොඩක් පිං ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සඃ** ඇත්තටම ඔබතුමිය පැවිදි වෙලා නෙවෙයි නෙ. ඔබතුමිය ගිහි මට්ටමේ. ඒකයි කිව්වෙ සිතක් තියෙනව නම් ඒ සිතේ මිදීමකුත් තියෙනවා. බුදුන් වහන්සේ භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා සිව්වනක් පිරිසක් පනවන්න හේතුව ඒක තමයි. සිතින් මිදීමට මොන ඇඳුම ද, ඇඳන් ඉන්නෙ කියන එක අදාළ නෑ. සිතයි මිදෙන්නෙ. ඒක තමයි ඇත්ත කතාව. ඒක තමයි අද වන විට විශාල පිරිසක් අපි සමග සාකච්ඡා කරනවා. ඇත්තටම එලොවයි මෙලොවයි එකම අරමුණක් කියල මේ අපි ම අවබෝධයට පත්වෙලා කියන එකක්. **මේ අරමුණ ඇත්ත වීම මෙලොව. අරමුණ ඇත්ත වුණා කියන්නෙ මේස, පුටු, ඇඳන් තියෙනවා. එහෙනම් ඒක මෙලොව. එලොව කියන්නෙ එහෙම දෙයක් නැති බවට මේ මොහොතෙම සත්‍ය දකිනවා. අන්න එලොව.** ඒක බුදුන් වහන්සේම පෙන්නනවා අපට සූත්‍ර වල හමුවෙනවා. බුදුන් වහන්සේ කියනවා නෙළුම් පතේ දිය බිඳ නොගැටී නොඇලී තිබෙන්නා සේ මොලොවත් එලොවත් අතර පරතරය නෙළුම් පතත් දිය බිඳත් අතර ඇති පරතරයයි කියලා. මේ කියන්නෙ එකම අරමුණේ මේ දෙපැත්තට මාරු වෙන හැටි. අපි හිතුවෙ මැරුණට පස්සෙ එලොව කියලා මරණයක් නෑනෙ. මේ සිතමනෙ ඇතිවෙලා නැති වෙන්නෙ. ඒ සිතෙමයි මෙලොවයි පරලොවයි දෙකම තියෙන්නෙ. මේ ධර්මයේ මුල මැද අග ගැළපෙනව නේද? තෙරුවන් සරණයි.

**උපාසිකාවඃ** එහෙමයි ආර්යයන් වහන්ස.

# 04

# ඔබ තුළ සිටින මාරයා ඔබේම සිතුවිලියි, මේ සත්‍ය නොදන්නා තාක් ඔබ සසරේ

**මෙහෙණින් වහන්සේ:** සිත දකින කොට සිහිය තියෙන නිසා නේද ආර්යයන් වහන්ස අපි ඒ දේ හඳුනා ගන්නෙ. හඳුනා ගන්න දේ මම හිතන දේ බාහිර නෑ කියල තේරෙන්නෙ සිහිය තියෙන නිසානෙ. එතකොට මම දකිනව ආර්යයන් වහන්ස මෙතන ආයතන කෘත්‍යයන් මිසක් දෙයක් නෑ. ඇහට වැටෙන්නෙ වර්ණයක්, කනට එන්නෙ ශබ්දයක්. ශබ්දය තුළ දෙයක් නෑ. වර්ණය තුළත් දෙයක් නෑ. ආර්යයන් වහන්ස මෙතන සිහිය ද, සිතුවිලි ද? සිතුවිලි කියල තේරුම් ගන්නෙ සිහිය තියෙන නිසා ද? මට එතන ටිකක් පැහැදිලි කර දෙනවද ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්ස:** දැන් ඕවා ඔක්කොම හිතන්නෙ සිතුවිලි වලින්නෙ. ඔය කියන ඒවා ඔක්කොම සිතුවිලි නෙ. සිතුවිලි හිතලනෙ කියන්නෙ. එතකොට එතන සිහියක් නෑ නේ ද? හිතල කියපු සේරම කියපු බවට සිහියක් නේද? දැන් මෙහෙණින් වහන්සේට තියෙන්නෙ. දැන් සිතුවිලි ඉස්සර වෙලා හිතල කියල නෙ තියෙන්නෙ. ඒ කිව්වට පස්සෙ කියපු දේට සිහියක් නේද තියෙන්නෙ. දැන් ඔය හිතල කියපු දේට දැන් සිහියක් තියෙනව නේද?

**මෙහෙණින් වහන්සේ:** එහෙමයි.

**ආර්යයන් වහන්ස :** දැන් සිහිය ද ඉස්සර වෙලා තියෙන්නෙ සිතුවිල්ල ද?

**මෙහෙණින් වහන්සේ:** සිතුවිලි

**ආර්යයන් වහන්සේ:** දැන් පැහැදිලියි නේද සිහිය වෙනයි සිතුවිලි වෙනයි කියල. දැන් හැම තැනටම ගළපගන්න ඕනි නේද? මේක තමයි හැම තැනකම වෙන්නෙ. හිතන එක වෙනයි. "ජානතෝ-පස්සතෝ" සිහිය වෙනයි. දැනෙන එක වෙනයි. සිහිය කියන්නෙ සිහියක් විතරයි. ඒක සිතුවිල්ලක් නෙවෙයි. සිතුවිල්ලක් හට ගත්ත බවට තියෙන සිහිය වෙනයි. සිතුවිල්ල වෙනයි.

**මෙහෙණින් වහන්සේ:** ආර්යයන් වහන්ස, අපි දෙයක් දකින කොට අපි ඒකට බැඳිලා බැඳිලා වගේ යන්නෙ අපිට ඒකට සිහිය නැති නිසානෙ නේද?

**ආර්යයන් වහන්සේ:** නෑ. නෑ. නෑ. මේ කියන විදිහට ගන්න ඕනි. ඒ කියන්නෙ, "සබ්බ පාපස්ස අකරණං" සියලු සිතුවිලි අකුසල්. එකම කුසලය සිහිය පමණයි. සිතුවිලි නැවත නැවත බැලුවත්, ප්‍රපංච කරත් මඤ්ඤනා කරත් අකුසල්මයි. ඒවා නැවත නැවත අනු ව්‍යංජන හැදුවත් අකුසල්මයි, සිතුවිලි හැබැයි ඒ ඔක්කොටම සිහියක් තියෙනවා. අවකාශය වෙනයි, වලාකුළු වෙනයි වගේ කුසලය තමයි සිහිය. සිහියට තමයි අසුවෙන්නෙ හැමදේම. තමන්ට මේ සිත හට ගත්ත බවට සිහියක් තියෙනවා. ඒ සිතට බැස ගත්ත බවට සිහියක් තියෙනවා. ඒ සිතට බැස ගත්තෙ නැති බවට සිහියක් තියෙනවා. බැස ගත්ත නම් ඒක මෙනෙහි කරන්න ඕනි බවට සිහියක් තියෙනවා. මෙනෙහි කරනවා. යෝනිසෝමනසිකාරය තියෙනවා. යථාභූත ඥානයෙන් මෙනෙහි කරනවා. ඔය මෙනෙහි කරන එක මනසිකාරයක් සිතුවිල්ලක්. මෙනෙහි කරපු බවට සිහියකුත් තියෙනවා. **සිහිය නොසෙල් වී පවතින අවකාශය, හැබැයි වලාකුළු තමයි මෙනෙහි කරන එක.**

එතකොට මනසිකරෝති කියන එක අපි ඒක සත්‍ය පැත්තකට හරවනවා. **අමනසිකරෝති කියන එක සිතුවිල්ලට රැවටිලා හඹාගෙන යනවා මනසිකරෝති කියන තැන සිතුවිල්ලට සිහියක් තියෙනවා.** එතකොට ඒක යථාභූත ඥානෙට ගන්න පුළුවන්. **මොකද යථාභූත ඥානයෙන් දැකපු ඒවා මිදුණ බවටත් සිහියක් තියෙනවා. මිදුණෙ නැත්නං මිදුණෙ නැති බවට සිහියක් තියෙනවා.** ඒකට කරන්න දෙයක් නෑ. ඒක කොහොමත් උපාදාන වෙනවා. ඒ කියන්නෙ තමන් තවම යෝගාවචර මට්ටමේ. තවම තමන්ට මග ඵල නෑ. මග ඵල කියන්නෙ මොකක් ද දැන් මේ යෝගාවචර

මට්ටමේ මෙනෙහි කරා යථාභූත ඥානය. නමුත් මිදුණෙ නැති බවට සිහිය තියෙන නිසා තමන් දන්නවා කෙළෙස් පවතිනවා කියල තමන්ට. එහෙම යනකොට මොකද වෙන්නෙ නැවතත් ආයෙමත් තමන්ට එහෙම සිතුවිලි හට ගන්නවා. හටගන්න කොට නැවතත් සිහිය පවතිනවා. කලින් තිබුණ තරම් සිතුවිලි බැස ගත්තෙ නෑ. ඊට වැඩිය අඩු බව දන්නවා. අන්න ඒක ආසවක්ඛයා ඥානය. කෙලෙස් අඩුවී ගෙන යන බව දන්නවා. ඊට පස්සෙ කෙලෙස් දියවී ගෙන ගිහිල්ලා නැතිවී ගෙන යන අවස්ථාව අරහත්වයි.

දැන් සිහියට අසුවෙනවා මේක යථාභූත ඥානයෙන් දැක්කා කියලා. මිදෙන්නත් පුළුවන්, මිදෙන් නැති වෙන්නත් පුළුවන්. මිදුණොතින් ඒක "මුඤ්චිතුකම්‍යතා ඥානය." මිදුන් නැති බවට සිහියක් තියෙනවා නම් යථාභූත ඥානයට ඒකත් හසුවෙනවා. ඒකයි ඥාන සම්ප්‍රයුක්ත කුසල සිතක් කියන්නෙ. ඥානය කියන්නෙ සිහිය. ඒකයි "ඥායස්ස අධිගමාය" සිහිය ඔස්සේ යන අදිගම ලැබීමක්. කවදාවත් සිතිවිලි වලින් නිවන් දකින්න බෑ. සිතිවිලි කියන්නෙ ආයතන වලට අයිති නාම රූප ටික විතරයි. ඒක විඤ්ඤාණ මායාවමයි. ඒකෙ සත්‍යයක් නෑ. **කණු දෙක හරියට ගැහුවෙ නැත්නම් පඩිපෙළ නගින්න බෑ උඩට. කණු දෙක තමයි සිහියයි යථාභූත ඥානයයි. ඒ දෙක හරියට ගහගත්තොත් පඩිපෙළ උඩට නගින්න පුළුවන්.** මේකෙ උපමාව තියෙනවා 'සබ්බාසව සූත්‍රයේ. පඩි පෙළක් ගහල උඩට නැගල ළිඳ ඉහින උපමාවත් ඒකමයි. පඩිපෙළේ කෑලි ටික ගහන එක ආයතන ටික තමයි. දෙපැත්තේ කණු දෙක තමයි මේ සිහියයි නුවණයි හොඳින් දකින්න ඕනි. කණු දෙක හරියට ගහ ගත්තොත් එන එන අරමුණ දකිනව කියන්නෙ, අර ආයතන හයට එන අරමුණු දකින්නෙ. එතන තමා පඩිපෙළේ කෑලි ටික. ඒක දැක්කොත් උඩට නගින්න පුළුවන්. එහෙම වුණොත් එතෙර වෙනවා. මෙලොවින් එතෙර වෙන පඩිපෙළ. ඉනිමගක් හදාගෙන යන ගමන මෙතන ගොඩක් කාරණා තියෙනවා පටිසේවනා, පරිවජ්ජනා හැම එකම. නමුත් මේ පඩියෙ තමා යන්නෙ. මේ ඉනිමගේ තමයි නගින්නෙ. මේක හරියට කරේ නැත්නං.

**මහ මුහුදෙ ඔරුවක් යනවා. මේ ඔරුවෙ සිදුරක් තියෙනවා. දැන් වතුර පිරෙනවා. වතුර අයින් කරනවා. ඒ කියන්නෙ බාහිර එන අරමුණු. මේක රාග සිතක්, මෝහ සිතක්, මේක ද්වේෂ සිතක්. මේක හොඳ නෑ, ඒක නිසා රාග සිතට දුක හට ගන්නවා. මේක ද්වේෂ සිතක්. මේක හොඳ නෑ, මේකට ගන්නවා අනිත්‍ය සංඥාව, අනාත්ම සංඥාව. රාග, ද්වේෂ,**

**මෝහ සිත් දකිනව කියන්නෙ, ඔරුවෙ පිරිච්ච වතුර අයින් කරනවා. කවදාවත් මේ ඔරුව ගිලෙන එක නවත්වන්න බෑ. මෙයා දන්නෙ නෑ හිල වහන්න.** අද ගොඩක් අය නිවන් දකින්න කරන්නෙ වතුර පිරෙන ඔරුවෙ වතුර අයින් කරන එක විතරයි. **හිල වහන්න කවුරුත් දන්නෙ නෑ. මොකද දර්ශනය දන්නෙ නෑ. දර්ශනය කියන අන්න ඒ කුසද්ඣදය අරගෙන ගැහුවොත් විතරයි ඔය කෙලෙස් හට ගන්න හිල වැහෙන්නෙ.** කවුරුත් නිවන් යන්නෙ නෑ එතකං. අද මුළු සමාජයම අවුල් වෙලා තියෙන්නෙ. මේ භික්ෂූන් වහන්සේලා බාහිර ඇත්ත කරගෙන කරන එකක් වත් නිවන් මග නෙවෙයි. ඒ ඔක්කොම ඔරුවෙ තියෙන වතුර අයින් කරන එකයි කරන්නෙ. ඒ ගොල්ලන්ට නිවන් මගක් හමුවෙන්නෙ නෑ. නිවන් මග හමුවෙන්නෙ මේ සත්‍ය දකින කෙනාට පමණයි. දෙයක් නැති බව, ඉත්තත්වයක් ඉත්ත අඝද්ඣදතාභාව නැති බව හරියට විග්‍රහ කරගන්න බැරි කෙනෙක්ට නිවන් මග හමුවෙන්නෙ නෑ. වැහෙනවා.

**ඉත්තත්වය කියන එක හඳුන ගන්න ඕනි. "ඉති රූපං" කියන එක හඳුන ගන්න ඕනි.** "ඉති රූපං, සමුදයෝ" ඉති රූපං අත්ත ගමන්ච" කියන එක දකින්න ඕනි. මේක හොඳින් අධ්‍යයනය කරන්න අපි මේ කියන පණිවිඩය. ඒක මේ යුගයේ බුද්ධෝත්පාදයට හේතු වෙනවා. අපි ගොඩක් අය කරන දේ අධ්‍යයනය කරනවා. ඒක නිසයි මෙච්චර හොඳට කියන්නෙ. "සබ්බ පාපස්ස අකරණං - කුසලස්ස උප සම්පදා - සචිත්ත පරියෝදපනං - ඒතං බුද්ධානු සාසනං" කියන මෙය බුද්ධෝත්පාද නාලිකාවෙන් ඕනි කෙනෙකුට ගළපගන්න පුළුවන්. එයා නිවන් දකින මාවත හදා ගන්නවා. ඒක ඒකාන්තයි. මොකද මෙතන මහා පුදුමාකාර ආශ්චර්යයක් සිද්ධ වෙනවා. ප්‍රායෝගිකව විදර්ශනා ධුරය කිසිදු පොතක් නැතිව පෙන්වනවා සියලු ධර්මයම තව කෙනෙකුට ප්‍රත්‍යක්ෂ වෙන්න. එහෙනං එයාටත් පොත් තිබ්බත් එකයි නැතත් එකයි. එයා අන්තිමට කියනවා පොතෙන් නෙවෙයි, මේක බුද්ධෝත්පාද නාලිකාවේ දේශනා ඇසීම තුළිනුයි අවබෝධ වුණේ කියලා. ඒ ප්‍රත්‍යක්ෂතාව තුළ එයා ඊට පස්සේ ධර්මය දේශනා කරනවා. ඊට පස්සේ එයාට ඕන පොතක් ගළපලා එයාට පුළුවන් ධර්මය පෙන්නන්න. මෙතනයි ධර්මය තියෙන්නෙ ඔබ කරල බලන්න. ඔබ නිවන් දකිනව නම් ඒකයි වැදගත් වෙන්නෙ. පොතේ දැනුම තිබ්බට ඔබගෙන් වැඩක් නෑ කියන එක.

එහෙනම් නිවන් දකිනව කියන්නෙ තමන්ගෙ කෙලෙස් ක්ෂය වෙලා ගිහිල්ලා, තමන් සසර දුකෙන් මිදෙන එකයි වැදගත් වෙන්නෙ. ප්‍රායෝගිකව මේ මග ගිහිල්ලා කෙලෙස් තවන වෙර ඇතුව කටයුතු කරලා නිවනින් සැනසීම ලබන එක තමයි වෙන්න ඕනි. ඉතිං මනුෂ්‍යයකුට කතා කරන්න පුළුවන් වෙන්න ඕනි සුහදව ඒ මනුෂ්‍යයාගෙ ප්‍රශ්නෙ දිහා බලන්න පුළුවන් වෙන්න ඕනි. මනුෂ්‍යයාගෙ දුකෙන් මිදෙන දේ එයාට සමීපව පහදලා දීලා සත්වයා දුකෙන් මුදවන්න ඕනි. යමෙක් මේ ධර්මය අවබෝධ වුණොත් මාන්නකං පෙන්නන්න, එයාගේ තවත් දෙයක් පෙන්නන්න යන්න හොඳ නෑ. මෙහෙණින් වහන්සේගේ ස්වභාවයටයි අපි තදින් ම ධර්මය දේශනා කරන්නේ. මෙහෙණින් වහන්ස ඒක නිහතමානීව පිළිගනියි. නැත්තං ඒක යන්නෙ නෑ ඇතුළට. ඒක මෙහෙණින් වහන්සේගේ විතක්ක ස්වභාව වලයි තියෙන්නෙ. මෙහෙණින් වහන්සේලා, භික්ෂූන් වහන්සේලා, ගිහියන් වුණත් එහෙමයි.

අපි බලන්නේ කෙනෙක්ගෙ විඤ්ඤාණයක් තියෙනවා නම්, ඒ විඤ්ඤාණයට කොහොමද ශූන්‍යතා දේශනයක්, ශූන්‍යතා අවබෝධයක් ශූන්‍යතා තත්ත්වයට පත්වීමක්, ඒ විඤ්ඤාණයට කොහොමද අපි ෆ්‍රිකෝන්ස් කරන්නෙ කොහොමද ඒ ශූන්‍යතා පටිසංයුක්ත ස්වභාවයට තවත් විඤ්ඤාණයක් සකස් කර ගන්නෙ. අපිට තියෙන්නෙ සත්ව පුද්ගල කතා නෙවෙයි. අපිට තියෙන්නෙ මේ සිස්ටම් එක ගැන යමෙක් කතා කරනව නම්, එතනත් සත්වයෙක් නෑ මෙතනත් සත්වයෙක් නෑ. මෙතන තියෙන්නෙ අපිට සිද්ධිය ගළපල දෙන එක විතරයි, මොකක්ද මේ වෙන්නෙ කියලා. ඕක සත්ව පුද්ගල භාවයෙන් අරන් වැඩක් නෑ. ඇත්තටම මේ වචනවල පවා කිසිම තේරුමක් නෑ. ආත්ම කතා සත්ව පුද්ගල කතා කොහොමත් අපට නෑ. අපි කියන්නෙ මේක හුස්ම යන එකක් විතරයි. අපි කියන්නෙ අපෙ අන්තිම හුස්ම යනව කියල විතරයි. අපි කවදාවත් මරණයක් ගැන කතා කරන්නෙ නෑ. ආර්ය භූමියේ එහෙම කතාවක් නෑ. "නිස්සත්වෝ නිජ්ජීවෝ ශූන්‍යයෝ" කියන තැන කොහෙවත් මරණයක් හමුවෙන්නේ නෑ. අනිත් එක තමයි අපි කාල ක්‍රියා කරන හැටි ගැන පමණයි කතා කරන්නෙ. මේ මග යන අයට. අපි මරණයක් ගැන කතා කරන්නේ නෑ. මේ බුද්ධෝපාද නාලිකාව සවන් දෙන කිසිම කෙනෙක්ට දුගතියක් හමුවෙන්නෙ නෑ. ඒකාන්තයෙන් ම සුගති පරායනයි. මෙතන විරාගයට යන තැන, කොහොමත් තියෙන්නෙ විරාගයක් මිස රාගයක් නෙවෙයි.

මේ මෙහෙණින් වහන්සේගෙ දෙවෙනි ප්‍රශ්නය. ඒකෙ තියෙන්නෙ මෙහෙණින් වහන්සේට, අභිනන්දන ගතිය නැති වෙන එක ගැන අවබෝධයක් නැතිකම. අභිනන්දනය කියන්නෙ, එතන තියෙන තෘෂ්ණාව, තණ්හාව, ආශාව. හැමදේටම තියෙන ආශාව නැති වෙනවා. **ඒ ආශාව නැති වෙන එක දියුණුවක් කියල දැනුණොත් විතරයි, ඒක එයාට සතුටක් බවට පත්වෙන්නෙ. එතකං එයාට කලකිරීමක් තියෙන්නෙ. ඕක තමයි මග නොමග පැටලෙන තැන. ඒක තමයි 'පටිසංඛා ඥානය.' 'සංඛාර උපේක්ෂා ඥානයට එන්නෙ ඔතන පහවුණොත් විතරයි. ගොඩක් අයට වෙන්නෙ ඔතන හිරවෙන එකයි.** කිසිම හරයක් නෑ, මෙතන කරන්න දේකුත් නෑ. කිසිම ෆිට් එකක් නෑ. අර අනුසෝතය තුළ සාමාන්‍ය ස්වභාවය තමයි තණ්හාවෙන් ඇදගෙන ගියා "පෝනෝභවිකා නන්දිරාග සාගතා, තත්‍ර තත්‍රාභිනන්දනී කියන ස්වභාවයෙන්. ඒ ස්වභාවය දැන් නැතිවෙලා යනවා. **ඒකේ තියෙන ආශ්වාදී ගතිය නැතිවෙලා යනවා. ආයතන පිනවීම නැතිවෙලා යනවා. ඒවයේ තියෙන උද්දීපනය 'උජ්ජිතදි' කියන එක නැතිවෙලා යනවා. එතකොට මොකද වෙන්නෙ රාගය නැතිවෙන කොට විරාගයටයි එන්නෙ. 'නිබ්බිදන්ති විරාගන්ති' 'නිරෝධන්ති, පටිනිස්සග්ගානුපස්සි' කියන ගමන.** තමන් අකමැති නම් නිවන් දකින්න මොකද කරන්නෙ

තමන් බොරුවට නිවන් මග යනව කියන්න බෑනෙ. එහෙනම් මේ යන්නෙ මැරෙන්න නෙ. **එහෙනම් මැරෙන්න කැමති වෙන්න ඕනි. ඔතන අපි මරණය භාර ගන්නවා. මරණය භාර ගත්තොත් විතරයි නිවන් දකින්නෙ. ඔතන මරණය කියන්නෙ ආයතනවල මරණය.** සළායතන නිරෝධය. ඒකෙදි තව පිනවන්න හම්බවෙන් නෑ. ඔතනදි තව කඩඉමක් තියෙන්නෙ. වැටක් තියෙනව පනින්න. වැට පැන්නොත් වෙන්නෙ අනිත් පැත්තට පැනපු ගමන් මහ ශාන්ත සුවයක් දැනෙනවා. ශාන්ත සුවය කියන එක තවත් එක සුවයක් නෙවෙයි. මේ **සිතුවිල්ලෙ තිබුණු වෙහෙස 'දර්ථය' නිවීම තුළ ඇතිවන සැහැල්ලුවයි. අමුතුවෙන් ලැබෙන දෙයක් නෑ. මෙතන තියෙන්නෙ අර අල්ල ගත්ත දෙයක් තිබුණ නම් අතහැරීමක් පමණයි.** ඒකයි ආත්මය තමයි මාරයා කියන්නෙ. ආත්මයේ සංඥාව තමයි මාරයා. මාරයා ඇහුවා කියන්නේ ඔබට සතුටුද මහණ, කුමක් ලැබුණට ද? අමුතුවෙන් සතුටක් කියල ලැබෙන එකකුත් නෙවෙයි මේ ශාන්ත සුවය කියන එක. එහෙනම් අහනවා මහණ, ඔබට දුක ද කියලා.

කුමක් නැති වුණාට ද කියල අහනවා. **ඒ කියන්නෙ මෙතන තිබුණ දේකුත් නෑ නැති වෙන්න.** දෙයක් කියල දෙයක් කොහෙවත් තිබුණෙ නෑ. **අපි හදා ගත්ත දෘෂ්ටියක් අපෙන් අතහැරෙනවා විතරයි.**

එහෙම නම් සතුටු වෙන්න දේකුත් නෑ. දුක් වෙන්න දේකුත් නෑ. **නමුත් ඒක සැහැල්ලුවක් වෙනවා. ඒකට හේතුව ගින්න නෑ. තමන් දියුණුව කියල කියන්නෙ අන්න ඒකටයි.** ඒ කියන්නෙ එතන විරාගි ස්වභාවය හඳුන ගත්තම 'මුඤ්චිතු කම්‍යතා ඥානය' එනවා. හැම එකක් ම මිදෙනවා කියලා. මාර්ගය හරි කියලත් දන්නවා. කෙලෙස් ක්ෂය වන බවත් දන්නවා. තවත් මොනවද තියෙන්නෙ. දැන් හොඳටම දන්නවා ඊළඟට තියෙන්නෙ 'සංඛාර උපේක්ෂාව' කියලා. ඒ කියන්නෙ අරහත්වයටයි යන්නෙ කියලා. එහෙනම් කෙලෙස් ක්ෂය වන මග හරි. යන මාවත ඔක්කොම සුගතියටයි තියෙන්නෙ ඝන සංඥා සුකුම වෙනවා. **ඝන සංඥා කිව්වෙ ගින්න. මෙතන ඝන සංඥා කියන්නෙ අපි පිනවන බන්ධන බලය. ආත්මීය බන්ධන බලය, ආත්මීය දැනීම. ලෝකයට බැස ගත්ත ලෝක සංඥා ඝන සංඥා කියන්නෙ.** ඒකමයි චිත්තාරෝපණය කියන්නෙ. චුම්භක ආරෝපණ බලය. ඒ බලයමයි ඝනට තියෙන්නෙ. ඒක දියවීගෙන යනවා. නැවත ආරෝපණ බලයක් නෑ. තණ්හාවත් නෑ. "තණ්හාව නමැති වඩුව - තා මා දුටිමි." "තාට මේ නිවස සාදන්න නැවත මා ඉඩ නොදෙමි." අන්න "ඛීණා ජාති උසිතං" "නා පරං ගච්චං" කියන තැනට එනවා. තේරුණා නේද?

**මෙහෙණින් වහන්සේ:** එහෙමයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සඃ** පෘථග්ජනයා දියුණුව දකින්නෙ නොදියුණුව විදිහටයි. **පෘථග්ජන භූමියේ තාම ඉන්නවා නම් ඔතෙන්ට ආපු කෙනෙක් එයා හිතනවා ඒක පිරිහීමක් කියලා. එයා තම පෘථග්ජනයි. හැබැයි ඔතන ආර්ය භූමියේ දී සත්‍ය ඥානය හොඳින් ඇති වුණොත් දැනුමට හරි ඕක දකිනව දියුණුවක් කියලා. ඒක සත්‍ය ඥානය තුළිනුයි එන්නෙ. ඒකයි කිව්වෙ කෘත්‍ය ඥානය තුළින් සත්‍ය ඥානය කරන්න බෑ කියලා. සත්‍ය ඥානය පිරිසිදු කරගෙන හොඳට දැනගෙන විශුද්ධියට ගියාට පස්සෙයි, මෙතනට එන්න ඕනි කියලා සත්‍ය ඥානය තුළින් තමන්ට වෙන දේ අත්දකිනවා එච්චරයි.** එතනදි එයා දන්නව මේක දියුණුවක් කියලා. එහෙම නැත්නම් එයාට ඒක දැනෙන්න වෙන විදිහක් නෑ. එයා

හිතනවා එයාට වැරදුණා කියලා. එහෙම වුණොත් එයා දඟලනවා. ඔරුව පෙරළෙනවා. ඒක භයානකයි. ඒකයි මේකට යන මාවත ලිපිනය දැනගෙන යා යුතු ගමනක් කිව්වෙ. ඒක දන්නව නං එයා දන්නවා මේක දියුණුවයි කියලා. දැන් මෙතන කිසිම හරයක් නෑ. මෙතන නිබ්බිදාව, විරාගය ඔක්කොම තියෙනවා. එයාට තේරෙනවා ධර්මය තුළ මොකක් ද මේ නිබ්බිදාව තියෙනවා, විරාගය තියෙනවා, නිරෝධය තියෙනවා. එහෙනම් එතන තියෙන්න ඕනි **රාගය නෙවෙයි විරාගයනෙ.** එහෙනම් එතන දැනෙන්න ඕනි ආශාව ඒවා මේවා එහෙම තියෙනවා නම්, ඒක නැතිවෙලා ගිය ස්වභාවයක්. ඔව් ඒක තමා ඕනි.

එතකොට ඕක කොහෙන්ද කණපිට ගහන්නෙ, ඕක දියුණුවක් කියල දැනෙන්න ඕනි. ඕක සංඥාවක් ආපු ගමන් දියුණුවක් කියල අන්න එනව ප්‍රබෝධයක්. ඔන්න ඔතන තමයි නිවන් මගට හැරෙන සංධිස්ථානය. ඔතන ප්‍රමෝදයක් ඇති වෙන්න හේතුව, මේක තමයි විරාගි ස්වභාවය. ඒකම තමයි දියුණුව කියල එයාට එනව සංඥාවක්. දැන් ඒක තමයි නිවන් දකින්නට දියුණු වෙලා තියෙන තැන. හැබැයි ඒකත් එක්කම තමයි අර සංඛාර උපේක්ෂාව ඇතිවෙන්නෙ. 'උපේක්ෂාවට' පත්වෙනවා. ඒක සියලු ආයතන වල උපේක්ෂාවක්. අන්න එතන තමයි නිවන හමුවෙන්නෙ. අන්න එතන හරියට වැට කඩුල්ලක් පැන ගන්නවා වගේම තමයි. කටු කම්බි ඇණ ගන්නෙ නැතිව හිමීට ඔතනින් පැන ගන්න. පනිනවා කිව්වට එහෙම දෙයක් නෙවෙයි. නමුත් අපිට උපමාවක් විදිහට පෙන්නන්න පුළුවන්. හැබැයි **එතන හොඳටම දැනෙනවා පුදුමාකාර ශාන්ත ස්වභාවයක්. එතැනින් තමයි එයා දැනගන්නෙ කලින් තිබුණෙ විහරණය. දැන් තමයි සමාපත්තිය කියලා. විහරණය පහු කර ගන්නෙ නැතිව සමාපත්තියට එන්නත් බෑ.** ඒ කියන්නෙ කන්දක් නැග්ගට පස්සෙ තැන්නක් හමුවෙනවා, හැමදාම අනන්තය දක්වා යන කඳු නෑ කොහෙවත්. එහෙනං අවසානයක් තියෙනවා කන්දක් නැගලා. අන්න මුදුනට නැග්ගට පස්සේ වටේ ඔක්කොම පේනව ලස්සනට. පුදුම සැහැල්ලුවක් දැනෙනවා. ඉතිං ඒකට මහා පුදුමාකාර පරිණත භාවයක් තියෙන්න ඕනි. එහෙම නේද මෙහෙනින් වහන්ස?

**මෙහෙණින් වහන්සඃ** එහෙමයි. ආර්යයන් වහන්ස. ඊයේ මම දේශනාවක් අහන කොට කඳුළු එන තරං හිතට සතුටක් දැනුණා.

**ආර්යයන් වහන්සෑ:** ඒ කියන්නෙ මෙහෙණින් වහන්ස මෙච්චර කාලයක් පිරිසිදු ධර්මයක් ඇහුණෙ නැති ප්‍රශ්නෙනෙ ඔය තියෙන්නෙ. අපි සෘජුව අභීතව ප්‍රකාශ කරනව නෙ. ඒක නිසා අපි සෘජුවම සූත්‍රය කියනවා. සූත්‍රයත් එක්ක, බුදුන් වහන්සේගෙ වචනෙත් පෙන්නනවා. වචනෙත් එක්ක සෘජුවම ධර්මය ගළපලා පෙනන්නවා. මෙතන හරි සුන්දර කතාවක් තියෙන්නෙ. තෙරුවන් සරණයි.

**මෙහෙණින් වහන්සෑ:** එහෙමයි, ආර්යයන් වහන්ස. නමස්කාර වේවා!

# 05

# ඔබ දන්නෑ ඔබ නිවන් දැකපු බව, සිතුවිලිවලින් මිදුණු තැනයි නිවන

**උපාසිකාව:** තෙරුවන් සරණයි ආර්යයන් වහන්ස. ධර්ම මාර්ගය වඩා ගන්න කුමක් ද කළ යුත්තේ කියලයා මට මේ දැනගන්න ඕනි.

**ආර්යයන් වහන්ස:** ඔබතුමිය බුද්ධෝත්පාදෝ දේශනා කීයක් විතර ඇහුවද?

**උපාසිකාව:** දේශනා 2ක් 3ක් විතර. තවත් දේශනාවක් අහලයි මේ කතා කරන්න ගත්තෙ ආර්යයන් වහන්ස. මේ මාර්ගය වඩන්න පළමුව කළයුත්තේ සිත දිහා බලන් ඉන්න එක මට පොඩ්ඩක් පැහැදිලි කරන්න පුළුවන්ද ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්ස:** නෑ... නෑ... ඔබතුමිය තව දේශනා අහගෙන යන්න ඕනි. ඒ කියන්නේ තව දේශනා ඔබතුමිය අහගෙන යන කොට ඔබතුමියට හොඳ අවබෝධයක් ඇති වෙනවා. දර්ශන සමාපත්තිය තමයි මේ සමාජයට ගිලිහිලා තියෙන බුද්ධ දර්ශනය. මේ බුද්ධ දර්ශනය මතු කරල දෙන්න තමයි අපි උත්සාහ කරන්නෙ. ග්‍රන්ථ ධුරය තුළින් විදර්ශනා ධුරය මතුකර ගන්න අද අපේ හාමුදුරුවරු අදක්ෂ වෙලා තියෙනවා. නිර්මල ශ්‍රී සද්ධර්මය දේශනා කරන්න අද බොහෝ අයට හැකියාව නෑ. හේතු ඵල දහම සැඟව යනවා. අපට අවශ්‍ය වෙලා තියෙනවා අද අවබෝධයක් ඇතුව ඒක මතු කරල දෙන්න. මෙයයි විය යුත්තේ. **මෙයයි නිර්මල ශ්‍රී සද්ධර්මය. මේ විදිහට මෙය ප්‍රායෝගික විය යුතුයි. ප්‍රත්‍යක්ෂ වෙන්නෙ එවිටයි. එවිටයි සසර දුකින් මිදෙන්නෙ කියන එක, එවිටයි නියත සම්බෝධි පරායන වෙන්නෙ කියන එක පෙන්නල දෙන්න ඕනි.**

**උපාසිකාවඃ** ආර්යයන් වහන්ස, අර සිත දිහා බලන් ඉන්න එක පොඩ්ඩක් මට පැහැදිලි කරල දෙනවද? අර සිහියෙන් ඉන්නව කියන එක.

**ආර්යයන් වහන්සඃ** දැන් ඔබතුමියට කියන්න දෙයක් තියෙනවා. මේ දර්ශන ඥානය නැතිව සිත දකිනව කියන එක වෙන්නෙ නෑ. අපි මේක වචනෙන් දෙකෙන් කිව්වට ගොඩක් අයට තේරෙන්නෙ නෑ. දර්ශන ඥානය කියන්නෙ ඇත්තටම බුදුන් වහන්සේ ලෝකෙට හෙළි කළ 'බුද්ධ දර්ශනය.' ඒ බුද්ධ දර්ශනය අවබෝධ වුණොත් විතරයි ඇත්තටම මේ සිත කියල දෙයක් නැති බව අවබෝධ වෙන්නෙ. මෙතන ආත්මයක් සත්වයෙක් පුද්ගලයෙක් අපට හමුවෙන්නෙ නෑ. හැබැයි එන අරමුණෝ මේක දකින්න ඕනි.

**උපාසිකාවඃ** දකිනව ද? අවබෝධයට පත් වෙනවද? එතන දකින්න ම ඕනි ද?

**ආර්යයන් වහන්සඃ** නෑ... නෑ... **දකිනවා කියන්නෙ මස් ඇහෙන් බලන එකක් නෙවෙයි. 'ධම්ම චක්ඛුසය'** ඒ කියන්නෙ **මේක නුවණට හසුවෙන්නෙ. ඒ කියන්නෙ මේක ආධ්‍යාත්මික ගමනක්. මේක ප්‍රඥාවටයි හසුවෙන්නෙ. "ප්‍රඥාවන්තං ආයං ධම්මං- ඥායං ධම්මං- දුප්පන්නස්ස."** කියන තැනට එන්න ඕනි. ඒ මහා ප්‍රඥාව අවදි වෙන්න නම් මේ සිත හැදෙන හැටි අවබෝධ වෙන්න ඕනි. විඤ්ඤාණ මායාව, මේ සිත කියන්නෙ මැජික් එකක්. මේ මායාවක අපි අතරමං වෙලා අපි ඉන්නෙ. ඇත්තටම මේ ජේනව නෙවෙයි අපි සිතුවිලිවල ඉන්නෙ. ජේනව නෙමෙයි හිතනවා. අපිට මේ මායාව අවබෝධ කරන තාක් කල් නිවනකුත් නෑ, නිවන් මගකුත් නෑ. එහෙනම් මේ විඤ්ඤාණ මායාව, මොකක්ද මවන ආකාරය පිළිබඳ අවබෝධ කරගැනීමයි යථාභූත ඥානය කියල කියන්නෙ.

**උපාසිකාවඃ** එහෙමයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සඃ** "යථාභූත ඥානය" කියන එක, මේ හිතට එන අරමුණු දකින්න කලින්, හිතට එන අරමුණ හැදෙන්නෙ කොහොමද කියල අවබෝධ කර ගන්න එක. එතන තමයි "මහා නිධාන සූත්‍ර", " සංචේතනා සූත්‍ර", "සලායතන සූත්‍ර", "ස්කන්ධ සූත්‍ර", "මදුපිණ්ඩික සූත්‍ර"

මේ හැම එකකම බුදුන් වහන්සේ පෙන්නන්නෙ "ස්කන්ධානං පාත්‍රිභාවෝ- ආයතනානං පටිලාභෝ - අයං උච්චති ජාති" කියන තැනින් අපි පුංචි දරුවෙක් විදිහට මව්කුසෙන් එළිය දකින කොට අපිට ඊර්ෂ්‍යාව, තණ්හාව, ක්‍රෝධය, වෛරය කියල එකක් තිබුණෙ නෑ. අන්න මුලින් ම තණ්හාව ඇතිවුණේ කොහොමද කියල අපි දකින්න ඕනි. පුබ්බේ නිවාසානුස්සති ඥානය නැතිව කවුරුවත් නිවන් දකින්නෙ නෑ. එහෙනම් පුබ්බේ නිවාසානුස්සති ඥානය කියන්නෙ මේ ගිය ආත්මෙ ලබන ආත්මෙ එහෙම එකක් නෙවෙයි. මේ සිත හැදෙන්නෙ කොහොමද කියල පෙර සිත් කඳ පිළිවෙත් දකින්න ඕනි.

අන්න එතන **පළවෙනි සිත හැදුණෙ කොහොමද කියල බලන්න ඕනි. ඇත්තටම අපි පුංචි දරුවෙක් දිහා බලාන හිටියොත් ඒ දරුවට ඊර්ෂ්‍යාවක්, වෛරයක්, ක්‍රෝධයක්, තණ්හාවක් පනවන්න බෑ. ඒ දරුවා 'ප්‍රභාෂ්වර සිත.' සංඛිතේ පසුව ඒක කිළිටි වෙන්නෙ කොහොමද කියල බලන්න ඕනි.** එතකොට අපිට පේනවා මේ ශබ්ද, වර්ණ තමයි මේ දරුවට එන්නෙත්. ශබ්ද, වර්ණ, උණුසුම, සීතල, තද ගතිය. ශබ්ද, වර්ණ, ගන්ධ, රස, උණුසුම, සීතල, තද ගතිය කියන මෙන්න මේවා තමයි සෙන්සස් වල ස්පාර්ක් වෙන්නෙ. සෙන්සස් කියන්නෙ ආයතන. ඒ ආයතන වල ප්‍රසාද වෙන එක. ඒ ප්‍රසාද වෙන ඒවා වේගෙට තත්පරයට කෝටි වාරයක් වේගයෙන් ස්පාර්ක් වෙනවා. ශබ්දෙට, වර්ණෙට, ගන්ධෙට, රසට. මේවා ඔක්කොම මෙතන හැදෙන ඒවා මිසක් එළියෙ තියෙන ඒවා නෙවෙයි. වර්ණ කොහෙවත් එළියෙ තියෙන ඒවා නෙවෙයි. අපේ 'අක්ෂි කාචවල' නාභිගතවෙන යෂ්ටි සෛල කේතු ශෛලවල ස්වභාවය අනුවයි. **එළියේ කොහෙවත් වර්ණ තියෙනව නෙවෙයි. අපි හදාගෙනයි බලන්නෙ.** සමහර අයට රතුපාට පෙන්නෑ. සමහර අයට කොළ පාට පේන් නෑ. කෙන කෙනාගෙ පෙනීම කෙන කෙනාගෙ ඇහේ තියෙන දක්ෂතාව අනුවයි. එහෙනම් ඒ එළියෙ තියෙන එකක් නෙවෙයි. මේ හදාගෙන මැවෙන එකක්. මේසයක්, පුටුවක්, ඇඳක් කියන එකක් අපේ මේ ඇහැට ආවෙ නෑ. ඇහැට ආවේ වර්ණ හැඩතලයක් විතරයි. මේස, පුටු කියන්නෙ ශබ්දයක්. අන්න පුංචි දරුවා මොන්ටිසෝරි යන කොට පුතේ මේ කහපාට, රතුපාට, නිල්පාට කියනකං අවුරුදු හතරක් ගියත් මේ දරුවා පාට වෙන් කරල දකින්නෙ නෑ. එහෙනම් වර්ණ වෙන් කරන්නෙ ශබ්දයෙන්. කහ කියන ශබ්දෙ දැම්මම කහ වෙන් වෙනවා.

රතු කියන ශබ්දෙ දැම්මම රතු වෙන් වෙනවා. කහ, රතු, නිල්, යෙලෝ, රෙඩ්, බ්ලූ කියලා පුංචි මොන්ටිසෝරි යන දරුවට උගන්වනවා කියන්නෙ ඒ දරුවගෙ ඇහැට වර්ණය දීලා කනට ශබ්දය දෙනවා. එතකොට ඒ දෙක එකට එකතු වෙන එක තමයි අපි කෝල් එකක් දීලා කහ කිව්වත්, කහපාට මැවෙනවා ඒ දරුවට. ඒ කියන්නෙ ශබ්දෙට වර්ණය එනවා. ඒකයි **වර්ණයයි, ශබ්දයයි. නාමය කියල කියන්නෙ නම් කරන ලද දේ. නම් කරන්න ඕනි ශබ්දෙකින්. ඒකයි ශබ්දය තමයි නාමය කියන්නෙ. සතර මහා භූතයා ඇසුරු කරගෙන එන ප්‍රසාද වීමයි රූපය කියන්නෙ.** එහෙනම් නාම රූප කියන්නෙ ශබ්ද වර්ණ එකතු වෙන එකමයි. හැබැයි ඒක ඒ විදිහට ගත්තත් අනිත් 'මුත' කියන එකත් දිට්ඨ, සුත, මුත කියල අනිත් ප්‍රසාදත්, මේ එකම මොහොතෙ එකතු වෙනවා.

අම්මගෙ සුවඳිනුත් අම්මගෙ රූපෙ මැවෙනවා. ඒ කියන්නෙ අම්මගෙ සුවඳිනුත් නාම රූප එකට එකතු වෙනවා. ඒ කියන්නෙ **එකම මොහොතෙ මේ මොහොතේ ඇසට, කනට, දිවට, නාසයට කයට මේ සියල්ලම ස්පාර්ක් වෙන ඒවා, එකට එන එකයි මන කියල කියන්නෙ. තත්පරයට කෝටි වාරයක් ශබ්දයයි, වර්ණයයි මේවා සේරම එකට ස්පාර්ක් වෙනවා. ඒවට එකට එන එකයි ස්පර්ශය කියන්නෙ. ඒකයි "තදංග ඵස්ස පච්චයා" කියන්නෙ.** පොත කියන කොට බිත්තිය කියන කොට කහපාට කියන කොට මොන ශබ්දය කිව්වත් වර්ණය එකතු වෙලයි තියෙන්නෙ. ඒකයි ශබ්ද තරංගයි වර්ණ තරංගයි එකට එකතු වෙලා චිත්ත තරංගයක් හැදෙනවා. ඒක තව විදිහකින් කියනව නම් තරංග විදිහකට පෙන්නන්නත් පුළුවන්. ශබ්ද තරංගයි වර්ණ තරංගයි එකතු වෙලා හැදෙන චිත්ත තරංගය අර තරංග දෙකම එකතු වෙලා හැදෙන තව තරංගයක් විතරයි. චිත්ත තරංගය දෙයක් කියල දැනීමමයි ආත්මය කියල කියන්නෙ. ඒකයි දැන් මෙතන තියෙනව කියල ගත්තොත් දෙයක් කියල ගත්තොත් තියෙන බව දැනෙන බව 'ඉති රූපං' කියන එක. ඉත්ත ධීථිය, තියෙන රූපයක් කියල ගත්ත එක. ඒක දෘෂ්ටියක්. තියෙන එකක් නෙවෙයි. ඒක සංඛාරයක්. හිතකයි සකස් වෙන්නෙ. ශබ්දයයි, වර්ණයයි ප්‍රකට වෙන්නෙ.

***උපාසිකාව:*** ඔබ වහන්සේගේ දේශනා අහන කොට ඒක තේරෙනවා. ඒ ගැන අවබෝධයක් තියෙනවා.

**ආර්යයන් වහන්සේ:** ආත්මය හැදෙන එකයි මෙතනදි වැදගත් වෙන්නෙ. **ශබ්ද වර්ණ හේතු. ඵලය ආත්මය. ආත්මය කියන්නෙ තියෙන බව දැනීමයි. තියෙන බව දැනෙන ගතිය.** අන්න ඒක තමයි "බජ්ජනීය වග්ගයේ" පෙන්නන්නෙ. මේ ආත්මය කියන්නෙ කොහෙවත් තිබ්බ්ච එකක් නෙවෙයි. මෙතන ශබ්ද වර්ණාවලින් ම හැදෙන එකක්. අන්න හේතුව නම් ශබ්ද වර්ණ. ඵලය නම් ආත්මයයි. ආත්මය කොහෙවත් තියෙන එකක් නෙවෙයි. ඇස කියන්නෙ පේන බව. පෙනුණෙ බිත්තිය. බිත්තිය පොත පේනව කියන්නෙ මස් ඇහැට නෙවෙයි, පේනව කියන්නෙ "චක්ඛුං නිච්චංවා අනිච්චංවා" "අනිච්චං භන්තේ" කියන්නෙ මේ බිත්තිය පොත කියන එකටයි. එහෙනම් බිත්තිය පොත කියල එකක් එළියෙ කොහෙවත් නෑ. ශබ්දයක්. ශබ්දයක් එළියෙ කොහෙවත් නෑ. එහෙනං ඒක සංඛාරයක්. එහෙනං ඒක චිත්තයක්. එහෙනම් ඒක සංඛාරා.

සබ්බේ සංඛාරා කියන්නෙ සිතුවිලි. එහෙනම් ඒවා දෙයක් වගේ දැනෙන එකයි කාය සංඛාර, මනෝ සංඛාර, වචී සංඛාර කියල කියන්නෙ. **අපි අඬන කොට එන ශබ්දය වචී සංඛාර, ඒ අඬන ක්‍රියාවලිය කාය සංඛාර. අඬන කොට එන දුක මනෝ සංඛාර. ඒ කියන්නෙ මෙතන ආත්මයක් පෙන්නනවා.** දැන් අඬන ශබ්දය තුළ කෙනෙක් ඉන්නවා. මමයි අඬන්නෙ. **අඬන ක්‍රියාවලියට කෙනෙක් ඉන්නවා. එහෙනම් මමයි ඇඬුවෙ. අඬන වේදනාවට කෙනෙක් ඉන්නවා. මටයි දුක. අන්න මම කියන එක එනවා.** "ඒතං මම" අඬන දේ. ඒ කියන්නෙ පොත තියෙනව නම් මාත් ඉන්නවා. " ඒතං මම - 'එසෝ හමස්මිං'- 'මේසෝ අත්තා" මම, මගේ, මගේ ආත්මය කියන්නෙ. ඒක තියෙනව නම් මාත් ඉන්නවා. ඒතං මම, ඒසෝ හමස්මිං- මගේ, එහෙනම් ආත්මෙකුත් තියෙනවා 'එමේසෝ අත්තා' දැන් කොහෙද ආත්මය තියෙන්නෙ ඔබතුමියගෙ?

**උපාසිකාව:** තියෙනව කියල හිතෙනවනෙ.

**ආර්යයන් වහන්සේ:** කොහෙද තියෙන්නෙ?

**උපාසිකාව:** සිතිවිලි විතරනේ, නේද ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** නෑ. **ඔබතුමියගෙ සිතට මොනවද දැන් පහළ වුණේ අරමුණ. අන්න ඒ අරමුණයි ආත්මය කියන්නෙ. අරමුණේ මයි**

**ආත්මය තියෙන්නෙ. අරමුණටයි ආත්මය කියන්නෙ. අරමුණටයි "ක්ෂණ සම්පත්තිය" කියන්නෙ. ඒ ක්ෂණය අවබෝධ කළොත්, ආත්මය එතනම අවබෝධ කළා වෙනවා. ඒකයි "සක්කාය දෘෂ්ටිය" කියන්නෙ.** මේ ඔක්කොම තියෙනවා ශබ්ද, වර්ණ වලින් හැදුණ පොත කියල දෙයක් තියෙනව කියල ගත්ත එකමයි ආත්මය. හැබැයි ආත්මය කියන්නෙ කොහෙවත් තියෙන එකක් නෙවෙයි. දැන් අපි හිතමු මේ අරමුණ. දැන් ඔබ තුමියට මොකක් ද පේන්නෙ. ඔබතුමිය මොනවද දැන් ඉස්සරහ දැක්කෙ. එකපාරට පේන්නේ එකයිනේ.

**උපාසිකාවඃ** පොතක් තියෙනවා. පොත පේනවා.

**ආර්යයන් වහන්සඃ** අපි හිතමු පොත. පොත කියන එක අරමුණක්. අන්න දැන් සිත හඳුන ගන්න. අපි හිතමු අඹ ගහේ කොළ 5000ක් තිබ්බට එක කොළේක නාරටි වින්‍යාසය බැලුවොත් අඹ ගහේ කොළ 5000ම බැලුවා වෙනවා. එහෙනම් එක සිතයි අපට දැකගන්න ඕනි. ඒකයි "ක්‍ෂණ සම්පත්තිය" කියන්නෙ. එහෙනම් "දුර්ලභං සද්ධර්ම ශ්‍රවණං", "දුර්ලභං මනුස්සත්තං", "දුර්ලභං ක්‍ෂණ සම්පත්ති." මෙන්න මේ සිත දකින්නයි බැරුව ඉන්නෙ. ඒ කියන්නේ මේ එක සිතයි අවබෝධ කරන්න තියෙන්නෙ නිවන් දකින්න. **සිත් පරම්පරාවම අවබෝධ කළා වෙනවා එක සිතක් දැක්කම. එතකොට මේ එක සිතකමයි ආත්මය තියෙන්නෙ. ඒක දෙයක් කර ගත්තොත්, පොත දෙයක් කරගත්තොත්.** දැන් අපි හිතමු චිත්‍රයක අපි පොතක් අඳිනවා. සුදු කොළේක පොතක් අඳිනවා. එතකොට එතන පොතක් තියෙනව නේද? දැන් එළියෙත් පොත තියෙනවා නේද? දැන් ආයෙමත් චිත්‍රයේ තිබුණ පොත මෙනෙහි කරන්න. චිත්‍රයේ ඇත්තටම පොතක් කියල දෙයක් තියෙනවද? චිත්‍රයේ ඇත්තටම පොතක් තියෙනවා. හැබැයි පොතක් කියල දෙයක් නෑ.

ඇත්තටම එළියෙ තියෙන පොත, ඇහැට ආව වර්ණයක්. චිත්‍රයේ ආවෙත් ඇහැට වර්ණයක්. අපි හිතමු **අපි කණ්ණාඩියකින් දැක්කා කියල ඔය එළියෙ තියෙන පොත. කණ්ණාඩියේදීත් ඇහැට ආවෙ වර්ණයක්. ඇහැට ආපු වර්ණය, කණ්ණාඩියේ තිබුණත් එකයි, චිත්‍රයේ දැක්කත් එකයි, එළියෙ තිබ්බත් එකයි. ටී.වී . එකේ තිබුණත් එකයි. ඇහැට ආවෙ වර්ණයක් විතරයි. එහෙනම් දෙයක් ආවෙ කොහෙන් ද? දෙයක් තිබුණෙ නෑ කවදාවත් කොහේවත්. එහෙනම් ඇහැට ආවෙ හැමදාම වර්ණයක්**

**විතරයි.** "දිට්ඨේ දිට්ඨ මත්තං" කියන්නෙ "දුටුවා නම් දුටුවා පමණයි", "දුටු දෙයක් නැත කිව්වෙ අන්න ඒකයි. ඇහැට ආපු වර්ණය තුළ දෙයක් තියෙන්න බෑ. දෙයක් කියන එක මෙතනින් හැදුණෙ. මේක තුළ ඒ කියන්නෙ මේ ශබ්ද වර්ණ එකට එකතු වෙලා ඉත්තත්වයේ වේගය තුළ නැවත නැවත ඒම නිසා "රූපං රූපත්තාය සංඛතං අභිසංකරෝති" නැවත නැවත නැවත නැවත කාටුන් එක හදනව වගේ එකම රූපෙ වැටෙන කොට වැටෙන කොට දෙයක් බවට පත්වෙනවා. ඒකයි **"ඉත්තභාවය" කියල කිව්වෙ, ආත්මය.** තියෙන දෙයක් හැදුණා භවයක් හැදුණා. අන්න "අජ්ජෝසාය තිට්ඨති" බැස ගත්තා. "යාරූපේ නන්දි", අන්න ඒකට බන්ධනයක් ආවා රූපෙට "තධූපාදානං භවෝ" උපාධාන වුණා. භවයක් හැදුණා. දෙයක් තියෙනවා.

**පොත කියන භවය හැදුණා. මේ මොහොතමයි මේ අරමුණ. මේ ක්ෂණයමයි. ඔය පටිච්ච සමුප්පාද ධර්මයම තියෙන්නෙ මේ ක්ෂණයමයි. මේ අරමුණේමයි, එතකොට චතුරාර්ය සත්‍යයත් තියෙන්නෙ. දෙයක් කියල ගත්තොත් ඒකමයි දුක, දෙයක් කියල ගැනීමමයි දුක. ඒකමයි "දුක්ඛ සත්‍යය", ඒකමයි සමුදය සත්‍ය. ඒකමයි ඒකට තියෙන බන්ධනය. එහෙනම් දෙයක් කියල අපට හමුවෙන්නෙ නැත්නම් ශබ්ද වර්ණ කියල වෙන් වුණොත්, ඒකයි "නිරෝධය." එය දැකීමයි "මාර්ග සත්‍යය."** චතුරාර්ය සත්‍යය අවබෝධය මෙතනමයි. මෙතනමයි නිවන් දකින්නෙ. පටිච්ච සමුප්පාදයත් මේ අරමුණේමයි. **අවිද්‍යාව කියන්නේ දෙයක් කරගැනීමයි. නැති දෙයක් දෙයක් කරගැනීමයි.** ඒකමයි සංඛාර කියල කියන්නෙ. ශබ්ද වර්ණ එකතු වෙන එකයි, නාම රූප එකතු වෙනවා කියන්නෙ. අන්න "අවිද්‍යා පච්චයා සංඛාර", "සංඛාර පච්චයා විඤ්ඤාණ" කියන්නෙ. දැන ගැනීම පොතමයි. එහෙනම් ඒකමයි නාම රූප. විඤ්ඤාණ පච්චයා නාමරූප." ඒකමයි සළායතන, ඇස කියන දේ මේ කෘත්‍ය සිද්ධ වෙන ආයතනය. ඒකයි "නාම රූප පච්චයා සළායතන", "සළායතන පච්චයා ඵස්ස" කිව්වෙ මනෝ විඤ්ඤාණයෙන් දෙයක් කරල ගත්ත එකයි. "ඵස්ස පච්චයා වේදනා" අර තණ්හා උපාධාන, භව, එතනමයි භවය හැදුණෙ, දෙයක් වුණා. එතනමයි ජාති ජරා මරණ ශෝක පරිදේව සේරම තියෙන්නෙ දෙයක් හැදුණ තැනයි. පටිච්ච සමුප්පාද ධර්මය අවබෝධ කරනවා කියන්නෙ, මේ මොහොතේ මේ ක්ෂණයේ මේ අවබෝධය ඇතිවන එක ක්ෂණ සම්පත්තියයි. අන්න "එක් ක්ෂණික

සිතක" "උදය වැය" දකින්නාට සම්මුති මරණය බොරුවක් වෙනවා. **හැම මොහොතෙම අපි ඉපදෙනවා මැරෙනවා. ක්ෂණයක් ක්ෂණයක් පාසා ඉපදෙන මැරෙන එක දකින කෙනාට සම්මුති මරණය බොරුවක් වෙනවා.** මරණය කියන්නෙ අර හට ගත්ත සිතේ ඇතිවීමයි නැතිවීමයි. මැරෙන්නෙ සිතයි. කය නෙවෙයි. කය වළලන්නෙ සිත නැති නැති නිසයි. හුස්ම වැටෙනකම්ම මේ සිද්ධිය සිද්ධ වෙනවා.

බුදුන් වහන්සේටත් සිතුවිලි පහළ වෙනවා. "සම්බෝධියට පෙර මහණෙනි මටත් මෙවැනි සිතක් පහළ විය. "වෘක්ෂ මූලයේ වැඩ සිටින විට මෙවැනි සිතක් පහළ විය." බුදුන් වහන්සේටත් සිතුවිලි පහළ වෙනවා. කිසිම කෙනෙකුට සිතුවිලි පහළ නොවුණ මොහොතක් නෑ. හැබැයි ඒ සිතේ හරයක් නැති වෙනවා. **අන්න ඒකයි ඡන්ද රාගය දුරු වෙනවා කිව්වෙ, මේ සත්‍ය දකින කෙනාට කණ්ණාඩියේ දෙයක් පෙනුණට, දෙයක් නැති බවට අවබෝධයි. අන්න ඒ වගේ ඇත්ත ලෝකෙත් අපි දෙයක් දැක්කට, එහෙම දෙයක් නැති බවට අවබෝධයි. අන්න නිවන් දකිනවා.** මේ දක්වා අපි අභිසංකරණයක් තුළ ආරෝපණයට කොටු වෙලා ඉන්නවා. ගිනි බෝලෙ කරකවන කොට ගිනි වළල්ලක් පේනවා. ඒ වළල්ල තමයි ආරෝපණය. වේගෙට මේක නැවත නැවත එනකොට බලගැන්විල දෙයක් වගේ දැනෙනවා. ඒ ආරෝපණය තමයි ආත්මය කියල දැනගත්ත මේ ආත්මීය දැනීම. ඒකමයි ආරෝපණය.

එහෙනම් මෙලොවත් තියෙන්නෙ මේ අරමුණෝමයි. අරමුණ ඇත්ත වුණොත් මෙලොව. ඒ කියන්නෙ, පොත, මේසෙ, ඉර, හඳ, ගහ කොළ මේ සේරම තියෙනවා කියන්නෙ මෙලොව. ඒ කියන්නෙ ලෝක සංඥා පොත මේසේ, බිත්තිය, අඹ ගහ, නා ගහ, ඉර, හඳ, ගහ කොළ සේරම තියෙනවා කියන්නෙ ඒක ලෝක සංඥා. ඒ කියන්නෙ මේ අරමුණේ දෙයක් කියල ගත්තොත් මෙලොව. හැබැයි දෙයක් නැති බව අවබෝධ වුණොත් එලොව. මෙලොවයි එලොවයි අතර පරතරය නෙළුම් පතත් දිය බිඳත් අතර ඇති පරතරය හා සමානයි කියල බුදුන් වහන්සේ දේශනා කළේ අන්න ඒ නිසයි. එහෙනම් මෙලොව කියන්නෙ මේ අරමුණ ඇත්ත වීමයි. එලොව කියන්නෙ මේ අරමුණෙන් මිදීමයි. එහෙනම් මේ අරමුණෝ කාම භූමිය, රූප භූමිය, අරූප භූමිය තුන් ලෝකෙම තියෙන්නෙ මේ අරමුණෝ. **පොත කියන එකේ වටිනාකම කාම භූමිය, ඒ පොත කියන සංඥාව රූප**

**භූමිය. ඒකෙ අරූපය, දෙයක් වගේ දැනෙන එක ඒක තමයි ආත්මය, අරූප භූමිය. තුන් භූමිය ජයගෙනයි "ත්‍රෛයිලෝකනාථ" වෙන්නෙ.** එහෙනම් මේ බුද්ධ ස්වභාවය මේ සිතුවිලි වලින් මිදුණු ස්වභාවයයි.

**උපාසිකාව:** ස්වාමීන් වහන්ස, එතකොට පොතක් කියන මේ අරමුණ අපි දැකගන්නෙ කොහොමද?

**ආර්යයන් වහන්සෑ:** ඔබතුමිය දැන් දැක්කනෙ අරමුණ පොත කියලා. දැන් ඔය අපි කතා කරේ අරමුණ දකින හැටි. මේ වීඩියෝ එක නැවත නැවත ඇසීම තුළ ඔබතුමියට ඒ අවබෝධය ඇතිවෙලා පටිසෝතය තුළ ඔබතුමිය බාහිර ඇත්ත වෙන් නැතිව මිදිලා, බාහිර දෙයක් නැති බව දකිනතැන සෝතාපන්න මාර්ගයට එනවා. ඒ කියන්නෙ සිත තුළ දෙයක් තියෙනවා. සිත තුළ දෙයක් තියෙනකම් දුකක් තියෙනවා. ඒ කියන්නෙ ඇලීම ගැටීම. ඒ කියන්නෙ රාග, ද්වේෂ, මෝහ බාහිර දෙයක් නැති බව දකින තැන පටිසෝතය. බාහිර ඇත්ත කරගත්ත තැන අනුසෝතය. බාහිර ඇත්ත කරගත්ත තැන මිථ්‍යා දෘෂ්ටික අවිද්‍යා භූමිය. එතන සම්මා දිට්ඨියක් නෑ. බාහිර දෙයක් නැති බව දකින තැන සම්මා දිට්ඨියට එනවා. අන්න එතැනින් පටිසෝතයට එනවා. බාහිර ඇත්ත නොවන තැන පටිසෝතය. සතා සිවුපාවා ඉන්නෙ බාහිර ඇත්ත කරගෙන. සෑම ආගමක්ම තියෙන්නෙ බාහිර ඇත්ත කරගෙන. **බාහිර සත්‍යයක් නොවන බව දකින තැන, සියල්ල සිතුවිලි බව දකින තැන, අනුසෝතයෙන් පටිසෝතයට එනවා. ඒ පටිසෝතය කියන්නෙ සෝතාපන්න කියන්නෙ මේ බාහිර නෙවෙයි සිතම බව දකිනවා. හැබැයි, ඒ සිතෙත් ඒ වුණාට දුක තියෙනවා. ඒ කියන්නෙ සකෘදාගාමි භූමිය. ඒ කියන්නෙ රාග, ද්වේෂ තුනී වෙන ස්වභාවය දැනෙන භූමිය. ඊට පස්සෙ අන්න අනාගාමි භූමිය. අනාගාමි කියන්නෙ සිතෙත් දෙයක් නැති බව දකිනවා. මෙතන ශබ්ද, වර්ණ විතරයි. සිතෙත් දෙයක් නෑ බාහිරෙත් දෙයක් නෑ කියල දෙපැත්තෙන්ම මිදෙනවා.** අන්න අනාගාමි භූමිය. සිතිනුත් මිදුණා. දැන් බාහිරිනුත් මිදිලා, සිතිනුත් මිදිලා. හිත පිහිටන්න තැනක් නෑ. "විඤ්ඤාණං අනිදස්සනං-අනන්තං සබ්බතෝ පභං" කියන තැනට එනවා. දැන් අරමුණු අනිදස්සන වෙනවා.

"විඤ්ඤාණං අනිදස්සනං - අනන්තං සබ්බතෝ පභං
එත්ථ අපෝච පඨවි ච - තේජෝ වායෝ න ගාධති
එත්ථ දීඝඤ්ච රසසඤ්ච - අණුං ථූලං සුභා සුභං
එත්ථ නාමඤ්ච රූපංච - අසේසං උපරුජ්ජතී
විඤ්ඤාතේ නිරෝධෙන - එත්ථෙ තං උපරුජ්ජති"

කියන අන්න එනවා මේ ධර්මය තුළ තියෙන වටිනාම තැනට "අප්‍රමාණ චේතෝ විමුක්තියට" එනවා. අනිමිත්තයි ශූන්‍යතයි. අප්‍රණීතයි. එතනයි නිවන් මග.

***උපාසිකාව:*** එහෙමයි ස්වාමීන් වහන්ස. සිහියෙන් ඉන්නවා කියන එක මට පොඩ්ඩක් පැහැදිලි කරල දුන්නොත්.

***ආර්යයන් වහන්ස:*** විඤ්ඤාණය කියන්නේ පොත කියන්නෙ සිතුවිලි. මේසෙ කියන්නෙ ශබ්ද වර්ණ. ශබ්ද වර්ණ කියන්නෙ සිතුවිලි. **සිහිය කියන්නෙ ඔබතුමියට දැන් මේ මොහොතෙ දෙයක් දකින කොට බිත්තිය දකින බවට සිහියකුත් තියෙනවා. ඔබතුමියට කේන්ති ගිහිල්ල නම් කේන්ති ගිය බවට සිහියකුත් තියෙනවා. ඔබතුමිය කලින් මොනව හරි දේකට ඇලිලා තිබුණ නම් මේ මොහොතේ ඒ දේට එතරම් ඇලෙන් නැත්නම් ඒකත් සිහියට අසුවෙනවා. කලින් ඇලිලා තිබ්බා. දැන් ඇලෙන්නෙ නෑ. එතකොට මේක සිහියට හසුවෙනවා. ඒක තමයි ආසවඛ්‍යා ඥානය.** නිවන් මගට උපනිශ්‍රය වෙන්නෙ ඔන්න ඔය ආසවඛ්‍යා ඥානය. පුබ්බේ නිවාසානුස්සති ඥානය. අපි අර කතා කළ හිත හැදෙන හැටි. චුතූපපාත ඥානය මේ සිත විතරයි කියලා දැකපු එක. ආසවඛ්‍යා ඥානය මේ එන එන සිත මිදි මිදී යනකොට රාග, ද්වේෂ, මෝහ කෙලෙස් ක්‍ෂය වන බව හසුවන ඥානය. අන්න නිවන් මග. ත්‍රිවිද්‍යා පහළ වුණා. ඔබතුමිය නිවන් දකිනවා. ඔබතුමියට තියෙන්නෙ දැන් මේ දේශනා කරපු ධර්මයම නැවත නැවත මෙනෙහි කරන්න. ධම්මට්ඨිති ඥානය වැඩෙන්න ඕනි. අපි දන්නවා සෝතාපත්ති අංගවල කියනවා කල්‍යාණ මිත්‍ර ඇසුර, සද්ධර්මශ්‍රවණය, ධම්මානු ධම්ම පටිපදාව, අන්න ඒ තුළ තමයි යෝනිසෝමනසිකාරය ඇති කරගෙන නිවන් මග උපනිශ්‍රය වෙන්නෙ. සියල්ලම නිවනින්ම සැනසීම ලබන්න මේ සියල්ල හේතු වෙනවා. තත්පර ගානයි විනාඩි ගානයි, මුළු අසූහාර දාහක ධර්මස්කන්ධයම අතැඹුලක් සේ විසිරුණා

නේද? මෙලොවත් මිදිලා, පරලොවත් මිදිලා දෙලොවම මිදිලා අන්තිමට අරහත්ත සමාධියෙන් එළියට එනවා නේද?

**උපාසිකාව:** එහෙමයි. ස්වාමීන් වහන්ස.

**ආර්යයන් වහන්ස:** යූටියුබ් එකට අවශ්‍ය දේශනා දාලා මනා කොට පැහැදිලි කරල තියෙනවා. කෙන කෙනාගෙ අත්දැකීම්. කෙන කෙනා මාර්ග ඵලවලට පත්වන ආකාරය, අපි කියන්නෙ කෙලෙස් ක්ෂය වන මග. නමුත් ඒ අයගෙ ප්‍රත්‍යක්ෂයන් එළි කරනවා. ඉතාම ගාම්භීර දහමක් වෙලා තියෙනවා. ඇත්තටම 2500 වසරක් ගිය තැන මේ ගෞතම බුද්ධ ශාසනයේ නැවත පිබිදීමයි බුද්ධෝත්පාද නාලිකාව තුළ සනිටුහන් වෙන්නෙ. ඒක අපිට දැනෙනවා. එහෙම නම් තෙරුවන් සරණයි.

**උපාසිකාව:** එහෙමයි ආර්යයන් වහන්ස. තෙරුවන් සරණයි.

බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය මුද්‍රණය කරන එම ධර්ම ග්‍රන්ථ සඳහා ඔබටත් දායක විය හැක.

බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය

ගිණුම් අංක : 106161005988

බැංකුව : සම්පත් බැංකුව / ශාඛාව : බත්තරමුල්ල

ගිණුම් අංක : 100800597511

බැංකුව : ජාතික ඉතිරි කිරීමේ බැංකුව
ශාඛාව : බත්තරමුල්ල

බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය මගින් මෙතෙක් මුද්‍රණය කර ඇති ග්‍රන්ථ පහත සඳහන් වේ.

1. සතිය කියන්නේ අපේ ගෙදර
2. මට මම නැතිවන හැටි
3. මොහොතට අවධිය (පළමු කොටස)
4. බුද්ධ දර්ශනය
5. නිවැරදි නිවන් මඟ හමුවිය
6. මොහොතට අවධිය (දෙවන කොටස)
7. අභිඥා ඥාණයට හසුවන පරම සත්‍යය - 1
8. අභිඥා ඥාණයට හසුවන පරම සත්‍යය - 2
9. අභිඥා ඥාණයට හසුවන පරම සත්‍යය - 3
10. The true dhamma has awakend, volume 1
12. මේ අසන මොහොතේම ඔබ නිවන් දකිනවා
13. ආර්ය කමටහන්
14. ලොවම දෙදරයි
15. සූත්‍ර දේශනා - 01
16. සූත්‍ර දේශනා - 02